"2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/28 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අළලා සකසා ඇත".

# ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිත කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය

අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය යටතේ
භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින්
නිකුත් කරන ලදි.

## පෙරවදන

සංවර්ධන ප්‍රමුඛතාවයන්, පෞද්ගලික ව්‍යවසායන්, කුඩා-ස්වයං රැකියා සහ පාරම්පරික වෘත්තීන්හි නියැලෙන්නන්ගේ ආර්ථික අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදාගැනීම සහ ඒවා ලබාගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/28 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගෙන, එකී භූ සම්පත් කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම සඳහා පැවති ක්‍රියාවලිය තුළ මහජනතාව, පෞද්ගලික ආයතන මෙන්ම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ද මුහුණ දුන් අසීරුතාවයන් මග හරවා පරිසරය සුරැකෙන පරිදි බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියක් හඳුන්වාදීමට 2021 ඔක්තෝබර් 05 දිනැති අංක 21/1766/301/022 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ලබා දුන් නියෝගය පරිදි මෙම කාර්ය සංග්‍රහය[1] නිකුත් කෙරේ. ඒ අනුව, කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි ගවේෂණය, කැණීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ වෙළඳාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම මෙහි සඳහන් ක්‍රමවේද අනුව සිදු කෙරේ.

2021 ඔක්තෝබර් 05 දින දක්වා, කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි යන අමුද්‍රව්‍ය පරිහරණය සම්බන්ධ පනත්, නීති රීති, රෙගුලාසි/නියෝග, අමාත්‍ය මණ්ඩල තීරණ සහ චක්‍රලේඛවල අන්තර්ගත කරුණු ඇතුළත්ව මෙම සංග්‍රහය සකසා ඇත. පරිශීලනයේ පහසුව සහ සංකීර්ණභාවය අවම කිරීම සඳහා, 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ අවශ්‍ය වන නියෝග සහ ආකෘතිපත්‍ර පමණක් මෙම සංග්‍රහයේ දක්වා ඇත. අර්ථ නිරූපණයේදී සැක ඇති වන තැන් හා ගැටලු ද මෙහි විධිවිධානයන්ගෙන් ආවරණය නොවන කරුණු ද පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කළ යුතුය.

**ජේ. ජේ. රත්නසිරි**
**සභාපති | භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය**
රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය, කොළඹ 07.

2021 නොවැම්බර් 30 දින.

[1] PUB.ADM/SEC/08(PTF)/D/GM¨

## ජනාධිපති කාර්ය සාධක බලකා සාමාජිකත්වය

**ජේ. ජේ. රත්නසිරි මහතා**
සභාපති | භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය
ලේකම් | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
**වෛද්‍ය අනිල් ජාසිංහ මහතා**
සාමාජික|ලේකම්, පරිසර අමාත්‍යාංශය
**ආර්. ඩබ්ලිව්. ආර්. ජේමසිරි මහතා**
සාමාජික|ලේකම්, මහාමාර්ග අමාත්‍යාංශය
**ආර්. ඒ. ඒ. කේ. රණවක මහතා**
සාමාජික|ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
**අනුර දිසානායක මහතා**
සාමාජික|ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය
**එස්. ඩී. ඒ. බී. බොරලැස්ස මහතා**
සාමාජික|ලේකම්, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
**මේජර් ජනරාල් (විශ්‍රාමික) ඩබ්ලිව්. පී. පී. ප්‍රනාන්දු මහතා**
සාමාජික|ලේකම්, වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
**ආර්. එම්. සී. එම්. හේරත් මහත්මිය**
සාමාජික|ලේකම්, මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
**ඒ. එස්. ඉලංගම්ගේ මහත්මිය**
සාමාජික|අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
**අනුර වල්පොල මහතා**
සාමාජික|සභාපති, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
**පී. බී. හේමන්ත ජයසිංහ මහතා**
සාමාජික|අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
**හර්ෂාන් ද සිල්වා මහතා**
සාමාජික|සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
**විජිත ගුණරත්න මහතා**
සාමාජික|නියෝජ්‍ය පොලිස්පති/පරිසර දිශාව
**මලර්මතී ගංගාදරන් මහත්මිය**
සාමාජික|අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
**කේ. ආර්. ගංගාධාර මහතා**
ලේකම් |ජනාධිපති කාර්ය සාධක බලකාය

## තාක්ෂණික සභය

**ඩබ්ලිව්. ඩී. එස්. සී. වැලිවත්ත මහතා**
අතිරේක ලේකම්, පරිසර අමාත්‍යාංශය
**චන්දන සූරියබණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
**ජී. ඩී. කීර්ති ගමගේ මහතා**
කොමසාරිස් ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
**ආචාර්ය කේ. එම්. ඒ. බණ්ඩාර මහතා**
වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
**ආර්. ඒ. එස්. රණවක මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
**ඒ. එච්. එම්. එල්. අබේරත්න මහතා**
කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
**ඊ. එම්. යූ. එස්. ඒකනායක මහතා**
ප්‍රධාන ගණකාධිකාරී, පරිසර අමාත්‍යාංශය
**ඩී. සජ්ජන ද සිල්වා මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
**ඩබ්. ආර්. පරණගම මහතා**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
**එම්. එල්. එස්. තරංගා මහත්මිය**
නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව
**කේ. ඒ. පී. එච්. ලියනආරච්චි මහත්මිය**
අධ්‍යක්ෂ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

**එම්.එම්.ජේ.පී. අජිත් ප්‍රේමා මහතා**
අධ්‍යක්ෂ, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
**අසන්ත ගුණසේකර මහතා**
කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
**ඩබ්ලිව්. පී. සී. ඒ. වීරසූරිය මහතා**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
**තනුක්ෂා අබේවර්ධන මෙය**
ජ්‍යෙෂ්ඨ උපදේශක, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
**ඩී. එච්. එස්. කුමාරසිරි මහතා**
අධ්‍යක්ෂ, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
**ආචාර්ය එච්. ඒ. ජී. ජයතිස්ස මහතා**
අධ්‍යක්ෂ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
**ජේ. එම්. අයි. එච්. ජයවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
**එස්. කේ. ලේනදූව මහතා**
අධ්‍යක්ෂ, වයඹ පළාත් පරිසර අධිකාරිය
**ඩබ්ලිව්. එච්. කේ. ඩී. රත්නායක මහතා**
අධ්‍යක්ෂ, මහාමාර්ග අමාත්‍යාංශය
**නිල්මිණි අත්තනායක මහත්මිය**
අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය
**ප්‍රදීප් එදිරිසිංහ මහතා**
අධ්‍යක්ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
**නිල්මිණී වික්‍රමාරච්චි මහත්මිය**
අධ්‍යක්ෂ (වැ.බ), පරිසර අමාත්‍යාංශය
**එන්. කේ. එල්. නෙත්තිකුමාර මහතා**
ව්‍යාපෘති අධ්‍යක්ෂ, මාර්ග සංවර්ධන අධිකාරිය
**එච්. ඩී. සිසිර හපුආරච්චි මහතා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
**වී. ටී. විජේතුංග මහතා**
නියෝජ්‍ය පාලක, ආරක්ෂක අමාත්‍යාංශය
**සරත් ගුණතිලක මහතා**
නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික ශිල්ප සභාව
**හිමාලි ද කොස්තා මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ, පරිසර අමාත්‍යාංශය
**වජිරා කුමාරසිංහ මහත්මිය**
සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය
**එච්. කේ. එම්. ගුණසේකර මහතා**
ප්‍රධාන කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
**චමින්දි කුඩාහෙට්ටි මෙය**
ජ්‍යෙෂ්ඨ ජල භූ විද්‍යාඥ, ජල සම්පත් මණ්ඩලය
**පංචාලි ප්‍රනාන්දු මහත්මිය**
නීති නිලධාරි, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
**වාසනා ප්‍රේමචන්ද්‍ර මහත්මිය**
පර්යේෂණ නිලධාරි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
**එස්. විග්නේෂ්වරන් මහත්මිය**
වාරිමාර්ග ඉංජිනේරු, වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## පටුන

විශේෂ අර්ථ නිරූපණ……………………………………………………………………………………..vi
විශේෂ විධිවිධාන…………………………………………………………………………………........ .vii
කාර්ය සංග්‍රහයට කරණු ලබන සංශෝධන……………………………………………………………..vii

**01. පළමුවන පරිච්ඡේදය:**
**කැණීම් ස්ථාන සහ අවකාශය හඳුනා ගැනීම සඳහා ඒකීය ආයතනික ව්‍යුහය 1**
1.1 කැණීම් ස්ථාන හා අවකාශය හඳුනා ගැනීම ........ 1
1.2 “P1P2P3” ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය ........ 2
1.3 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ කාර්යාංශයේ කාර්යභාරය ........ 2
1.4 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ........ 3
1.5 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල කාර්යභාරය ........ 4

**02. දෙවන පරිච්ඡේදය:**
**බලපත්‍ර වර්ග හා බලපත්‍ර නිකුත් කිරීමේ නීතිමය ක්‍රියාවලිය 5**
2.1 බලපත්‍ර නිකුත් කිරීම ........ 5
2.2 බලපත්‍ර වර්ග ........ 5
2.2.1 ගවේෂණ බලපත්‍ර ........ 5
2.2.2 කැණීම් බලපත්‍ර ........ 6
2.2.3 වෙළඳ බලපත්‍ර ........ 6
2.2.4 ගබඩා බලපත්‍ර ........ 7
2.2.5 ප්‍රවාහන බලපත්‍ර ........ 7
2.2.6 අපනයන බලපත්‍ර ........ 7
2.3 බලපත්‍ර වල වලංගු කාලය ........ 8
2.4 බලපත්‍ර ඉල්ලුම්කරුවකු සතු විය යුතු සුදුසුකම් ........ 8
2.5 කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ........ 8
2.5.1 කැණීම් බලපත්‍ර සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන ........ 8
2.5.2 කැණීම් අයදුම්පත්‍ර භාර ගැනීමෙන් පසු කටයුතු ........ 9
2.5.3 කාර්යාංශයේ නිල බලපත්‍ර ඒකකයේ කාර්යභාරය ........ 9
2.5.4 කැණීම් අයදුම්පත්‍ර වර්ගීකරණය සහ නිෂ්කාශන කැඳවීම ........ 10
2.5.5 අයදුම්පත්‍ර හෝ බලපත්‍ර අවලංගු කිරීම සහ ඊට එරෙහි අභියාචනා ........ 11
2.5.6 බලපත්‍ර නිකුත් කිරීමේ බලතල සීමා කිරීම ........ 12
2.6 රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය ........ 12
2.7 විශේෂ වැලි කැණීම් කලාප/ වැලි මධ්‍යස්ථාන ........ 13

**03. තෙවන පරිච්ඡේදය:**
**රජයේ ඉඩම් හිමිකාරීත්වය/ කළමනාකාරීත්වය දරන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන සහ පෞද්ගලික දේපළ හිමිකරුවන් විසින් එම ඉඩම් පරිහරණය සඳහා එකඟතාවය නිකුත් කිරීම 14**
3.1 රජයේ ඉඩම් ........ 14
3.2 පෞද්ගලික ඉඩම් ........ 15

**04. සිව්වන පරිච්ඡේදය:**
**මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය, පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සහ සෙසු නිෂ්කාශන (ලේඛනගත ස්ථාන) 16**
4.1 පාරිසරික නිර්දේශය ........ 16
4.2 මූලික පාරිසරික පරීක්ෂණ /පාරිසරික බලපෑම් ඇගයීම ........ 16
4.3 පුරාවිද්‍යා නිර්දේශය/ පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් අධ්‍යයනය. ........ …..18
4.4 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සිදු කරන නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා ........ 19
4.5 ජල සම්පත් මණ්ඩලය සිදු කරන භූගත ජල සම්පත් සංවේදීතාවය ........ 19
4. 6 නාගරික සංවර්ධන කලාප තුළ සිදු කරන නාගරික සැලසුම් නිරාකරණ ........ 19

**05. පස්වන පරිච්ඡේදය:**
**සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්, කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් බලපත්‍ර/අවසරපත්‍ර නිකුත් කිරීම (ලේඛනගත නොවූ) 20**
5.1 මැටි සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම ........ 20
5.2 පස් හෝ බොරළු සඳහා ග්‍රාම නිලධාරි විසින් කුඩා පරිමාණ අවසරපත්‍ර නිකුත් කිරීම ........ 20
5.3 පස් හෝ බොරළු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම ........ 21
5.4 කළුගල් සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම ........ 22
5.5 වැලි සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම ........ 22

5.6 රජයේ විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම්/බලයලත් නිලධාරීන් විසින් පස් හෝ
බොරළු සඳහා බලපත්‍ර නිකුත් කිරීම ........................................................................ 22
5.7 ලේඛනගත නොවූ අවස්ථා සම්බන්ධ පොදු උපදෙස් ............................................................ 23
5.7.1 ලේඛනගත නොවූ අවස්ථා සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ කාර්යභාරය ...................................... 24
**06. සයවන පරිච්ඡේදය :**
**බලපත්‍ර/නිෂ්කාශන ගාස්තු අය කිරීම, ආපසු ගෙවීම සහ ගිණුම් ගත කිරීම පිළිබඳ ඒකීය ක්‍රමවේදය 25**
6.1 ඒකීය ගාස්තු ක්‍රමය සහ නිෂ්කාශන ගාස්තු ........................................................................ 25
6.1.1 පළාත් පාලන ආයතන විසින් අය කරන බදු සහ බලපත්‍ර ගාස්තු ............................................. 25
6.1.2 රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන රාජ්‍ය ආයතන විසින් අය කරන ගාස්තු .................. 26
6.1.3 ඒකීය ගාස්තු ක්‍රමයට අයත් නොවන ගාස්තු ........................................................................ 26
6.1.4 පුනරුත්ථාපන හෝ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා ආරක්ෂිත තැන්පතු ........................................ 27
6.1.5 බලපත්‍ර ගාස්තු/ රාජ්‍ය භාගය ............................................................................................ 27
6.2 ආපසු ගෙවීම සහ ගිණුම් ගත කිරීම .................................................................................... 28
**07. සත්වන පරිච්ඡේදය:**
**පාරිසරික ගැටලු, මහජන විරෝධතා කළමනාකරණය, අධීක්ෂණය සහ ක්‍රියාමාර්ග 29**
7.1 පාරිසරික ගැටලු අවම කිරීම හා නිරාකරණය කිරීම ................................................................ 29
7.2 මහා පරිමාණ රජයේ සංවර්ධන ව්‍යාපෘති සහ භූ සම්පත් භාවිතය ............................................. 29
7.3 මහජන විරෝධතා කළමනාකරණය කිරීම ............................................................................. 30
7.4 භූ සම්පත් කැණීම් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව ............................................................. 30
7. 5 කෙටි කාලීන ක්‍රියාමාර්ග ................................................................................................. 31

## ඇමුණුම්: වගු, උපලේඛන, ආකෘතිපත්‍ර සහ නියෝග


වගුව 01 : ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන අනුව ලබා දිය යුතු අවම තොරතුරු 33
වගුව 02 : රාජ්‍ය භාගය-වටිනාකම්වලින් ප්‍රතිශතයන් 35
උපලේඛනය 01 : ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන 36
උපලේඛනය 02 : ඛනිජ වර්ග 37
උපලේඛනය 03 : වැලි මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශය 38
උපලේඛනය 04 : ගාස්තු වර්ග, ප්‍රමාණ සහ ආරක්ෂිත තැන්පතු 39
උපලේඛනය 05 : හරිත වැලි තොටුපළ ක්‍රියාවලිය 43
ආකෘතිපත්‍ර 1-(අ) : පස්, වැලි, බොරළු හා මැටි කැණීම් බලපත්‍ර අයදුම්පත්රය 46
ආකෘතිපත්‍ර 1-(ආ) : කළුගල් කැණීම් බලපත්‍ර අයදුම්පත්‍රය 49
ආකෘතිපත්‍ර 2 : රජය සතු ඉඩම් පරිහරණය කිරීමේ එකඟතාවය 52
ආකෘතිපත්‍ර I : පස්/බොරළු කියුබ් 35/මැටි කියුබ් 3 ක් ප්‍රවාහනය සඳහා ඉල්ලුම් පත්‍රය 53
ආකෘතිපත්‍ර II : පස්/බොරළු/මැටි/වැලි ප්‍රවාහන අවසර පත්‍රය 54
ආකෘතිපත්‍ර III : පස්/බොරළු/වැලි කැණීම හා ප්‍රවාහනය සඳහා අයදුම්පත්‍රය 55
ආකෘතිපත්‍ර IV : කැණීමක් නොවන ඛනිජ ඉවත් කිරීම/ප්‍රවාහනය සඳහා අයදුම්පත්‍රය 56
නියෝග : පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ වන නියෝග 57

# භූවිශේෂ අර්ථ නිරූපණ

මෙම සංග්‍රහය යටතේ විස්තර කෙරෙන "භූ සම්පත්/ඛනිජ" යනු ඉදිකිරීම් සහ කර්මාන්ත සඳහා යොදා ගන්නා "කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි" යන ස්වභාවික සම්පත් වේ.

"ලේඛනගත" යනු වාණිජමය වශයෙන් කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම් කිරීම සඳහා පූර්වයෙන් හඳුනාගත් හෝ වාණිජ පරමාර්ථයක් උදෙසා නැවත නැවත භාවිතයට ගන්නා පෞද්ගලික හෝ රජය සතු ඉඩම්වල සිදු වන නිශ්චිත භූ සම්පත් පරිහරණ අවස්ථා වේ. ඊට උපයෝගී කරගන්නා කලාප හෝ ස්ථාන "ලේඛනගත කලාප/ස්ථාන" වේ. "ශිල්පීය" හෝ "කාර්මික" යන කාණ්ඩ යටතේ ඉල්ලුම් කරන කැණීම් කලාප හෝ ස්ථාන ලේඛනගත ස්ථාන වලට අයත් වේ.

"ලේඛනගත නොවූ" යනු වාණිජ නොවන, කුඩා හා පාරම්පරික සහ වෙනත් විශේෂ කාර්යයන් උදෙසා සිදු වන භූ සම්පත් පරිහරණ අවස්ථා වේ. ඊට උපයෝගී කරගන්නා කලාප/ස්ථාන "ලේඛනගත නොවූ" කලාප/ස්ථාන" වේ. ලේඛනගත නොවූ කලාප/ස්ථානවල සිදුවන කාර්යයන් හෝ එවැනි අවස්ථා යනු,

(i) එදිනෙදා ජන ජීවිතය පවත්වා ගැනීමේදී මූල්‍යමය නොවන, මහජන ක්‍රියාවක් හේතුවෙන් හෝ ඒ සඳහා හෝ ස්වභාවික ක්‍රියාවක් හේතුවෙන් හෝ ජනනය වන හෝ භූ සම්පත් ඉවත් කෙරෙන අවස්ථා,
(ii) ආපදා තත්ත්ව හේතුවෙන් විනාශ වූ නිවාස/දේපළ නැවත යථාවත් කිරීමට අවශ්‍ය කටයුතු,
(iii) නායයෑමක් විය හැකි-හදිසි ආපදාවකට ලක් විය හැකි-ජීවිතවලට හෝ දේපළවලට තර්ජනයක් විය හැකි අවස්ථා,
(iv) පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා බැඳුණු (වාණිජමය එකඟතා මත නොවන) කාර්යයන්,
(v) රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන (සීමාසහිත) ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කටයුතු,
(vi) වාණිජ නොවන/ඍජු කොන්ත්‍රාත් පදනමින් සිදු වන රජයේ ව්‍යාපෘති,
(vii) වාණිජ පරමාර්ථයකින් තොරව කාබනික පොහොර නිෂ්පාදනය හා වගා මාධ්‍ය ලෙස රොන්මඩ හා පස් යොදා ගැනීම, කුඩා ආර්ථික ජීවනෝපාය, ස්වයං රැකියා, පාරම්පරික වෘත්තීන්, කුඩා කෘෂි ජීවනෝපාය ක්‍රියාවන් හා බැඳුණු භූ සම්පත් පරිහරණ අවස්ථා වේ.

"ස්ථානය" යන්නෙන් කලාපය ද අදහස් වේ.

"නිෂ්කාශන" යනු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් කැණීම් බලපත්‍රයට අදාළව පෙර හා පසුව නිකුත් කරනු ලබන ඉඩම් පරිහරණ එකඟතා, නිර්දේශ, අවසර, ඇගයීම්, වාර්තා, අනුමැතීන් හා බලපත්‍ර වේ.

"ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන" යනු 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ නිෂ්කාශන සඳහා සම්බන්ධ වන උපලේඛනය 01 මගින් හඳුන්වාදී ඇති ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වේ.

"දිනය" යන්නෙන් රාජකාරි දිනය ද "මාසය" යන්නෙන් ලිත් මාසයක් ද අදහස් වේ.

"ව්‍යාපෘතිය" යන්නෙන් ඛනිජ කැණීම් ක්‍රියාවක් ද අදහස් වේ.

"නියෝග" යනු 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කරන ලද නියෝග හෝ රෙගුලාසි වේ.

"පරිසර අධිකාරිය" යන්නෙන් මධ්‍යම පරිසර අධිකාරිය ද, අදාළ වන පරිදි වයඹ පළාත් පරිසර අධිකාරිය ද අදහස් වේ.

"පරිසර නිලධාරි" යන්නෙන් පරිසර විෂය භාර අමාත්‍යාංශය යටතේ සේවය කරනු ලබන නිලධාරියෙකු අදහස් වේ.

## විශේෂ විධිවිධාන

I. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති මෙම කාර්ය සංග්‍රහය “ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාවිත කරන ඛනිජ කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහය" ලෙස හැඳින්වෙන අතර මෙය එම අනුමත දිනයේ සිට ක්‍රියාත්මක වේ.

II. පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති “භූ සම්පත් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුවේ” එකඟතාවකින් තොරව කිසිදු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් හෝ ව්‍යවස්ථාපිත කමිටුවක්/සංවිධානයක්/සමිතියක් මෙම සංග්‍රහයේ විෂය පථයට බලපාන කරුණු සම්බන්ධයෙන් ස්වායත්තව තීරණ නොගත යුතුය. සංශෝධන නොකළ යුතුය.

i. මුදල් විෂය භාර අමාත්‍යවරයා හා පරිසර විෂය භාර අමාත්‍යවරයා දැනුවත් කර, කරනු ලබන මගපෙන්වීම් හා උපදෙස් මත භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව මෙහි සඳහන් ගාස්තුවලට පරිබාහිර ගාස්තුවක් අය නොකළ යුතුය-ගාස්තු සංශෝධනය නොකළ යුතුය.

ii. භාණ්ඩාගාර ලේකම් සහ “භූ සම්පත් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව” නොවිමසා ගනු ලබන තීරණ බල රහිත වේ. එසේම එකී ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන නොවිමසා පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම් සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ද මෙම කාර්ය සංග්‍රහයේ සඳහන් විධිවිධාන වෙනස් නොකරනු ඇත.

III. මෙම කාර්ය සංග්‍රහය මගින් හඳුන්වා දී ඇති ක්‍රමවේදය ස්ථාපනය කිරීමට හැකිවන පරිදි භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මීට ප්‍රථම නිකුත් කර ඇති චක්‍රලේඛ, නීතිරීති, සහ 1993 අංක 01 දරන පතල් කැණීම් (බලපත්‍ර දීමේ) නියෝගය (සංශෝධිත) ද ඇතුළු රෙගුලාසි/නියෝග සංශෝධනය කිරීමට ද බලතල බෙදා හැරීමට ද 2022.01.31 දිනට ප්‍රථම සිදු කළ යුතුය. අනෙකුත් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ද අදාළ වන පරිදි තම ආයතනවල නීතිරීති, රෙගුලාසි/නියෝග, චක්‍රලේඛ සහ වෙනත් නෛතික උපදෙස් සංශෝධනය කිරීම එදිනට ප්‍රථම සිදු කළ යුතුය.

IV. භූ සම්පත් කැණීම, ප්‍රවාහනය සහ වෙළඳ කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය නිෂ්කාශන නිකුත් කිරීම සඳහා “ඒකීය ආයතනික ව්‍යුහය” ක්‍රියාත්මක විය යුතුය. එම ආයතනික ව්‍යුහය, පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ අධීක්ෂණය යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතුය.

V. කැණීම් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ දී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන නිෂ්කාශන සඳහා අවශ්‍ය වන ගාස්තු, අයදුම්කරුවන් වෙතින් අය කිරීම සඳහා “ඒකීය ගාස්තු ක්‍රමය” ක්‍රියාත්මක විය යුතුය. එම ක්‍රමයේ කේන්ද්‍රීය නියාමන ආයතනය ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ක්‍රියා කළ යුතුය. ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය භාණ්ඩාගාරයේ මගපෙන්වීම යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, පරිසර විෂය භාර අමාත්‍යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතුය.

VI. “ඒකීය ආයතනික ක්‍රමයට සහ ඒකීය ගාස්තු ක්‍රමයට” අනුගත වන පරිදි අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ස්වකීය අභ්‍යන්තර වැඩපිළිවෙළ සකසා ගත යුතුය. මෙම "ඒකීය ක්‍රමවේද" ක්‍රියාත්මක වන්නේ "ලේඛනගත" ස්ථාන සඳහා පමණි.

VII. රජයේ සංවර්ධන ව්‍යාපෘති තුළින් මහජනතාවට ඍජු සහ මහත් ප්‍රතිලාභ ලැබෙන බැවින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල සහ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන මඟින් රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉල්ලුම් කෙරෙන කැණීම් සහ ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින්, අදාළ බලපත්‍ර/නිෂ්කාශන ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දී අවම කාලයකදී නිකුත් කිරීමට වග බලා ගත යුතුය.

VIII. භූ සම්පත් කැණීම, ප්‍රවාහනය හා වෙළඳාම පිළිබඳ කාර්ය සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන උපදෙස් පත්‍රිකා නිකුත් කිරීම, ආකෘතිපත්‍ර හඳුන්වා දීම සහ ආයතනවලට අවශ්‍ය පුහුණුව ලබා දීම පරිසර විෂය භාර අමාත්‍යාංශයේ මග පෙන්වීම මත, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් සිදු කළ යුතුය.

### කාර්ය සංග්‍රහයට කරනු ලබන සංශෝධන

IX. මෙම කාර්ය සංග්‍රහයට කරනු ලබන සියලුම සංශෝධන, භූ සම්පත් පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය ක්‍රියාත්මකව පවතින කාලය තුළ දී එම කාර්ය සාධක බලකාය විසින් ද ඉන් අනතුරුව “භූ සම්පත් පිළිබඳව ජාතික අධීක්ෂණ කමිටුව” විසින් අනුමත කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව පමණක් පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් ද සිදුකළ යුතුය.

# 01. පළමුවන පරිච්ඡේදය:

## කැණීම් ස්ථාන සහ අවකාශය හඳුනා ගැනීම සඳහා ඒකීය ආයතනික ව්‍යුහය

### 1.1 කැණීම් ස්ථාන හා අවකාශය හඳුනා ගැනීම

*කැණීම් ස්ථාන හා අවකාශය හඳුනාගැනීම, සහ යාවත්කාලීන කිරීමේ මූලික අරමුණ*

ශ්‍රී ලංකාවේ ස්ථානගතව ඇති කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි නිධි (මින්මතු “භූ සම්පත්” ලෙස හැඳින්වෙන) හඳුනා ගැනීමත්, ඒවා 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත (මින්මතු “පනත” ලෙස හැඳින්වෙන) හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව, කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය තුළ පනතේ 30 හා 31 වගන්තිවලට අනුකූලව ඉඩම් පරිහරණ එකඟතා, නිර්දේශ, අවසර, ඇගයීම්, වාර්තා, අනුමැතීන්, බලපත්‍ර (මින්මතු “නිෂ්කාශන ” ලෙස හැඳින්වෙන) ලබා ගැනීම සඳහා ගතවන කාලය අවම කිරීමත් මූලික අරමුණ වේ.

අවම නිෂ්කාශන ප්‍රමාණයක් ලබා ගැනීමේ සිට නිෂ්කාශන කිහිපයක් ලබා ගත යුතු ආයතන ප්‍රමාණය පදනම් කර, භූගෝල විද්‍යා තොරතුරු පද්ධති-ක්‍රමවේද භාවිත කරමින් සිතියම්ගත කිරීම හා ඒ අනුව, සංවර්ධන කටයුතු සඳහා අත්‍යවශ්‍ය භූ සම්පත් පිහිටි, කැණීම් ස්ථාන හෝ කලාප, නිකුත් කළ යුතු නිෂ්කාශන ප්‍රමාණය අනුව ප්‍රමුඛතා ගත කිරීමටත් ඒ හා සම්බන්ධ අදාළ ආයතනික ව්‍යුහය මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලැබේ.

*ලේඛන ගත වූ / ලේඛන ගත නොවූ කැණීම්*

1. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (මින්මතු “කාර්යාංශය” ලෙස හැඳින්වෙන) විසින් රජයේ සහ පෞද්ගලික හිමිකම ඇති දේපළවල පිහිටි කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණිය හැකි ස්ථාන හෝ කලාප “ලේඛනගත“ හා “ලේඛනගත නොවූ” යනුවෙන් කාණ්ඩ දෙකක් ලෙස හඳුනා ගත යුතුය.

*ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ඉඩම් හඳුනා ගැනීම*

2. කාර්යාංශයේ අනුදැනුම මත ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින්, පනත හා 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ 13 සිට 21 දක්වා වූ වගන්ති සඳහා සම්බන්ධ වන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන පදනම් කර, සහ එම ආයතනවල එකඟතාවය මත “ලේඛනගත ස්ථාන/කලාප", ප්‍රමුඛතා 1, ප්‍රමුඛතා 2 හා ප්‍රමුඛතා 3 ලෙස වර්ගීකරණය කර ලේඛනගත කළ යුතුය.

**ප්‍රමුඛතා 1 (හෙවත් P1) ස්ථාන:**

*ප්‍රමුඛතා 1*

3. නිෂ්කාශන අනවශ්‍ය හෝ අවම ප්‍රමාණයක් (මෙම ප්‍රමාණය වර්ගීකරණ ලේඛනයෙහි දක්වා ඇත) කැඳවීමට සිදු වන කැණීම් ස්ථාන, ප්‍රමුඛතා 1 (P1) වර්ගයට ඇතුළත් කළ යුතුය.

**ප්‍රමුඛතා P1-A වර්ගය:**

කැණීමට අපේක්ෂිත ස්ථානයේ සිට කිලෝමීටර 01 ක සීමාව තුළ මානව වාසස්ථාන හෝ කිසිදු නිර්මිතයක් නොමැති හා පනතේ 30 වන වගන්තිය අනුව නිෂ්කාශන ලබා ගත යුතු ගණයට අයත් නොවන හෝ එම නිෂ්කාශන නිකුත් කිරීමකින් තොරව හෝ පූර්ව අනුමැතීන් ලබා දී ඇති ස්ථාන P1-A වර්ගයට ඇතුළත් කළ යුතුය.

**ප්‍රමුඛතා P1-B වර්ගය:**

කැණීමට අපේක්ෂිත ස්ථානය සඳහා ලබා ගත යුතු නිෂ්කාශන අවම ප්‍රමාණයක් (මෙම ප්‍රමාණය වර්ගීකරණ ලේඛනයෙහි දක්වා ඇත) කැඳවීමට සිදු වන ස්ථාන/කලාප P1- B වර්ගයට ඇතුළත් කළ යුතුය;

(i) කැණීමට අපේක්ෂිත ස්ථානයේ සිට කිලෝමීටර 01 ක සීමාව තුළ මිනිස් වාසස්ථාන නොමැති එහෙත් හඳුනා ගත් නිර්මිත සහිත ප්‍රදේශයක කළුගල් කැණීම සඳහා බහු-බෝර වලවල් පිපිරවීම් සිදු කරන්නේ නම් එම කැණීම් ස්ථානයේ සිට කිලෝමීටර 01ක කලාපය තුළ ඇති නිර්මිතවලට හානි සිදු විය හැකි බැවින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ මූලික පාරිසරික අධ්‍යයනයක් සිදු කළ යුතු ද යන්න මධ්‍යම පරිසර අධිකාරිය විසින් තීරණය කළ යුතුය. මෙවැනි කලාප P1-B වර්ගයට ඇතුළත් කළ යුතුය.

**ප්‍රමුඛතා 2 (හෙවත් P2) ස්ථාන:**

ප්‍රමුඛතා 2

4. කාර්යාංශය විසින් නිෂ්කාශන කිහිපයක් (මෙම ප්‍රමාණය වර්ගීකරණ ලේඛනයෙහි දක්වා ඇත) කැඳවීමට සිදු වන කැණීම් ස්ථාන, ප්‍රමුඛතා 2 (P2) වර්ගයට ඇතුළත් කළ යුතුය.

**ප්‍රමුඛතා 3 (හෙවත් P3) ස්ථාන:**

ප්‍රමුඛතා 3

5. කාර්යාංශය විසින් නිෂ්කාශන රාශියක් (මෙම ප්‍රමාණය වර්ගීකරණ ලේඛනයෙහි දක්වා ඇත) කැඳවීමට සිදු වන කැණීම් ස්ථාන ප්‍රමුඛතා 3 (P3) වර්ගයට ඇතුළත් කළ යුතුය.

### 1.2 "P1P2P3" ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය

ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය

6. ලේඛනගත ස්ථාන සියල්ල පදනම්ව ඒ ඒ ස්ථානවලට අවශ්‍ය P1, P2, P3 ප්‍රමුඛතාව දක්වන, "P1P2P3 ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනයක්" තිබිය යුතුය. මෙම වර්ගීකරණ ලේඛන පවත්වාගෙන යෑමෙහි අරමුණ නූ සම්පත් කැණීම් කිරීමක් සඳහා යම් අයදුම්කරුවෙකු විසින් ඉල්ලීමක් කරනු ලබන ස්ථානයකට අදාළව, ඒ ඒ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පූර්වයෙන් හඳුනාගත් නිෂ්කාශන සහිතව එම ස්ථාන පිළිබඳ දත්ත පවත්වාගෙන යාම බැවින්, කුමන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයකින් නිෂ්කාශන කැඳවිය යුතු දැයි යන්න නිශ්චය කර ගැනීම සඳහා කාර්යාංශය විසින් "P1P2P3 ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය" භාවිත කළ යුතුය.

### 1.3 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ කාර්යාංශයේ කාර්යභාරය

ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ කාර්යාංශයේ කාර්යභාරය

7. ලේඛනගත ස්ථාන සඳහා "P1P2P3 වර්ගීකරණ ලේඛනය" පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව කාර්යාංශය විසින් වාර්ෂිකව සිදු කළ යුතුය.
8. ලේඛනගත නොවූ යම් පුනරාවර්තනය වන කැණීම් ස්ථාන වේ නම්, පුනරාවර්තනය වූ වහාම එම ස්ථාන ද "ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය"ට ඇතුළත් කරගැනීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය විස්තර ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවලින් ලබා ගැනීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.
9. වාණිජමය වශයෙන් කැණීම් කිරීම සඳහා ඉදිරියේ දී අයදුම්පත් ඉදිරිපත් කරන නව ස්ථාන ද, ලේඛනගත ස්ථාන යටතට ඇතුළත් වේ. එම නව කැණීම් ස්ථාන හඳුනා ගන්නා අවස්ථාවල දී "P1P2P3 වර්ගීකරණ ලේඛනය" සංශෝධනයට ලක් කිරීමට කාර්යාංශය විසින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුය. වගන්තීන් 70 සහ 71 යටතේ දැක්වෙන, රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා කෙරෙන ඛනිජ කැණීම් සහ විශේෂ වැලි කැණීම් කලාප/වැලි මධ්‍යස්ථානවලට අදාළ කාර්යයන් ද "ලේඛනගත " ස්ථාන යටතට ගත යුතුය.
10. ශ්‍රී ලංකාවේ කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි යන අමුද්‍රව්‍ය කැණීම් කළ හැකි බවට හඳුනාගෙන ඇති හෝ ඉදිරියේදී හඳුනාගන්නා සියලුම ලේඛනගත ස්ථාන මෙම "ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය" ට ඇතුළත් විය යුතුය;
    - (i) අන්තර්කාලීන විධිවිධානයක් ලෙස, "ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය" ප්‍රථම වරට යාවත්කාලීන කිරීම සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවට සහය වීම සඳහා කාර්යාංශය විසින් අදාළ ව්‍යවස්ථාපිත ආයතනවල සහභාගීත්වයෙන් "කඩිනම් වැඩසටහනක්" දියත් කළ යුතුය.
    - (ii) දිවයිනේ සියලු පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ තොරතුරු යාවත්කාලීන වී නොමැති බැවින් නව කැණීම් ස්ථානයන් සම්බන්ධයෙන් පමණක් එම ස්ථානය කුමන ප්‍රමුඛතා වර්ගීකරණ කාණ්ඩයට අයත් වුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය.
11. කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යයේ දී වර්ෂයට අදාළ ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය භාවිත කළ යුතු අතර, එම ලේඛනය අවශ්‍ය වන යම් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් වේ නම් එම ආයතනය/ආයතන වෙත ලබා දීමට කටයුතු කළ යුතුය.
12. කැණීම් ස්ථාන පිළිබඳ යාවත්කාලීන තොරතුරු සහිත ලේඛනය සෑම වර්ෂයකම ඔක්තෝබර් මස 01 දින, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම්

දෙපාර්තමේන්තුව සහ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත ලබා දීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

13. ලේඛනය යාවත්කාලීන කිරීමේ දී කාර්යාංශය* විසින් එකතු කරනු ලබන තාක්ෂණික තොරතුරුවලට අමතරව, පහත තොරතුරු ද ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය;
   (i) සෑම කැණීම් ස්ථාන/කලාපයකම පිහිටීම දැක්වෙන නිවැරදි භූමිතික ඛණ්ඩාංක,
   (ii) කැණීම් ස්ථාන පිහිටි ඉඩමේ අයිතිය හෝ භුක්තිය (රජය සතු, රාජ්‍ය ආයතන/ව්‍යවස්ථා මණ්ඩල සතු, පුද්ගලික, ආගමික ස්ථාන සතු අයිතිය හඳුනානොගත්, වෙනත් ලෙස අයිතිය/භුක්තිය සඳහන් කළ යුතුය),
   (iii) කැණීම් ස්ථාන අයත්වන දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම්/ග්‍රාම නිලධාරී කොට්ඨාසය පිළිබඳ තොරතුරු,
   (iv) ඛනිජ වර්ගය, ධාරිතාවය පිළිබඳ තොරතුරු,
   (v) අදාළ කැණීම් ස්ථානයේ සිට කිලෝමීටර 01 ක කවයක් තුළ නිවාස හෝ වෙනත් නිර්මිත පිහිටා ඇත්ද යන වග,
   (vi) දැනට කැණීම් කරනු ලබන ස්ථානයක් ද නැතිනම් නව ස්ථානයක් ද යන වග,
   (vii) නව කැණීම් ස්ථානයන් සම්බන්ධයෙන්, අදාළ කැණීම් ස්ථානයේ සිට මීටර 360 (හෙවත් යාර 400) ක කවයක් තුළ පුරාවිද්‍යාත්මක ස්ථානයන් පිහිටා ඇත්ද යන වග,
   (viii) පිපිරුම් පරීක්ෂණ, භූ ගත ජල සම්පත් සංවේදීතාවය, නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා, නාගරික සැලසුම් නිරාකරණ වාර්තා, පුරාවිද්‍යා නිර්දේශය, මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයන සහ පාරිසරික බලපෑම්, ඇගයීම් සහ වෙනත් නිෂ්කාශනවල අවශ්‍යතාවය හෝ එම නිෂ්කාශන නිකුත් කිරීමකින් තොරව හෝ පූර්ව අනුමැතීන් ලබා දී ඇති නැති බව.

   *කාර්යාංශය සඳහා අවශ්‍ය වෙනත් තාක්ෂණික තොරතුරු ඒ ආකාරයෙන්ම ලබා ගැනීම හා යාවත්කාලීන කිරීම කළ යුතුය. මෙම තොරතුරු අතුරින් ප්‍රමුඛතා වර්ගීකරණය සඳහා අවශ්‍ය කුමන තොරතුරු ද යන්න ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විමසා එම තොරතුරු ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීම කාර්යාංශය විසින් කළ යුතුය.

14. කාර්යාංශය විසින්, යාවත්කාලීන කරන ලද "P1P2P3 වර්ගීකරණ ලේඛනය" අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවලට ලබා දී නියමිත වර්ෂයේ ජනවාරි මස 01 වෙනි දිනට ප්‍රථම ඒ සඳහා එකඟතාවය ලබා ගත යුතුය. මේ සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහය ලබා ගත යුතුය.

15. කැණීමක් සඳහා ඉල්ලුම් කරන ස්ථානය, පවත්නා "ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය" හි නොමැතිනම් කාර්යාංශය විසින් වහාම ඒ බව දන්වා එය යාවත්කාලීන කිරීමට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහය ලබා ගත යුතුය.

### 1.4 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

16. කාර්යාංශය විසින් වාර්ෂිකව යාවත්කාලීන කරනු ලබන කැණීම් ස්ථාන ලේඛනය පදනම් කර එම ස්ථාන ප්‍රමුඛතාව මත වර්ගීකරණය සිදු කිරීම, සහ "P1P2P3 වර්ගීකරණ ලේඛනය" සෑම වර්ෂයකම ජනවාරි මස 01 දින වන විට කාර්යාංශය වෙත ලබා දීම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් කළ යුතුය.

17. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ ගැනෙන රක්ෂිත ප්‍රදේශ, භූ ගත ජල සම්පත් සංවේදීතාව, නාය යාමේ අවදානම් ප්‍රදේශ, නාගරික සැලසුම් නිරාකරණ ප්‍රදේශ, පාරිසරික ආරක්ෂණ/සංවේදී ප්‍රදේශ, අලි කළමනාකරණ ප්‍රදේශ හෝ අලි මංකඩ, පුරාවිද්‍යාත්මක ස්ථාන, වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති ජාතික රක්ෂිත මායිමේ සිට සැතපුමක් (කිලෝමීටර 1.6) ඇතුළත පිහිටි ප්‍රේරක කලාප, වන ආඥා පනත යටතේ ප්‍රකාශයට පත් කර

ඇති ප්‍රදේශ, ජාතික උරුම වනභූමි පනත යටතේ ප්‍රකාශිත ප්‍රදේශ සහ අභයභූමිවල මායිමේ සිට මීටර් 100 ක ප්‍රේරක කලාප පිළිබඳ ව යාවත්කාලීන තොරතුරු සහ වගුව 01 ("ඇමුණුම්" පරිච්ඡේදය බලන්න) මගින් දැක්වෙන පනත යටතේ නිෂ්කාශන ලබා ගත යුතු බව දක්වා ඇති වෙනත් නිෂ්කාශනවල අවශ්‍යතාවය හෝ එම නිෂ්කාශන නිකුත් කිරීමකින් තොරව හෝ පූර්ව අනුමැතීන් ලබා දී ඇති/නැති බව, අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙතින් වාර්ෂිකව ලබා ගෙන ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය සැකසිය යුතුය;

(i) කැණීම් ස්ථානවලට අවශ්‍ය කරන අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන නිශ්චිතව සොයා බලා අනවශ්‍ය නිෂ්කාශන අවම කරමින් එම ස්ථාන පූර්ව අනුමැතිය සහිත ස්ථාන ලෙස ප්‍රමුඛතා ගත කළ යුතුය.

18. ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙතින් ද ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ද අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කාර්යාංශයේ ද එකඟත්වය ඇතිව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.

19. යාවත්කාලීන කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය ප්‍රකාශයට පත් කිරීමට පෙර අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල එකඟතාවය ලබා ගැනීම සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් කාර්යාංශයට සහය විය යුතුය. යම් ස්ථානයක් හෝ ස්ථාන පිළිබඳව ගැටලුවක් ඇත්නම් ඒ පිළිබඳව එම ආයතන විසින් නැවත සමීක්ෂණයක් සිදු කර එය විසඳීම සඳහා පියවර ගත යුතුය.

## 1.5 ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල කාර්යභාරය

ප්‍රමුඛතා වර්ගීකරණය යටතේ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල කාර්යභාරය

20. ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් අදාළ කැණීම් ස්ථාන පිළිබඳ කාර්යාංශයේ තොරතුරු සහ විවිධ මූලාශ්‍ර උපයෝගී කර ලබා ගන්නා තොරතුරු ද පදනම් කර ක්ෂේත්‍ර අධ්‍යයනයන් මගින් සත්‍යාපනය කර ස්වකීය මතය, එනම් පූර්ව අනුමැතිය ලබා දිය හැකි ද නොහැකි ද යන්න දක්වා, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත "භූගෝල විද්‍යා තොරතුරු පද්ධති ස්ථර" මෘදු පිටපතක් ලෙස (එම දත්ත භූගෝල විද්‍යා හැඩතල ගොනුවක් -As a GIS shape file- ලෙස ලබා දිය යුතු වේ) සෑම වර්ෂයකම නොවැම්බර් මස 01 දිනට ප්‍රථම ලබා දිය යුතුය.

21. වගන්ති 13 පරිදි, කාර්යාංශය විසින් සපයනු ලබන තාක්ෂණික තොරතුරු ද පහත තොරතුරු ද ඇතුළත් වන පරිදි, අවම වශයෙන් වගුව 01 ("ඇමුණුම්" පරිච්ඡේදය බලන්න) හි තොරතුරු, කාර්යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය;

(i) කැණීම් ස්ථාන පිහිටි ඉඩමේ අයිතිය හෝ භුක්තිය රජය සතු නම් කැණීමට නිදහස් කිරීමේ ඉඩම් පරිහරණ එකඟතාව; කොන්දේසි ඇත්නම් ඒ මොනවාද යන්න,

(ii) පිපිරුම් පරීක්ෂණ, පරිසර නිර්දේශය, භූ ගත ජල සම්පත් සංවේදීතාවය, නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා, නාගරික සැලසුම් නිරාකරණ වාර්තා, පුරාවිද්‍යා නිර්දේශය, මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයන සහ පාරිසරික බලපෑම් ඇගයීම් සහ වෙනත් නිෂ්කාශනවල අවශ්‍යතාවය, හෝ එම නිෂ්කාශන නිකුත් කිරීමකින් තොරව හෝ පූර්ව අනුමැතීන් ලබා දිය හැකි නොහැකි බව; කොන්දේසි ඇත්නම් ඒ මොනවාද යන්න.

22. සෑම වර්ෂයකම තොරතුරු යාවත්කාලීන නොවන්නේ නම් ඒ පිළිබඳව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පියවර ගත යුතුය.

ව්‍යස්ථාපිත රාජ්‍ය ආයතන හඳුනා ගැනීම

23. නිෂ්කාශන නිකුත් කිරීම සඳහා වගකීම් දරන අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන උපලේඛන 01 (කරුණාකර "ඇමුණුම්" පරිච්ඡේදය බලන්න) මගින් දැක්වේ.

## 02.දෙවන පරිච්ඡේදය:

## බලපත්‍ර වර්ග හා බලපත්‍ර නිකුත් කිරීමේ නීතිමය ක්‍රියාවලිය

### 2.1 බලපත්‍ර නිකුත් කිරීම

ඛනිජ ගවේෂණය, කැණීම, ප්‍රවාහනය, වෙළඳාම, ගබඩා කිරීම හා අපනයනය සඳහා පනත යටතේ බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

*බලපත්‍ර නිකුත් කිරීමේ නීතිමය තත්ත්වය*

24. මැණික් හා ඛනිජ තෙල් හැර සෙසු සියලුම ඛනිජ සඳහා ගවේෂණය, කැණීම, ප්‍රවාහනය, වෙළඳාම, ගබඩා කිරීම හා අපනයනය සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය (පනතේ 27 වගන්තිය). කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන ඛනිජ වර්ග උපලේඛන 02 (“ඇමුණුම්” පරිච්ඡේදය බලන්න) හි දක්වා ඇත.

25. බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග ක්‍රියාත්මක කිරීමේ පරිපාලන භාරකරු වශයෙන් කාර්යාංශය ක්‍රියා කරනු ලබයි [පනතේ 28(1) හා 43 වගන්ති].

*බලපත්‍ර අධිකාරිය*

26. “ලේඛනගත ස්ථාන” සඳහා බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශය විසින් සිදු කරන අතර “ලේඛනගත නොවූ ස්ථාන” (පරිච්ඡේදය 05 හි දැක්වෙන) වල කැණීම, ප්‍රවාහනය සහ වෙළඳාම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරීන් සහ බලයලත් නිලධාරීන් වෙත කාර්යාංශය විසින් බලය පවරා ඇත (පනතේ 28 වන වගන්තිය).

### 2.2 බලපත්‍ර වර්ග

27. කාර්යාංශය විසින් නිකුත් කරන බලපත්‍ර පහත පරිදි වේ.
    - (i) ගවේෂණ බලපත්‍ර
    - (ii) කැණීම් බලපත්‍ර
    - (iii) වෙළඳ බලපත්‍ර
    - (iv) ගබඩා බලපත්‍ර
    - (v) ප්‍රවාහන බලපත්‍ර
    - (vi) අපනයන බලපත්‍ර

#### 2.2.1 ගවේෂණ බලපත්‍ර

*ගවේෂණය හැඳින්වීම*

28. ඛනිජ ගවේෂණය යනු යම් කිසි භූමියක එහි මතුපිට හෝ අභ්‍යන්තරයේ ඇති ඛනිජ ද්‍රව්‍ය ප්‍රමාණාත්මකව හඳුනාගැනීමයි. ඒ සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය ගවේෂණ බලපත්‍රය නමින් හැඳින්වේ. ඛනිජ ගවේෂණ සඳහා බලපත්‍රයක් ලබා දීම කාර්යාංශය විසින් පහත පරිදි සිදු කළ යුතුය;
    - (i) ඛනිජ ගවේෂණ සඳහා අයදුම් කිරීම පිණිස කාර්යාලයීය නිල බලපත්‍ර ප්‍රධාන ඒකකයේ 1:50,000 කෘෂිකාර්මික සිතියම් පෙළ භාවිත කරනු ලබන අතර, ඒ අනුව සෑම සිතියමක්ම වර්ග කිලෝමීටර කොටුවලට කොටස් කර ඒ ඒ කොටුවට අදාළ අක්ෂාංශ හා දේශාංශ පිහිටීම අනුව ගවේෂණ ප්‍රදේශ හඳුනා ගනු ලැබේ.

*ගවේෂණය සඳහා ඉඩදෙන සීමාව*

    - (ii) අවමයෙන් වර්ග කිලෝමීටර 01ක් සහ උපරිම වර්ග කිලෝමීටර 100 ක බිම් ප්‍රමාණයක් ඛනිජ ගවේෂණය සඳහා ඉඩ දෙනු ලැබේ (පනතේ 48 වගන්තිය හා නියෝග 04).
    - (iii) ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් හඳුන්වන ඛනිජ වර්ග සඳහා ඛනිජ කැණීමට ප්‍රථම ගවේෂණ බලපත්‍රක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.

*ගවේෂණ බලපත්‍ර අවශ්‍ය නොවන අවස්ථා*

    - (iv) කාර්මික ඛනිජ වශයෙන් හඳුන්වා දී ඇති ඛනිජ වර්ග අතරින් තිරිවානා, සිප්පි කටු, ෆෙල්ස්පාර්, ඩොලමයිට්, කැල්සයිට්, තලාතු මිනිරන් (මයිකා), හුණුගල්, කෙයොලින්, බෝල් මැටි හා සිලිකා වැලි යන ඛනිජ වර්ග සඳහා ගවේෂණ බලපත්‍රයකින් තොරව කාර්මික කැණීම් “ඇ” හා “ඈ” කාණ්ඩ යටතේ පමණක් කැණීම සඳහා බලපත්‍ර නිකුත් කළ හැක.

*කාර්මික ඛනිජ ගවේෂණ*

    - (v) කාර්මික කැණීම් වශයෙන් හඳුන්වනු ලබන ඉහත (iv) සඳහන් ඛනිජ මෙන්ම සෙසු සියලුම කාර්මික ඛනිජ, වටිනා ලෝහ, පදනම් ලෝහ හා වෙනත් ඛනිජ කාණ්ඩවලට අදාළ ඛනිජ සඳහා කැණීම් බලපත්‍රයක් ලබා ගැනීමට ප්‍රථම ගවේෂණ බලපත්‍රයක් ලබා ගත යුතුය.

*ගවේෂණ බලපත්‍රය ඉල්ලුම් කරන ආකාරය*

    - (vi) නියෝග 4 යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය දක්වා ඇති අතර, ගවේෂණ බලපත්‍ර සඳහා අයදුම් කිරීමේදී එහි සඳහන් ආකෘතිපත්‍ර 2.1 හා ආකෘතිපත්‍ර 2.3 භාවිත කරමින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

### 2.2.2 කැණීම් බලපත්‍ර

කැණීම් බලපත්‍ර හැඳින්වීම

29. කැණීම යනු ඛනිජ ද්‍රව්‍ය කිසිවක් ඇගයීමේ හා ලබා ගැනීමේ කාර්යය සඳහා මතුපිට හෝ පෘෂ්ඨය තුළ හෝ කරනු ලබන කැණීමක් වේ. ඒ සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය, කැණීම් බලපත්‍රය වේ. ඛනිජ කැණීම සඳහා භාවිත කරන ක්‍රමවේද හා යන්ත්‍ර පදනම් කරගෙන කැණීම් බලපත්‍ර නැවත කාණ්ඩ 03 කට වර්ග කෙරේ.

ශිල්පීය කැණීම්

(i) **ශිල්පීය කැණීම් බලපත්‍ර**
ඛනිජ ද්‍රව්‍ය ලබා ගැනීමේ කාර්යය සඳහා සවල්, ගල් කටු, ඉස්කෝප්ප, නාරාසන, කඹ, බාල්දි වැනි අතින් ක්‍රියා කරන උපකරණ මඟින් මිනිස් ශ්‍රමය භාවිත කරමින් සිදු කරන කැණීම් ශිල්පීය කැණීම් ලෙස හැඳින්වේ (නියෝග 03). නිෂ්පාදන පරිමාව ඇතුළු තවත් කරුණු කිහිපයක් පදනම් කර ශිල්පීය කැණීම් බලපත්‍ර නැවත කාණ්ඩ 02 කට වර්ග කෙරේ.

ශිල්පීය කැණීම් වර්ග

<u>ශිල්පීය කැණීම් “අ” වර්ගය (ඒ එම් එල් “ඒ ”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 210 ට නොවැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර 10 නොවැඩි.

<u>ශිල්පීය කැණීම් “ආ” වර්ගය (ඒ එම් එල් “ බී”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 35 ට නොවැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර 10 නොවැඩි.

කාර්මික කැණීම්

(ii) **කාර්මික කැණීම් බලපත්‍ර**
කාර්මික කැණීම් යනු යාන්ත්‍රිකව ක්‍රියා කරන යන්ත්‍ර-සූත්‍ර භාවිත කරමින් සිදු කරනු ලබන කැණීම් වේ. භාවිත කරනු ලබන යන්ත්‍ර සහ මාසික නිෂ්පාදන පරිමාව ඇතුළු තවත් කරුණු කිහිපයක් පදනම් කර කාර්මික කැණීම් බලපත්‍ර නැවත කාණ්ඩ 04 කට වර්ග කෙරේ (නියෝග 05).

කාර්මික කැණීම් වර්ග

<u>කාර්මික කැණීම් “අ” වර්ගය (අයි එම් එල් “ ඒ ”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 2,000 ට වැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර 10 ට වැඩි,

<u>කාර්මික කැණීම් “ආ” වර්ගය (අයි එම් එල් “ බී ”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 2,000 ට නොවැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර් 10 ට නොවැඩි,

<u>කාර්මික කැණීම් “ඇ” වර්ගය ( අයි එම් එල් “ සී ”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 1,000 ට නොවැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර් 02 ට නොවැඩි,

<u>කාර්මික කැණීම් “ඈ” වර්ගය (අයි එම් එල් “ ඩී ”)</u>
නිෂ්පාදන පරිමාව මසකට කියුබ් 500 ට නොවැඩි සහ කණිනු ලබන ප්‍රදේශය හෙක්ටයාර් 02 ට නොවැඩි.

ආරක්ෂිත ඛනිජ කැණීම්

(iii) **ආරක්ෂිත ඛනිජ කැණීම් බලපත්‍ර**
ආරක්ෂිත ඛනිජ කැණීම් යනු විකිරණශීලී මූලද්‍රව්‍ය අන්තර්ගත ඛනිජ හා මිනිරන් කැණීම් වේ. ආරක්ෂිත ඛනිජ කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට පෙර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. බලපත්‍ර ලබා ගැනීම සඳහා ආකෘතිපත්‍ර 5 සම්පූර්ණ කර අදාළ ලේඛන සමඟ කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය [නියෝග 7 (2)].

කැණීම් බලපත්‍ර පිළිබඳ වැඩි විස්තර 2.5 හි "කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය" යටතේ විස්තරාත්මක ව දැක්වේ.

### 2.2.3 වෙළඳ බලපත්‍ර

වෙළඳ බලපත්‍ර හැඳින්වීම

30. ඛනිජ වෙළඳාම යනු කැණීමකින් තොරව හෝ වලංගු කැණීම් බලපත්‍රයක් යටතේ කණිනු ලබන ඛනිජ මිල දී ගැනීම, එම ඛනිජ පිරිසැකසුම් කිරීම, ගබඩා කිරීම හා අලෙවි කිරීම, අවශ්‍ය අවස්ථා වල දී ප්‍රවාහනය සහ අපනයනය කිරීම වේ. ඒ සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර, වෙළඳ බලපත්‍ර වේ. සිදු කරනු ලබන කාර්යය මත, බලපත්‍ර නැවත කාණ්ඩ 03 කට වර්ග කෙරේ. ඒවා නම්,

(i) **වෙළඳ බලපත්‍ර "අ" කාණ්ඩය** - අපනයනය සඳහා ඛනිජ ද්‍රව්‍ය වෙළඳාම් කිරීම,

(ii) **වෙළඳ බලපත්‍ර "ආ" කාණ්ඩය** - දේශීය වශයෙන් ඛනිජ පිරිසැකසුම් කිරීම, ගබඩා කිරීම, වෙළඳාම් කිරීම,

(iii) **වෙළඳ බලපත්‍ර "ඇ" කාණ්ඩය** - මිනිස් ශ්‍රමයෙන් සකසන ලද ගඩොල් හා හුණු වෙළඳාම.

වෙළඳ බලපත්‍ර සඳහා ආකෘතිය 4.1 මගින් ඉල්ලුම් කළ යුතුය [නියෝග 6.1 (අ)].

### 2.2.4 ගබඩා බලපත්‍ර

31. ගබඩා බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග සකස් කර නොමැති බැවින් මෙම බලපත්‍ර නිකුත් නොකෙරේ.

### 2.2.5 ප්‍රවාහන බලපත්‍ර

ප්‍රවාහන බලපත්‍ර හැඳින්වීම

32. ඛනිජ ප්‍රවාහනය යනු, ගවේෂණය, කැණීම් හා වෙළඳ බලපත්‍රලාභියෙකු විසින් ම ඛනිජ ද්‍රව්‍ය සහිත දෙයක් හෝ ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම වේ. ඒ සඳහා නිකුත් කරන බලපත්‍රය, ප්‍රවාහන බලපත්‍රය වේ. ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමේ දී කැණීම් හා වෙළඳ බලපත්‍රයෙහි සඳහන් ඛනිජ ද්‍රව්‍ය හා එහි අනුමත කියුබ් ප්‍රමාණයට පමණක් සීමා කෙරේ. ඛනිජ ප්‍රවාහනය සඳහා, බලපත්‍ර නැවත කාණ්ඩ 4 කට වර්ග කෙරේ. ඒවා නම්,

ප්‍රවාහන බලපත්‍ර වර්ග

(i) ගංගා / මුහුදු හා ගොඩවැලි ප්‍රවාහන බලපත්‍රය,

(ii) වැලි හැර සෙසු ඛනිජ ප්‍රවාහන බලපත්‍රය,

(iii) ගොඩනැගිලි ද්‍රව්‍ය වෙළඳසැල් සඳහා බලපත්‍රය,

(iv) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්/ග්‍රාම නිලධාරීන්/ බලයලත් නිලධාරීන් විසින් නිකුත් කරන ප්‍රවාහන බලපත්‍රය/අවසර පත්‍රය.

ප්‍රවාහන බලපත්‍ර අයදුම් කරන ආකාරය

33. ඉහත වගන්ති 32 (i)-(iii) ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා, අයදුම්කරුවකු විසින් ආකෘතිපත්‍ර 7 සම්පූර්ණ කර ගවේෂණ, කැණීම් හෝ වෙළඳ බලපත්‍රයේ පිටපතක් සමඟ කාර්යාංශයේ දිස්ත්‍රික්/ප්‍රාදේශීය කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය;

(i) වගන්ති 32 (iv) බලපත්‍ර නිකුත් කිරීම සඳහා ආකෘතිපත්‍ර I හෝ III සම්පූර්ණ කර දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/ග්‍රාම නිලධාරී/බලයලත් නිලධාරීන් වෙත අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කළ යුතුය. නිකුත් කළ යුතු බලපත්‍ර/අවසර පත්‍ර ආකෘතිපත්‍ර II වශයෙන් සඳහන් කර ඇත (වැඩි විස්තර පරිච්ඡේද 5 හි දක්වා ඇත).

### 2.2.6 අපනයන බලපත්‍ර

අපනයන බලපත්‍ර හැඳින්වීම

34. අපනයනය යනු කාර්මික කැණීම් "අ" හා "ආ" කාණ්ඩයේ කැණීම් බලපත්‍රලාභීන් හා වෙළඳ බලපත්‍ර "අ" කාණ්ඩයේ බලපත්‍රලාභීන් විසින් ඛනිජ අපනයනය කිරීම වේ. ඒ සඳහා නිකුත් කරන බලපත්‍රය, අපනයන බලපත්‍රය වේ.

අපනයන සඳහා අවසර දෙන ඛනිජ වර්ග

35. අපනයනය කිරීම සඳහා අවසර දෙනු ලබන්නේ පහත සඳහන් ඛනිජ වර්ග සඳහා පමණි [(නියෝග 33 (ආ)].

(i) මිනිරන්

(ii) තලාතු මිනිරන් (මයිකා)

(iii) ග්‍රැනයිට්

(iv) තිරිවානා

(v) ඉල්මනයිට්

(vi) රූටයිල්

(vii) සර්කෝන්

අගය එකතු කරන ලද ඛනිජ අපනයනය දිරිමත් කිරීම

36. අගය එකතු කරන ලද ඛනිජ අපනයනය දිරිමත් කිරීම සඳහා කාර්යාංශය විසින් අපනයනකරුවන් ඛනිජ ආයෝජන ගිවිසුම්වලට යොමු කෙරේ (නියෝග 10).

37. ග්‍රැනයිට් හා තිරිවානා යන ඛනිජ, වටිනාකම් එකතු කර අපනයනය කිරීමට බලපත්‍ර නිකුත් කරනු ලබන අතර, තිරිවානා ඛනිජය පවුඩර් වශයෙන් 150 $\mu m$ ට අඩු හා කැබලි 0-10 mm ප්‍රමාණයේ තිරිවානා ලෙස පමණක් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කෙරේ.

### 2.3 බලපත්‍ර වල වලංගු කාලය

බලපත්‍ර වලංගු කාලය

38. කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රවල වලංගු කාලය පහත වගුව පරිදි වේ.

| | | |
|---|---|---|
| 01 | **ගවේෂණ බලපත්‍ර** | ගවේෂණ බලපත්‍ර වලංගු කාලය වසර 2 කි. ඉදිරිපත් කර ඇති වාර්තා අනුව වසර 10 ක් දක්වා වලංගුතාව කාර්යාංශයට තීරණය කළ හැක. |
| 02 | **කැණීම් බලපත්‍ර** | |
| | i. කාර්මික කැණීම් "අ " කාණ්ඩය | වසර 03කි. පවත්නා සංචිත එහි වාණිජ නිෂ්පාදන සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලේඛන සැලකිල්ලට ගෙන බලපත්‍රයේ වලංගු කාලය කාර්යාංශය විසින් තීරණය කළ යුතුය. |
| | ii. කාර්මික කැණීම් "ආ" කාණ්ඩය | වසර 03 කි. |
| | iii. කාර්මික කැණීම් "ඇ" කාණ්ඩය | වසර 03 කි. |
| | iv. කාර්මික කැණීම් "ඈ" කාණ්ඩය | වසර 03 කි. |
| | i. ශිල්පීය කැණීම් "අ" කාණ්ඩය | වසර 03 කි. |
| | ii. ශිල්පීය කැණීම් "ආ" කාණ්ඩය | වසර 03 කි. |
| 03 | **වෙළඳ බලපත්‍ර** | වසර 01 කි. |
| 04 | **ප්‍රවාහන බලපත්‍ර** | මාස 01 කි. |
| 05 | **අපනයන බලපත්‍ර** | මාස 01 කි. |

බලපත්‍රයක් සඳහා නිෂ්කාශනවල වලංගු කාලය

39. කැණීම් බලපත්‍රයට අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන සියලු නිෂ්කාශනවල වලංගු කාල සීමාවේ කාලය ආරම්භ විය යුත්තේ කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයේ ආරම්භක දිනයේ සිටය.

40. ඛනිජ ගවේෂණ/ප්‍රවාහන/වෙළඳ සහ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හැර, කැණීම් බලපත්‍රය සහ ඊට අදාළ සියලුම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන නිෂ්කාශන ද වර්ෂ 03 ක් සඳහා වලංගු වන පරිදි නිකුත් කළ යුතුය. එහෙත්, යම් සේවාලාභියෙකු ඉල්ලීමක් කරන්නේ නම් එම නිෂ්කාශන එක් වසරක් සඳහා ද නිකුත් කළ හැක.

### 2.4 බලපත්‍ර ඉල්ලුම්කරුවකු සතු විය යුතු සුදුසුකම්

ඛනිජ සඳහා බලපත්‍ර ඉල්ලුම් කිරීමට අයදුම්කරුවෙකු සතු විය යුතු සුදුසුකම්

41. ඛනිජ ගවේෂණය, කැණීම, වෙළඳාම, ගබඩා කිරීම, ප්‍රවාහනය හා අපනයනය සඳහා බලපත්‍ර ඉල්ලුම් කිරීමට අපේක්ෂිත අයදුම්කරුවෙකු පහත සඳහන් සුදුසුකම්වලින් සමන්විත විය යුතුය (පනතේ 29 වන වගන්තිය);
   - (i) වයස අවුරුදු 18 ට වඩා වැඩි වීම,
   - (ii) රජයේ නිලධාරියෙකු හෝ යම් පළාත් සභාවක නැතහොත් පළාත් පාලන ආයතනයක සේවා නියුක්ත වූවෙකු නොවීම,
   - (iii) බලපත්‍රය ඉල්ලුම්කර ඇත්තේ යම් කැණීම් කටයුත්තක් වෙනුවෙන් ද කාර්යාංශයේ මතය අනුව ඒ කටයුතු කරගෙන යාමට අවශ්‍ය මූල්‍යමය හා කාර්මික සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවෙකු වීම,
   - (iv) ශ්‍රී ලංකාවේ බලාත්මක වන යම් නීතියක් යටතේ සිහිවිකල් බවට සනාථ නොවන තැනැත්තෙකු වීම,
   - (v) සමාගමක් වශයෙන් අයදුම් කරන්නේ නම් එම සමාගම ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු කිරීමට ලියාපදිංචි වී ඇති සමාගමක් වීම,
   - (vi) අයදුම්කරු පාර්ලිමේන්තුවට, පළාත් සභාවට හෝ ප්‍රාදේශීය සභාවට තේරීපත් වූ නියෝජිතයෙකු නොවීම.

### 2.5 කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය

#### 2.5.1 කැණීම් බලපත්‍ර සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන

කැණීම් බලපත්‍ර අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන

42. සුදුසුකම් ලත් අයදුම්කරුවකු විසින් කැණීම් බලපත්‍රය ලබා ගැනීම සඳහා පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය.
   - (i) කළුගල් කැණීම් බලපත්‍ර ඉල්ලුම් කිරීම සඳහා ආකෘතිපත්‍ර 1 (ආ) ද පස්, බොරළු හා වැලි කැණීම් සඳහා ආකෘතිපත්‍ර 1 (අ),

(ii) කැණීම සිදු කරනු ලබන ඉඩමේ ඔප්පු පිටපත හා ඉඩමට ප්‍රවේශ වන මාර්ග විස්තරය,
(iii) කැණීම සිදු කරනු ලබන ඉඩම සළකුණු කරන ලද පිඹුරු පිටපත,
(iv) අයදුම්කරු, කැණීමට අපේක්ෂිත ඉඩමේ හිමිකරු නොවන විට,
(අ) බදු ගිවිසුම හෝ වෙනත් නීත්‍යානුකූල ලියවිල්ලක් හෝ,
(ආ)ඉඩම් හිමිකම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් භාරයේ ඇති අවස්ථාවකදී ආකෘතිපත්‍ර 2 අනුව නිකුත් කරන ලද නිෂ්කාශනය,
(v) පුද්ගලයෙකු වශයෙන් අයදුම්කරන්නේ නම් ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්,
(vi) සමාගමක් වශයෙන් අයදුම්කරනු ලබන්නේ නම් සමාගම ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (රජයේ ආයතනවලට අදාළ නොවේ),
(vii) කාර්මික කැණීම් "අ" හා "ආ" බලපත්‍ර සඳහා කැණීම් සැලැස්ම හා ප්‍රතිසංස්කරණ සැලැස්ම ඇතුළත් ආර්ථික ජීව්‍යතා වාර්තාව.

ඉහත සඳහන් ලේඛනවල මුල් පිටපත සමඟ ඉදිරිපත් කළ යුතු අතර, මුල් පිටපත නොමැති අවස්ථාවලදී නීතිඥයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතුය.
(අ) කාර්මික හා ශිල්පීය කැණීම සඳහා අවස්ථානුකූලව පුනරුත්ථාපන බැඳුම්කරයක් කාර්යාංශය විසින් ඉල්ලා සිටිය හැක (රජයේ ආයතනවලට අදාළ නොවේ).

කැණීම් බලපත්‍ර අයදුම්පත භාර ගැනීම

43. කාර්යාංශය හෝ එහි බලයලත් ආයතන විසින් ඉහත 42 හි සඳහන් ලේඛන සමඟ අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර භාර ගනු ලැබේ. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා "ඒකීය ගාස්තු ක්‍රමය" අනුව අයදුම්පත්‍ර භාර ගැනීමේදී නිෂ්කාශන ලබා ගත යුතු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත ගෙවිය යුතු ගාස්තු හා කාර්යාංශය විසින් අය කර ගත යුතු ගාස්තු ඒකාබද්ධ කර අය කර ගත යුතුය (ගාස්තු පිළිබඳ වැඩි විස්තර සඳහා පරිච්ඡේද 06 බලන්න).
44. ගාස්තු අය කිරීමෙන් පසු එම ගෙවීම්වලට අදාළ රිසිට්පත් නිකුත් කිරීම හා අයදුම්පත්‍රය භාර ගත් බවට ලිපියක් කාර්යාංශය විසින් අයදුම්කරු වෙත නිකුත් කරනු ඇත. ඉන් පසුව කාර්යාංශයේ නිල බලපත්‍ර ඒකකයේ ලියාපදිංචි කළ යුතුය.

**2.5.2 කැණීම් අයදුම්පත්‍ර භාර ගැනීමෙන් පසු කටයුතු**

අයදුම්පත්‍ර භාර ගැනීමෙන් පසු කටයුතු

45. කාර්යාංශය විසින් අයදුම්පත්‍රයක් භාර ගැනීමෙන් පසු අයදුම්පත්‍රය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.
(i) අයදුම්පත් භාර ගැනීමේ කටයුතු, ඛනිජ හිමිකම් පිළිබඳ ලේඛකාධිකාරීවරුන් විසින් සිදු කළ යුතු අතර භූගෝල තොරතුරු දත්ත පදනම් කරගෙන ප්‍රමුඛතා වර්ගීකරණ තොරතුරු අධ්‍යයනය කිරීම,
(ii) සම්පූර්ණ කරන ලද පොදු ආකෘතිපත්‍රයේ ඇතුළත් කොට ඇති තොරතුරු පදනම් කරගෙන ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනයට අනුව P1-A, P1-B, P2, P3 යන කලාපයකට ඇතුළත් වන්නේ ද යන්න හඳුනා ගැනීම,
(iii) කාර්යාංශයේ ලේඛකාධිකාරීවරු විසින් P1-A, P1-B, P2, P3 තොරතුරු, පොදු ආකෘතිපත්‍රයේ කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා වෙන් කොට ඇති කොටසට ඇතුළත් කිරීම,
(iv) සියලු ලිපිලේඛන හා ගාස්තු සමඟ ලබා ගත් අයදුම්පත්, එදිනම, නිෂ්කාශන ලබා ගැනීම සඳහා ඉලෙක්ට්‍රොනික ක්‍රම ඔස්සේ අදාළ ලිපිලේඛන ද සමඟ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම.

**2.5.3 කාර්යාංශයේ නිල බලපත්‍ර ඒකකයේ කාර්යභාරය**

කාර්යාංශයේ නිල බලපත්‍ර ඒකකයේ කාර්යභාරය

46. කාර්යාංශයේ නිල බලපත්‍ර ඒකකය විසින් පුමුඛ ස්ථාන හා බලපත්‍ර නිකුත් කිරීමේදී අදාළ තොරතුරු ඇතුළත් භූගෝල විද්‍යාත්මක දත්ත පද්ධතිය හා P1P2P3 වර්ගීකරණ ලේඛනය පවත්වාගෙන යා යුතුය (පනතේ 30 වන වගන්තිය).
47. සියලු අයදුම්පත් සම්බන්ධයෙන්, අයදුම්පත්‍රය ලැබූ දිනය, ස්ථානීය විස්තර, අයදුම්කරුගේ නම, ලිපිනය, බලපත්‍ර වර්ගය, කියුබ් ප්‍රමාණය, නිෂ්කාශන ඉල්ලූ දින/ලැබුණු දින, බලපත්‍ර/තීරණය නිකුත් කළ දිනය සහ ගෙවූ ගාස්තු

පිළිබඳ තොරතුරු ඇතුළත් ''බලපත්‍ර විස්තර ලේඛනය'' (කාර්යාංශය විසින්) පවත්වා ගත යුතුය.

48. සෑම කාර්තුවක් ම අවසානයේ එළඹෙන ඊළඟ මස 10 දිනට පෙර, මෙම බලපත්‍ර විස්තර ලේඛනය පරිසර විෂය භාර අමාත්‍යාංශයට දැන්විය යුතුය. තවද, එම ලේඛනයේ උද්ධෘතයක් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ද යොමු කළ යුතුය.

49. රාජ්‍ය භාගය අය කිරීම හා සියලුම බලපත්‍රලාභීන් කාර්යාංශය විසින් මේ වන විටත් අය කරනු ලබන සෑම කැණීම් බලපත්‍රයකම සඳහන් කොන්දේසීන්ට අනුකූලව ඛනිජවල අයිතිය වෙනුවෙන් අය කළ යුතු රාජ්‍ය භාග ගාස්තු කාර්යාංශය වෙත අය කර ගත යුතුය;
    (i) කුමන හෝ ඉල්ලුම්කාර පාර්ශවයක් වෙනුවෙන් අවසර/නිර්දේශ/ඇගයීම් හෝ එවැනි ලියවිලි කැඳවීමේදී ඉල්ලුම්පත්‍රය නිකුත් කරන අවස්ථාවේදී ම ඒ සඳහා අවශ්‍ය කැමැත්ත/එකඟතාවය එම පාර්ශවයෙන් ලබා ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය ගාස්තු ගෙවීමට එකඟතාවය ලබා ගැනීමටත්, අවශ්‍ය නම් අත්තිකාරමක් ලබා ගැනීමටත් කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

50. කාර්යාංශයේ පිහිටුවන ලද පාරිභෝගික සේවා ඒකකය/නිලධාරියා විසින් ඒකාබද්ධ නිෂ්කාශනය හෝ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන කාර්යාංශය වෙත ඉතා කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. නිෂ්කාශන ලබා දෙන අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ද තම නිෂ්කාශන ඉතා කඩිනමින් ඉලෙක්ට්‍රොනික ක්‍රමයට/විද්‍යුත් තැපැල් ක්‍රමයට කාර්යාංශය වෙත ලබාදීමට බැඳී සිටී.

51. කාර්යාංශය විසින්, රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ආයතන විසින් ඛනිජ ඉවත් කිරීම සඳහා කියුබ් ප්‍රමාණය මත පිහිටුවා ගණනය කර අයකරන රජයේ ගාස්තු ප්‍රමාණ පිළිබඳව අදාළ රජයේ ආයතනය වෙත දැන්විය යුතුය. මෙම ගණනය 132 (ii) හි පරිදි සිදු කළ යුතුය.
    (i) කණිනු ලබන ස්ථාන මාස 06 කට වරක්, සමෝච්ඡ රේඛා සිතියමක් අනුව ගණනය කර ඉඩම් කළමනාකාරීත්වය හිමි ආයතනය/කැණීම්කරු/පුපුරණ ද්‍රව්‍ය පාලක වෙත දැනුම් දීම.

### 2.5.4 කැණීම් අයදුම්පත්‍ර වර්ගීකරණය සහ නිෂ්කාශන කැඳවීම

කැණීම් අයදුම්පත්‍ර වර්ගීකරණය සහ නිෂ්කාශන කැඳවීම

52. කාර්යාංශය විසින් ''ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනය'' භාවිත කර බලපත්‍ර ක්‍රියාවලියේ දී අවශ්‍ය නිෂ්කාශන කැඳවීමට පෙර ඒ සඳහා කුමන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයකින් නිෂ්කාශන කැඳවිය යුතු දැයි යන්න නිශ්චය කර ගත යුතුය.

53. P1-A ස්ථාන සඳහා ඉදිරිපත් වන අයදුම්පත්‍රය භාරගත් දින සිට දින 05 ක් ඇතුළත කාර්යාංශය විසින් ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකළ යුතුය.

54. P1-B හා P2 යටතට ගැනෙන ස්ථාන සඳහා, අයදුම්පත්‍රය භාරගත් දින සිට දින 05 ක් ඇතුළත කාර්යාංශය විසින් ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකළ යුතු අතර, මූලික පාරිසරික පරීක්ෂණ/පාරිසරික බලපෑම් ඇගයීම්/බලපෑම් ඇගයීම් අධ්‍යයනයකට භාජනය නොවන අවස්ථාවල අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන, දින 21 ක් ඇතුළත ලබා ගැනීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය (වැඩි විස්තර සඳහා 83 සිට 108 බලන්න).

55. P3 හෝ දැනට ප්‍රමුඛතා වර්ගීකරණ ලේඛනයේ නොමැති ස්ථාන සඳහා, අයදුම්පත්‍රය භාරගත් දින සිට දින 07 ක් ඇතුළත කාර්යාංශය විසින් ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකළ යුතු අතර මූලික පාරිසරික පරීක්ෂණ/පාරිසරික බලපෑම් ඇගයීම්/බලපෑම් ඇගයීම් අධ්‍යයනයකට භාජනය නොවන අවස්ථාවල, අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන, දින 21 ක් ඇතුළත ලබා ගැනීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය (වැඩි විස්තර සඳහා 83 සිට 108 බලන්න).

56. කාර්යාංශය විසින් හැකි සෑම අවස්ථාවකදී ම නිෂ්කාශන ලබාගත යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ද ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහභාගී කරගැනීමට කටයුතු කළ යුතුය.

57. කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී අවශ්‍ය වන පිපිරුම් පරීක්ෂණ, භූගත ජල සම්පත් සංවේදීතාවය, නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා, සැලසුම් නිරාකරණ වාර්තා, පුරාවිද්‍යා නිර්දේශය, මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයන සහ පාරිසරික බලපෑම් ඇගයීම් සහ වෙනත් නිෂ්කාශනවල අවශ්‍යතාවය, පූර්ණ

වශයෙන් "P1P2P3 වර්ගීකරණ ලේඛනය" තුළ යාවත්කාලීන වන තෙක් එම නිෂ්කාශන නිකුත් කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පරිච්ඡේද 04 හි 83 සිට 108 දක්වා සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය.

<u>කැණීම් බලපත්‍ර නිකුත් කිරීම</u>

කැණීම් බලපත්‍ර නිකුත් කිරීම

58. P1-A ස්ථාන සඳහා අයදුම්පත්‍රය භාරගත් දින සිට දින 07 ක් ඇතුළත ද P1-B ස්ථාන සඳහා දින 14 ක් ඇතුළත ද P2 ස්ථාන සඳහා දින 21 ක් ඇතුළත ද P3 ස්ථාන සඳහා දින 30 ක් ඇතුළත ද කැණීම් බලපත්‍රය නිකුත් කිරීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

59. මූලික පාරිසරික අධ්‍යයනයක් අවශ්‍ය වූ විට අයදුම්පත්‍රය භාර ගත් දින සිට මාස 01 ½ ක් ඉක්මවීමට පෙර ද බලපෑම් ඇගයීමක් අවශ්‍ය වන විට, "4.2: මූලික පාරිසරික පරීක්ෂණ /පාරිසරික බලපෑම් ඇගයීම" හි සඳහන් කාලරාමුව තුළ ද කැණීම් බලපත්‍රය නිකුත් කිරීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

60. කැණීම් බලපත්‍රය නිකුත් කිරීමට සමගාමීව,
    (i) පරිසර ආරක්ෂණ බලපත්‍රය,
    (ii) පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රය,
    (iii) වෙළඳ, කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍රය,
    (iv) ඉඩම් බදු පත්‍රය,

    නිකුත් කිරීම සඳහා කාර්යාංශය විසින් පරිසර අධිකාරිය, අදාළ පුපුරණ ද්‍රව්‍ය පාලක, පළාත් පාලන ආයතන සහ ඉඩම කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත බලපත්‍රයේ පිටපතක් වහාම යොමු කළ යුතුය. එසේම, නිෂ්කාශන නිකුත් කළ සියලුම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත ද බලපත්‍රයේ පිටපතක් යොමු කළ යුතුය. කෙසේ වෙතත්, අදාළ අයදුම්පත්‍රය කාර්යාංශය තුළ පරීක්ෂාවට ලක් වන යම් අවස්ථාවක, ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමේ හැකියාව පවතින බව නිරීක්ෂණය වන විට, පෙරකී ආයතන වෙත ප්‍රගමන ලිපියක් යැවීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

කැණීම් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

61. අමතර නිෂ්කාශන/පිපුරුම් පරීක්ෂණ ලබා ගැනීමක් සිදු වන අවස්ථාවේදී ඉල්ලුම් කළ දින සිට දින 21කින් පසුව ද, පාරිසරික බලපෑම් ඇගයීම් හි සඳහන් කාලරාමුව ගතවීමෙන් පසුව ද බලපත්‍ර නිකුත් කිරීම අනුමත නොකරන්නේ නම් ඒ බව උක්ත කාලයන් ඉක්මවා දින 03 ක් ඇතුළත හේතු සහිතව අයදුම්කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් සහ විද්‍යුත් තැපෑලෙන් දැනුම්දීමට කටයුතු කළ යුතුය (පනතේ 35 වන වගන්තිය.)

62. එලෙසම, නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමේ බලය කාර්යාංශය සතු වන අතර, අයදුම්පත්‍රය හෝ බලපත්‍රය අවලංගු කිරීමට කාර්යාංශය විසින් ගනු ලැබූ තීරණය හේතු සහිතව ඉල්ලුම්කරු හෝ බලපත්‍රලාභියා වෙත ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දිය යුතුය [පනතේ 38 (1) වගන්තිය].

63. අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රය සමඟ ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු අයදුම්කරුට ගෙවිය යුතුය.

### 2.5.5 අයදුම්පත්‍ර හෝ බලපත්‍ර අවලංගු කිරීම සහ ඊට එරෙහි අභියාචනා

අයදුම්පත්‍ර හෝ බලපත්‍ර අවලංගු කිරීමට එරෙහිව අභියාචනා කිරීම

64. අයදුම්පත්‍රය හෝ බලපත්‍රය ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අයදුම්කරුට හෝ බලපත්‍රලාභියාට අවලංගු කිරීමේ හෝ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ තීරණය දැනුම් දුන් දිනයේ සිට දින 14 ක් ඇතුළත පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ට අභියාචනා කළ හැකි වේ;
    (i) ලේකම් විසින් සිදු කරන අභියාචනා විභාගයකින් පසු ලේකම්වරයා විසින් නිකුත් කරන විධානය, කාර්යාංශය විසින් ක්‍රියාත්මක කළ යුතුය.
    (ii) අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රය සමඟ ගෙවන ලද බලපත්‍ර ගාස්තු ආපසු අයදුම්කරුට ගෙවිය යුතුය.

පරිසර ආරක්ෂණ බලපත්‍රය, පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රය, පළාත් පාලන ආයතන වෙළඳ, කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීම

65. කැණීම සඳහා බලපත්‍ර නිකුත් කළ දින සිට දින 14 ක් ඇතුළත, නිකුත් කර ඇති කැණීම් බලපත්‍රය පදනම් කර,
    (i) පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ද,
    (ii) පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රය ද,
    (iii) පළාත් පාලන ආයතනය විසින් වෙළඳ, කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍රය ද නිකුත් කළ යුතුයි.

මෙම ආයතන විසින් තම බලපත්‍ර ස්වායක්තව ලබාදිය යුතුය. පළාත් පාලන ආයතන විසින් වෙළඳ, කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීමේදී කැණීම් බලපත්‍රය හැර වෙනත් කිසිදු නිෂ්කාශන ලබා නොගත යුතුය.

පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු කාර්යභාරය

66. පුපුරණ ද්‍රව්‍ය පාලක විසින් පුපුරණ ද්‍රව්‍ය බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේදීම එහි පිටපතක් පහත ආයතන වෙත යොමු කළ යුතුය;
   (i) කාර්යාංශය
   (ii) ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය
   (iii) පරිසර අධිකාරිය
   (iv) පොලිස් ස්ථානය

**2.5.6 බලපත්‍ර නිකුත් කිරීමේ බලතල සීමා කිරීම්**

බලපත්‍ර නිකුත් කිරීමේ බලතල සීමා කිරීම්

67. ඉඩම් හිමිකරුගේ කැමැත්ත නොමැතිව යම් ඉඩමක ඛනිජ කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශය විසින් නොකළ යුතුය (පනතේ 51 වන වගන්තිය).
68. පහත සඳහන් භූමි/කලාප කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයේ නිර්දේශ නොමැතිව කාර්යාංශය විසින් එම භූමි සඳහා බලපත්‍ර නිකුත් නොකළ යුතුය (පනතේ 30 වන වගන්තිය).
   (i) වන සංරක්ෂණ භූමි
   (ii) වනජීවී කලාප
   (iii) වෙරළ කලාපය
   (iv) මහවැලි සංවර්ධන ව්‍යාපෘති බල ප්‍රදේශ
   (v) නාගරික සංවර්ධන කලාප
   (vi) පරිසර ආරක්ෂණ ප්‍රදේශ
   (vii) රජයේ ඉඩමක පිහිටි ස්මාරකයකට හෝ යම් ආරක්ෂිත ස්මාරකයකට හෝ පුරාවිද්‍යා ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ප්‍රදේශය (පනතේ 31 වන වගන්තිය)
69. ඒ අනුව, ඛනිජ කැණීම සඳහා බලපත්‍ර ඉල්ලා සිටින අවස්ථාවේ දී ඉඩම් හිමිකාරීත්වය දරන ආයතන/පුද්ගලයා විසින් එම ඉඩම් පරිහරණ එකඟතාව ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතුය (මේ පිළිබඳ වැඩි විස්තර, පරිච්ඡේද 03 හි දැක්වේ).

**2.6 රජයේ ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති සඳහා කෙරෙන ඛනිජ කැණීම් සහ ප්‍රවාහනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය**

රජයේ ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය

70. රජයේ ප්‍රමුඛ සංවර්ධන ව්‍යාපෘති ලෙස හඳුන්වන, වාර්ෂික අයවැය ප්‍රකාශයේ සඳහන් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හෝ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද හෝ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු විසින් නිර්දේශ කරනු ලබන හෝ ව්‍යාපෘතියක් සඳහා එම ව්‍යාපෘති යෝජක හෝ ක්‍රියාත්මක කරනු ලබන රජයේ ආයතනයක් විසින් බලපත්‍රයක් ඉල්ලුම් කරන අවස්ථාවක, කාර්යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පහත ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය.
   (i) රජයේ සංවර්ධන ප්‍රමුඛතා සඳහා අමුද්‍රව්‍ය කැණීමේදී, ගබඩා කිරීමේදී, ප්‍රවාහනයේදී, හා වෙළඳාමේදී එම ව්‍යාපෘති යෝජක හෝ ක්‍රියාත්මක කරනු ලබන රජයේ ආයතනය, බලපත්‍රලාභියා ලෙස සැලකිය හැක.

රජයේ ඉඩම් පරිහරණ එකඟතාවය දින 03 ක් ඇතුළත නිකුත් කිරීම

   (ii) රජයේ ඉඩම් පරිහරණ එකඟතාවයේදී, බලපත්‍ර අපේක්ෂිත රාජ්‍ය ආයතනයේ ඉල්ලීම ලැබී දින 03 ක් ඇතුළත එම ඉඩම කැණීම සඳහා එකඟතාවය ආකෘතිපත්‍ර 02 මගින් කාර්යාංශයට පිටපතක් සහිතව ඉල්ලුම්කාර රාජ්‍ය ආයතනය වෙත ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය විසින් නිකුත් කළ යුතුය. මෙම එකඟතාවය ලබා දීමේදී අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් 72 සිට 82 හි උපදෙස් (කාලය පිළිබඳ උපදෙස් හැර) ද පිළිපැදිය යුතුය.
      (අ) යම් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් විසින් මෙම කාර්ය සංග්‍රහයේ විෂය පථය යටතේ හු සම්පත්/ඛනිජ කැණීම හා සම්බන්ධ ක්‍රියාවක් සඳහා ඉඩම් පැවරීමක් ඉල්ලා සිටින්නේ නම් ඒ පිළිබඳ තීරණය, ඉල්ලීම ලැබී දින 30 ක් ඇතුළත නිකුත් කිරීමටත්, ඉඩම් පැවරීමට එකඟතාවය පළ කර දින 05 ක් තුළ ඉඩමේ භුක්තිය පැවරීමටත්

රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය විසින් වග බලා ගත යුතුය.

(iii) බලපත්‍ර ඉල්ලුම්කාර ආයතනය විසින් 42 හි ලියවිලි ඇතුළත් අයදුම්පත්‍රයක් කාර්යාංශයට ඉදිරිපත් කළ යුතුය.

(iv) මූලික පරිසර පරීක්ෂණයකට හෝ බලපෑම් අධ්‍යයනයකට හෝ ලක් වේ නම් මිසක, මෙවැනි ඉල්ලීමකට අදාළ අයදුම්පත්‍රය සම්බන්ධයෙන් ස්වකීය තීරණය කාර්යාංශය විසින් දින 21 ක් තුළ නිකුත් කළ යුතුය.

(v) මෙම ක්‍රියාවලියේදී, කාර්යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දී අවම කාලයකදී බලපත්‍ර/නිෂ්කාශන නිකුත් කිරීමට වග බලා ගත යුතුය.

(vi) මෙම ක්‍රියාවලිය අපේක්ෂිත අයුරින් සිදුනොවන බව නිරීක්ෂණය වන්නේ නම් ඉල්ලුම්කාර රජයේ ආයතනය විසින් ඒ බව පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ජාතික අධීක්ෂණ කමිටුව වෙත වාර්තා කළ යුතුය.

## 2.7 අඩු අදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් පාරිභෝගිකයන් වෙත පහසු මිලට වැලි සැපයීම (විශේෂ වැලි කැණීම් කලාප/ වැලි මධ්‍යස්ථාන)

අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් පාරිභෝගිකයන් වෙත පහසු මිලට වැලි සැපයීම

71. විශාල වශයෙන් වැලි සංචිත ඇති ස්ථාන ආශ්‍රිතව පරිසර විෂය භාර අමාත්‍යාංශය විසින් වැලි මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය;

(i) ත්‍රිකුණාමලය, පොළොන්නරුව, මඩකලපුව, පුත්තලම, කුරුණෑගල යන දිස්ත්‍රික්කවල හඳුනාගත් විශේෂ වැලි කැණීම් කලාප 07 ක් මූලික කර නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රථමයෙන් ආරම්භ කළ යුතුය. නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය අනුව දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

(ii) ව්‍යාපෘතිය ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් මගින් ක්‍රියාත්මක කළ හැක.

(iii) වැලි මධ්‍යස්ථාන මගින්, එම කැණීම් කලාප ආශ්‍රිත ප්‍රදේශයේ ජීවත්වෙන අඩු ආදායම්ලාභීන්/සමෘද්ධිලාභීන්හට ස්වයං රැකියාවක් ලෙස වැලි ගොඩදැමීම සිදුකිරීමට අවස්ථාව සැලසිය යුතු අතරම පාරිභෝගිකයන්ට පහසු මිලට වැලි ලබාගැනීමට හැකියාව ද සැලසිය යුතුය.

(iv) තෝරා ගනු ලබන විශේෂ වැලි කලාප අයත්වන ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් මඟින් මෙම වැලි මධ්‍යස්ථාන පාලනය කළ යුතුය. කාර්යාංශයේ නියෝජිතයෙකු කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කළ යුතුය. මෙම කමිටුව පත් කළ යුත්තේ, අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය මත පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසිනි.

(v) උපලේඛන 03 හි දක්වා ඇති මාර්ගෝපදේශයට අනුකූලව, වැලි මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන ක්‍රමවේදය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ එකඟතාවය ලබා ගත යුතුය.

## 03.තෙවන පරිච්ඡේදය:

## රාජ්‍ය ඉඩම් හිමිකාරිත්වය/ කළමනාකාරිත්වය දරන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන සහ පෞද්ගලික දේපළ හිමිකරුවන් විසින් එම ඉඩම් පරිහරණය සඳහා එකඟතාවය නිකුත් කිරීම

**3.1 රජයේ ඉඩම්**

72. අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය හා ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව ඉඩම් හිමිකාරිත්වය දරන සියලුම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන, තම නිෂ්කාශන ලබා දීමේදී මතු දැක්වෙන පරිදි ක්‍රියා කළ යුතුය (2021.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ 21/1766/301/022 සහ අංක CTF/02/2021 හා 2021.10.11 දිනැති ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය).

රජයේ ඉඩම් පරිහරණ එකඟතාව නිකුත් කිරීම

73. යෝජිත කැණීම් භූමියේ හිමිකාරිත්වය රජය සතුවන අවස්ථාවක දී සහ එම ඉඩම ප්‍රාදේශීය ලේකම්ගේ පරිපාලනය යටතේ පවතින අවස්ථාවකදි ප්‍රාදේශීය ලේකම් විසින් ද, එම ඉඩම වෙනත් වියවස්ථාපිත රාජ්‍ය ආයතනයක කළමනාකරණය යටතේ පවතින අවස්ථාවකදි එම ආයතනයේ දිස්ත්‍රික්/ප්‍රාදේශීය නිලධාරීන් විසින් ද ඉඩමේ පිහිටි ස්ථානයක කැණීම් කිරීමට අවශ්‍ය ඉඩම් පරිහරණ එකඟතාවය නිකුත් කළ යුතුය;
   (i) මෙහිදී පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ගේ එකඟතාවය ලබා ගැනීම අවශ්‍ය නොවේ. ප්‍රාදේශීය ලේකම් හෝ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල දිස්ත්‍රික්/ප්‍රාදේශීය නිලධාරීන් විසින්, මෙම විෂය සඳහා, තම නිර්දේශය ස්වාධීනව ලබා දිය යුතු අතර, අනෙකුත් ආයතන විසින් ලබා දෙන නිර්දේශ මත පදනම්ව තම නිර්දේශය ලබා දීම ප්‍රමාද කිරීම අවශ්‍ය නොවේ.

රජයේ ඉඩම් පරිහරණ ගාස්තු

   (ii) කාර්යාංශය විසින් රාජ්‍ය භාගය ද ඇතුළුව වෙනත් ගාස්තු අය කර කැණීම් බලපත්‍රය නිකුත් කිරීමෙන් පසුව එම කැණීම් ද්‍රව්‍ය භාවිත කරමින් යම් ආකාරයකට ගබඩා කිරීම, අලෙවි කිරීම හෝ වැඩිදියුණු කිරීමේ කර්මාන්තයක් සඳහා, කැණීම් ස්ථානයට පරිභාහිරව රජයේ ඉඩම් පරිහරණය කෙරේ නම් එම පරිහරණය සඳහා බදු හෝ ගාස්තු අය කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හෝ අදාළ ආයතනයට නියමිත කාර්ය පටිපාටිය අනුව කටයුතු කළ හැක.

ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන සතු ඉඩම්

74. ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, වන සංරක්ෂණ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු යටතේ පාලනය වන රජයේ ඉඩම්/වැව්/කුඹුරුවල කැණීම් කිරීමට අවශ්‍ය ඉඩම් පරිහරණ එකඟතාවය එම දෙපාර්තමේන්තු විසින් ලබා දිය යුතුය.

75. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, රාජ්‍ය වැවිලි සමාගම, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, වැවිලි සමාගම් සහ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ඉඩම්වල පිහිටි ස්ථානයක කැණීම් කිරීමට අවශ්‍ය ඉඩම් පරිහරණ එකඟතාවය එම ආයතන විසින් ලබා දිය යුතුය;
   (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හෝ රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ඉඩම් පරිහරණ එකඟතාවය ලබා දීමේදී ඒ ඒ ස්ථාන සඳහා කැණීමට අවසර දිය හැකි උපරිම අගය සම්බන්ධව ස්වකීය ප්‍රාදේශීය නිලධාරීන්ට සීමාවන් පනවා ඇත්නම්, එම සීමාවන් නොසලකා එකඟතාවය නිකුත් කරන ලෙස උපදෙස් ලබා දීමට එම ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.
   (ii) එසේ සීමාවන් පවතින උක්ත ස්ථානවලින් වාර්ෂිකව කැණිය හැකි උපරිම සීමාව පිළිබඳ විස්තර කාර්යාංශය සහ ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යවා වර්ගීකරණ ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. එහිදී කාර්යාංශය විසින් ප්‍රශස්ත වාර්ෂික සීමාවක් පිළිබඳව නිර්දේශය ලබා දිය යුතුය.

මායිම් නිරවුල් කිරීම

76. කැණීමක් සඳහා යෝජිත ඉඩමක මායිම් නිරවුල් කිරීමට අවශ්‍ය නම් ග්‍රාම නිලධාරි/ඉඩම් පිළිබඳ බලයලත් නිලධාරි/රජයේ මැනුම් නිලධාරී විසින් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයක් හෝ විධිමත් පිඹුරක් මගින් තහවුරු කර

ගත යුතුය. කැණීම් ස්ථානය රජයේ පූර්ණ හිමිකම සහිත භෞතික සීමාව තුළ පිහිටි බව නිශ්චිත නම්, කැණීම් ආරම්භ කිරීමට පෙර මායිම් පෙන්වාදීමට යටත්ව එම ඉඩම් පරිහරණ එකඟතාවය නිකුත් කළ හැක.

රජය විසින් බැහැර කර ඇති ඉඩම්

77. ස්ථිරවම බැහැර කර ඇති ඉඩම් (දීමනාපත්‍ර, ප්‍රදානපත්‍ර, මධ්‍යම පාන්තික දීමනාපත්‍ර හා නියාදන සාදනපත්‍ර) තුළ කැණීම් සිදු කිරීමට ඉල්ලුම් කරන අවස්ථාවලදී එම බැහැර කිරීම සිදු කර ඇති ආයතනවල එකඟතාවය නිකුත් කිරීම අවශ්‍ය නොවේ. කෙසේවෙතත්, මෙකී දීමනාපත්‍ර/ප්‍රදානපත්‍ර මගින් බැහැර කර ඇති ඉඩම, හා කැණීම් කිරීමට ඉල්ලුම් කර ඇති ඉඩම් එකම ඉඩමක් ද යන්න සිතියම්/පිඹුර මගින් සනාථ කර ගත යුතුය.

<u>රජයේ ඉඩම් - පොදු උපදෙස්</u>

රජයේ ඉඩම් - පොදු උපදෙස්

78. කුමන හෝ රජයේ ඉඩමක් සම්බන්ධයෙන් නම් අදාළ බලධාරීන් විසින් අකෘතිපත්‍ර 2 අනුව සැකසූ එකඟතා ලිපිය මගින් ඉඩමේ පිහිටි ස්ථානයක කැණීම් කිරීමට අවශ්‍ය ඉඩම් පරිහරණ එකඟතාවය, ඉල්ලීම භාරගත් දින සිට දින 07 ක් ඇතුළත කාර්යාංශය වෙත පිටපතක් සහිතව අයදුම්කරුට නිකුත් කළ යුතුය.

79. ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන නිකුත් කිරීමේදී ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කිරීම වෙනුවට කැණීම් ස්ථානයට ආසන්නම දිස්ත්‍රික්/ප්‍රාදේශීය නිලධාරීන් විසින් එම ඉඩම් පරිහරණ එකඟතාවය නිකුත් කිරීමට ක්‍රියා කළ යුතු වේ. ඒ සඳහා, අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් ස්වකීය දිස්ත්‍රික්/ප්‍රාදේශීය නිලධාරීන්ට අවශ්‍ය සියලු බලතල පවරා දිය යුතුය.

80. කැණීම් කළ යුතු ඛනිජ ප්‍රමාණ පිළිබඳ තම නිර්දේශයේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය නොවන අතර කැණීම් කරනු ලබන ප්‍රමාණය හා බලපත්‍ර කාණ්ඩය කාර්යාංශය විසින් තීරණය කළ යුතුය.

81. යම් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් විසින් ඉඩම් පැවරීමක් ඉල්ලා සිටින්නේ නම් ඒ පිළිබඳව 70 (ii අ) වගන්තිය අනුව ක්‍රියා කළ යුතුය.

### 3.2 පෞද්ගලික ඉඩම්

පෞද්ගලික ඉඩම් පරිහරණ එකඟතාව නිකුත් කිරීම

82. පෞද්ගලික අයිතිය යටතේ ඇති දේපළක කැණීම් කිරීමට අවශ්‍ය විට ඔප්පුව සමඟ බලයලත් මිනින්දෝරුවරයකු විසින් අඳින ලද පිඹුරක්/සිතියමක් ද, අයදුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවල දී බදු ගිවිසුම හෝ වෙනත් නීත්‍යානුකූල පැවරුම් ලියවිල්ලක් සමඟ බලයලත් මිනින්දෝරුවරයකු විසින් අඳින ලද පිඹුරක්/ සිතියමක් ද අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

# 04. සිව්වන පරිච්ඡේදය:

## මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය, පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සහ සෙසු නිෂ්කාශන (ලේඛනගත ස්ථාන )

කැණීම් බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේ දී අවශ්‍ය වන පිපිරුම් පරීක්ෂණ, පාරිසරික නිර්දේශය, භූගත ජල සම්පත් සංවේදීතාවය, නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා, සැලසුම් නිරාකරණ වාර්තා, පුරාවිද්‍යා නිර්දේශය, මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයන සහ පාරිසරික බලපෑම් ඇගයීම් සහ වෙනත් නිෂ්කාශනවල අවශ්‍යතාවය පූර්ණ වශයෙන් "P1P2P3 වර්ගීකරණ ලේඛනය" තුළ යාවත්කාලීන වන තෙක් කාර්යාංශය සහ එම නිෂ්කාශන නිකුත් කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් වගන්ති 83 සිට 108 දක්වා සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුය. ඒකීය ආයතනික ව්‍යුහය යටතේ කාර්යාංශය විසින් මෙම නිෂ්කාශන ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේම කාර්යාංශය විසින් ඒ සඳහා අවශ්‍ය වැඩපිළිවෙළ සකසා ගත යුතුය.

### 4.1 පාරිසරික නිර්දේශය

පාරිසරික නිර්දේශ

83. කැණීම් ස්ථානයකට අදාළ පාරිසරික නිර්දේශ නිකුත් කළ යුතු වන්නේ නම් පරිසර අධිකාරිය විසින් එය දින 14 ක් තුළ නිකුත් කළ යුතුය.

### 4.2 මූලික පාරිසරික පරීක්ෂණ /පාරිසරික බලපෑම් ඇගයීම

පාරිසරික බලපෑම් ඇගයීම

84. සංවර්ධන ක්‍රියාවලියන්ගෙන් ස්වාභාවික හා සමාජීය පරිසරයට එල්ල විය හැකි බලපෑම් පුරෝකථනය කරන්නා වූ ක්‍රියාවලියක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් සහ මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයන ක්‍රියාවලිය හැඳින්විය හැකිය. එමඟින් ස්වාභාවික හා සමාජීය පරිසරයට සිදු විය හැකි අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම සහ හිතකර බලපෑම් වර්ධනය කිරීම සඳහා ක්‍රියාමාර්ග යෝජනා කිරීම සිදු කළ යුතුය. මෙම ක්‍රියාවලිය සඳහා යොමුවිය යුත්තේ "නියමිත" (Prescribed) ව්‍යාපෘති පමණකි. මෙම ක්‍රියාවලියේ දී පහත පියවර අනුගමනය කළ යුතුය.
    (i) ව්‍යාපෘති යෝජක විසින් මූලික තොරතුරු ඉදිරිපත් කිරීම,
    (ii) විෂය නිර්ණය (Terms of Reference- ToR) ව්‍යාපෘති යෝජක වෙත යොමු කිරීම,
    (iii) පාරිසරික බලපෑම් ඇගයීම්/මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව ව්‍යාපෘති යෝජක විසින් සූදානම් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම,
    (iv) පාරිසරික බලපෑම් ඇගයීම් සඳහා පමණක් මහජන අදහස් විමසීම,
    (v) තාක්ෂණික කමිටුවක් විසින් වාර්තාව විශ්ලේෂණය කිරීම,
    (vi) තීරණ ගැනීම,
    (vii) පරිසර අනුමැතිය ලබා දෙන ලද ව්‍යාපෘතිවලට ලබා දුන් කොන්දේසි ඉටු කිරීම පිළිබඳව පසු විපරම් කිරීම.

85. ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘතියේ ප්‍රමාණය හා එමගින් පරිසරය වෙත සිදුවිය හැකි බලපෑම සුළු අගයක් ගන්නේ නම්, එකී ව්‍යාපෘති වෙනුවෙන් මූලික පාරිසරික අධ්‍යයනයක් පමණක් සිදුකිරීම ප්‍රමාණවත් වේ (ජාතික පරිසර පනතේ නියෝග 772/22).

86. පරිසර බලපෑම් ඇගයීම් හෝ මූලික පාරිසරික පරීක්ෂණ සඳහා යම් ව්‍යාපෘතියක් යොමු කිරීම සිදු වන්නේ ජාතික පරිසර පනතේ නියෝග අනුවය (1993.06.24 දිනැති අංක 772/22 දරන සහ 1995.02.23 දිනැති අංක 859/14 දරන අතිවිශේෂ ගැසට් නිවේදන). ඒ අනුව,
    (අ) ව්‍යාපෘතියේ විශාලත්වය අනුව පහත කැණීම් ව්‍යාපෘති සඳහා පරිසර බලපෑම් ඇගයීම් හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලිය අවශ්‍ය වේ.
        (i) මීටර් 25 කට වඩා ගැඹුරැති ගොඩබිම් පතල් කැණීම හා ඛනිජ හැරීම,
        (ii) හෙක්ටයාර 10 කට වැඩි සමස්ත බිම් ප්‍රමාණයක් ඇති ප්‍රදේශවල මතුපිට ඛනිජ ලබා ගැනීම,
        (iii) අක්වෙරළේ සියලු කැණීම් සහ ඛනිජ හැරීමේ කටයුතු,
        (iv) යම් නිවාස හෝ වාණිජ ප්‍රදේශයකින් කිලෝමීටර් 01 ක් ඇතුළත හුණු ගල්, සිලිකා, ක්වාට්ස්, වැලි, ගල්, කිරිගරුඬ සහ විසිතුරු ගොඩනැගිලි ගල් යන්ත්‍රානුසාරයෙන් ලබා ගැනීම.

ඊට අමතරව කැණීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන්නේ නම් ඒවා ද නියමිත ව්‍යාපෘති ලෙස, මෙම ගැසට් නිවේදන අනුව, සැලකේ.

(v) හෙක්ටයාර එකකට වැඩි ඉඩම් ප්‍රදේශයක ඇති කැලෑ, කැලෑ ආශ්‍රිත නොවන ප්‍රයෝජනයක් සඳහා යොදා ගැනීම,

(vi) හෙක්ටයාර 50 කට වැඩි භූමි ප්‍රදේශයක් එළි කිරීම,

(vii) හෙක්ටයාර 05 කට වැඩි ප්‍රදේශයක ඇති දැව ඉවත් කිරීම.

(ආ) උක්ත නියෝගයන්හි සඳහන් කර ඇති පරිදි සංවේදී කලාපයක් තුළ ව්‍යාපෘතිය පිහිටා ඇත්නම් ව්‍යාපෘතියේ විශාලත්වය නොසලකා එම ව්‍යාපෘතිය පරිසර බලපෑම් ඇගයීම් හෝ මූලික පාරිසරික පරීක්ෂණ ක්‍රියාවලියකට යොමු විය යුතුය.

<u>වෙරළ කලාපයේ පාරිසරික බලපෑම් අධ්‍යයනය</u>

පාරිසරික බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය- වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

87. ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ "වෙරළ කලාපයේ" නම් කාර්යාංශය විසින් එම ඇගයීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විමසිය යුතුය ("වෙරළ කලාපය" ට අයත් වන ප්‍රදේශය පිළිබඳව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ අර්ථ නිරූපණය කර ඇත -"වෙරළ කලාපය" යන්නෙන් මධ්‍ය වඩදිය ඉම සිට ගොඩබිම දෙසට මීටර් තුන්සියයක සීමාවක් සහ මධ්‍ය බාදිය ඉම සිට මුහුද දෙසට කිලෝමීටර් දෙකක සීමාවක් ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර ස්ථිර වශයෙන් හෝ කලින් කළ මුහුදට සම්බන්ධ වූ ගංගා, දිය පාරවල්, කලපු හෝ වෙනත් යම් ජලකඳක් සම්බන්ධයෙන් වන විට, ගොඩ බිම දෙසට වූ මායිම ඒවායේ ස්වභාවික ඇතුළුවීමේ ලක්ෂය අතර අඳින ලද ඍජු පාද රේඛාවකට ලම්භකව මනින ලද කිලෝමීටර් දෙකක සීමාවකට ව්‍යාප්ත විය යුතු අතර, එසේ මුහුදට සම්බන්ධ වූ ඒ ගංගා, දිය පාරවල් සහ කලපු හෝ වෙනත් යම් ජලකඳක් සහ මායිම දිගේ ශුන්‍ය මධ්‍ය මුහුදු මට්ටමේ සිට ගොඩබිම දෙසට මීටර් සියයකින් දීර්ඝ කළ වැඩිදුර සීමාවක් ඇතුළත වූ ප්‍රදේශය ද ඇතුළත් වේ).

<u>වනජීවී සංරක්ෂිත ප්‍රදේශ තුළ පාරිසරික බලපෑම් අධ්‍යයනය</u>

පාරිසරික බලපෑම් ඇගයීම / මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

88. ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ [අභයභූමි (Sanctuary) හැර] සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත මගින් නම් කරන ලද ජාතික රක්ෂිතයක් මායිමේ සිට කිලෝමීටර 1.5 ක දුර සීමාවට ඇතුළත්ව නම් කාර්යාංශය විසින් එම ඇගයීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විමසිය යුතුය.

<u>වන සංරක්ෂණ රක්ෂිත ප්‍රදේශ තුළ පාරිසරික බලපෑම් අධ්‍යයනය</u>

පාරිසරික බලපෑම් ඇගයීම/ මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

89. විශේෂ පාරිසරික වැදගත්කමක් සහිත බිම් කොටසක් තුළ අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ නම් බිම් ප්‍රමාණය නොසලකා පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියක් සිදු කළ යුතු අතර සුවිශේෂී වැදගත් කමක් සහිත පාරිසරික සංවේදී කලාපයන් ලෙස ප්‍රකාශයට පත්කල බිම් කොටස් තුළ ඊට කුමන හෝ ආකාරයක අහිතකර බලපෑමක් සිදුවන ව්‍යාපෘතින් සඳහා අවසර ලබා නොදිය යුතුය.

90. කැණීම් ඉල්ලීමක් ලද පසු, යෝජිත ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප කරන්නේ නම් ඒ බව හෝ යොදා ගන්නා බිම් කොටස රක්ෂිත වනයකට අයත් වේ නම් ඒ බව හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන හෙක්ටයාර 01 ට වැඩි බිම් කොටසක් වේ නම් එම ව්‍යාපෘතිය පිළිබඳව පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියක් සිදු කළ යුතු බව ව්‍යාපෘති යෝජක හෝ කාර්යාංශය වෙත දැනුම් දිය යුතුය.

<u>මූලික පරිසර අධ්‍යයන/ පාරිසරික බලපෑම් අධ්‍යයන සම්බන්ධ පොදු උපදෙස්</u>

කැණීම් සම්බන්ධ පරිසර අධ්‍යයන සම්බන්ධ පොදු උපදෙස්

91. යම් ව්‍යාපෘතියක් යටතේ රජයේ හෝ පෞද්ගලික ඉඩමක් තුළ කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම් සිදුකරන අවස්ථාවකදී පාරිසරික අනුමැතිය ලබා දිය යුතු විටදී සුදුසු පරිදි මූලික පාරිසරික අධ්‍යයනයක්, පාරිසරික බලපෑම් ඇගයීමක් හා පුරා විද්‍යා බලපෑම් ඇගයීමක් සිදු කළ යුතුය. එහිදී ව්‍යාපෘති යෝජක විසින් අධ්‍යයනය/ඇගයීම් ක්‍රියාවලිය සඳහා වන පිරිවැය දැරිය යුතුය.

92. තම අවශ්‍යතාවය ව්‍යාපෘති යෝජක විසින් පරිසර අධිකාරිය වෙත දැනුම් දිය යුතු අතර, පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘති අනුමත කිරීම සලකා බැලීමට අනුයෝජිත ආයතන ලෙස ක්‍රියා කරනු ලබන පරිසර අධිකාරිය හෝ වෙරළ

සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නම් කිරීමෙන් පසුව පාරිසරික ඇගයීම් ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය.

93. ව්‍යාපෘතියකින් තොරව කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම් සඳහා සුදුසු යැයි පූර්ව හඳුනාගැනීමක් සිදුකරනු ලබන රජයේ ඉඩම් සඳහා පාරිසරික අනුමැතිය ලබා දිය යුතු අවස්ථාවලදී ද සුදුසු පරිදි පාරිසරික බලපෑම් ඇගයීමක් හෝ මූලික පාරිසරික අධ්‍යයනයක් සිදු කළ යුතුය. මෙහිදී ව්‍යාපෘති යෝජක ලෙස කාර්යාංශය ක්‍රියා කළ යුතුය. එහිදී මූලික පාරිසරික පරීක්ෂණ, පරිසර බලපෑම් ඇගයීම් හා පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සඳහා වන පිරිවැය ද කාර්යාංශය විසින් දැරිය යුතුය.

94. කළුගල්, වැලි, පස්, බොරළු හා මැටි කැණීම් සඳහා සුදුසු යැයි පූර්ව හඳුනාගැනීමක් සිදු කරනු ලබන රජයේ ඉඩම් සඳහා පාරිසරික අනුමැතිය ලබා දියයුතු අවස්ථාවල දී ව්‍යාපෘති යෝජනාවක් පිළියෙල කර සුදුසු පරිදි පාරිසරික බලපෑම් ඇගයීමක් හෝ මූලික පාරිසරික අධ්‍යයනයක් සිදු කළ යුතුය.

*ගත කළ යුතු කාලය*

95. ඉහත අවස්ථාවලදී හෝ වෙනත් රජයේ හෝ පෞද්ගලික අවස්ථාවලදී ව්‍යාපෘතියේ පරිසර අනුමැතිය ලබා දීම සලකා බැලීමට අනුයෝජිත ආයතනය ලෙස ක්‍රියා කරනු ලබන පරිසර අධිකාරිය හෝ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත කාර්යාංශය හෝ අයදුම්කරු විසින් නිවැරදි තොරතුරු සහිතව සම්පූර්ණ කර ඉදිරිපත් කරන මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් /පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවක් සඳහා අදාළ, කොන්දේසි හා නීති මාලාව/ විෂය නිර්ණය කිරීම (ToR), ඉල්ලීම කළ දින සිට දින 07 ක් ඇතුළත අයදුම්කරු වෙත නිකුත් කිරීමට උක්ත ආයතන ක්‍රියා කළ යුතුය;

   (i) අවසානාත්මක පාරිසරික බලපෑම් ඇගයීම් හෝ මූලික පාරිසරික අධ්‍යයන වාර්තා ලබා දුන් දින සිට, මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනයකට යොමු කරන ලද අවස්ථාවල දී මාස 01 ½ ක් ඇතුළත ද පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනයකට යොමු කරන ලද අවස්ථාවල දී මාස 03 ක් ඇතුළත ද එම වාර්තා හා ව්‍යාපෘති සඳහා අනුමැතීන් ලබා දීමට එම ආයතන කටයුතු කළ යුතුය (ව්‍යාපෘති යෝජක විසින් විෂය නිර්ණ ලේඛනය ලබාගත් පසුව ව්‍යාපෘති වාර්තාව පිළියෙල කිරීම හා ව්‍යාපෘති වාර්තාවේ පෙන්වාදෙන දෝෂ නිවැරදි කර නැවත ඉදිරිපත් කිරීමට ගන්නා කාලය මෙම මාස තුනක (03) කාලයට අන්තර්ගත නොවේ. මෙම මාස තුන, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය විසින් නියමිත පටිපාටිය අනුගමනය කිරීමට ගන්නා කාලය විය යුතුය).

96. නිර්දේශ/ අනුමැතීන් ලබාදීමට ගතවන කාල සීමාවන් රජයේ වුවත් පෞද්ගලික අංශයේ වුවත්, එක සමාන විය යුතුය.

97. සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය විසින් පරිසර අධිකාරියේ ද එකඟතාවය මත කොන්දේසි සහිතව හෝ රහිතව අදාළ ව්‍යාපෘතිය අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතුය. යෝජිත ව්‍යාපෘතිය අනුමත කිරීම සුදුසු වේ නම් නිශ්චිත කාලසීමාවක් සඳහා වලංගු පරිසර බලපත්‍රයක් අදාළ ව්‍යාපෘතිය සඳහා නිකුත් කළ යුතුය.

98. "ඒකීය ආයතනික ව්‍යුහය" යටතේ, කාර්යාංශය විසින් සියලු පාරිසරික අධ්‍යයන සහ බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කළ යුතුය.

### 4.3 පුරාවිද්‍යා නිර්දේශය/ පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් අධ්‍යයනය

*පුරාවිද්‍යා නිර්දේශය/ බලපෑම් ඇගයීම - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව*

99. ශ්‍රී ලංකාවේ සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය සම්පූර්ණයෙන් හඳුනාගෙන වාර්තා ගත කර නැති බැවින් සෑම නව ඛනිජ හා පාෂාණ නිස්සාරණ ස්ථානයක් සඳහාම ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර පුරාවිද්‍යාත්මක සාධක දෘෂ්‍යමාන නොවේ නම් පුරාවිද්‍යා නිර්දේශයක්/ ඇගයීම් සමීක්ෂණයක් නිකුත් කළ යුතුය.

100. හෙක්ටයාර් 0.25 ට අඩු භූ සම්පත් කැණීම සඳහා බලපත්‍ර ලබාදීමේ දී කාර්යාංශයෙන් පුරාවිද්‍යා නිර්දේශ ඉල්ලීම කළ පසු ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය මගින් කොන්දේසි සහිතව ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා නිර්දේශය නිකුත් කළ යුතුය (යම් භූමියක් පරීක්ෂාකර මතුපිට පුරාවස්තු නොමැති බවට නිර්දේශ කළ පසු නැවත පරීක්ෂාකිරීමක් සිදුකළ යුතු නොවේ. එහිදී, නිර්දේශයේ දක්වා ඇති කොන්දේසි බලපැවැත්වේ).

101. හෙක්ටයාර 0.25 ට වැඩි භූ සම්පත් කැණීම් (පස්/බොරළු/කළුගල්) ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර යෝජිත ඉඩමේ පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණයක් සිදුකළ යුතුය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භූමිය පිළිබඳ තොරතුරු ලත් වහාම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයෙන් මූලික නිරීක්ෂණ වාර්තාවක් කැඳවන අතර එහි දී මතුපිට පුරාවිද්‍යා සාධක නොමැති නම් එම භූමිය නිදහස් කිරීම පොදු කොන්දේසි යටතේ සිදු කළ යුතුය [1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ 43 (අ) වන වගන්තිය සමඟ ඇති 47 වන වගන්තිය යටතේ පනවා ඇති නියෝග].

102. ප්‍රදේශයේ පුරාවස්තු ඇති බවට සාධක දක්නට ලැබුණහොත් පුරාවිද්‍යා බලපෑම් ඇගයීමක් අවශ්‍ය බව ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය විසින් ප්‍රධාන කාර්යාලයට දැන්විය යුතුය. එවිට එය ව්‍යාපෘති යෝජකයා සහ කාර්යාංශය වෙත දනුම් දිය යුතුය.

103. බලපෑම් ඇගයීමේ දී පුරාවිද්‍යා ජාතික ප්‍රතිපත්තියේ සඳහන් ආකාරයට පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක වර්ගීකරණයක් සිදු කර අදාළ සංවර්ධන කාර්යයට ඉඩ ලබාදිය හැකි ආකාරය යෝජනා සහිතව දක්වා නිර්දේශය ලබා දිය යුතුය.

104. පුරාවිද්‍යා පරීක්ෂාව ඉල්ලුම් කිරීමට පෙර අදාළ භූමිය බර යන්ත්‍රෝපකරණ යොදා කැණීම් කර හෝ මතුපිට පස් ස්ථර ඉවත්කර තිබේ නම් හෝ එවැනි ස්ථානයක පුරාවිද්‍යා සාධක විතැන්ව තිබේනම් ඊට එරෙහිව පුරාවිද්‍යා ආඥා පනතට අනුව නීතිමය පියවර ගත යුතුය.

105. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මූලික නිරීක්ෂණයක් මගින් පොදු කොන්දේසි මත නිර්දේශ ලබා දෙන්නේ නම් දින 14 ක් ඇතුළත ද පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් සමීක්ෂණයක් සිදු කරන්නේ නම් සේවායෝජකයා බලපෑම් ඇගයීම සඳහා මුදල් ගෙවීමෙන් පසු මාස 03 ක් ඇතුළත ද නිර්දේශ ලබා දිය යුතුය (ව්‍යාපෘති යෝජක විසින් විෂය නීර්ණ ලේඛනය ලබාගත් පසුව ව්‍යාපෘති වාර්තාව පිළියෙල කිරීම හා ව්‍යාපෘති වාර්තාවේ පෙන්වාදෙන දෝෂ නිවැරදි කර නැවත ඉදිරිපත් කිරීමට ගන්නා කාලය මෙම මාස 03 කාලයට අන්තර්ගත නොවේ. මෙම මාස 03, ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය විසින් නියමිත පටිපාටිය අනුගමනය කිරීමට ගන්නා කාලය විය යුතුය).

## 4.4 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් සිදු කරන නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා

නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා

106. නායයෑම් සිදුවීමේ ප්‍රවණතාවය ඇති ලෙස නම් කර තිබෙන දිස්ත්‍රික්ක තුළ සිදු කෙරෙන ව්‍යාපෘති සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි පූර්ව අනුමැතිය ලබාගත යුතුය. තවද, පරිබාහිර දිස්ත්‍රික්කයක පිහිටිය ද, ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය ආශ්‍රිතව නායයෑම්/භූ අස්ථාවරතා අවදානමක් පවතින බවට ව්‍යාපෘතිය අනුමත කෙරෙන ආයතනය විසින් නිරීක්ෂණය කරන්නේ නම්, එවන් ස්ථාන සඳහා ද ව්‍යාපෘති යෝජක විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙහි පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

## 4.5 ජල සම්පත් මණ්ඩලය සිදු කරන භූගත ජල සම්පත් සංවේදීතාවය

භූගත ජල සම්පත් සංවේදීතාවය

107. ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය ආශ්‍රිතව භූගත ජල සම්පත් සංවේදීතා අවදානමක් පවතින බව කාර්යාංශය විසින් නිරීක්ෂණය කරන්නේ නම්, එවන් ස්ථාන සඳහා ද ව්‍යාපෘති යෝජක විසින් ජල සම්පත් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

## 4.6 නාගරික සංවර්ධන කලාප තුළ නාගරික සැලසුම් නිරාකරණ වාර්තා

නාගරික සැලසුම් නිරාකරණ වාර්තා

108. ව්‍යාපෘතිය සිදු කරන ස්ථානය නාගරික සංවර්ධන කලාපයක ස්ථානගත වී ඇත්නම්, එවන් ස්ථාන සඳහා ද ව්‍යාපෘති යෝජක විසින් නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

# 05.පස්වන පරිච්ඡේදය:

## සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්, කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් කැණීම/ප්‍රවාහනය සඳහා බලපත්‍ර/අවසරපත්‍ර නිකුත් කිරීම (ලේඛනගත නොවූ)

බලපත්‍ර/අවසරපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ඇති නීතිමය විධිවිධාන

ලේඛනගත නොවූ-වාණිජ නොවන සහ විශේෂ කාර්යයන් සඳහා සිදුවන භූ සම්පත් කැණීම සහ ප්‍රවාහනය සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, කොමසාරිස් ජනරාල්/අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔවුන් විසින් නම් කරන බලයලත් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය මෙම පරිච්ඡේදයෙන් දැක්වේ. ලේඛනගත නොවූ මෙම කාර්යයන් සඳහා පනත යටතේ කැණීම් බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍යතාවක් නොවුව ද ඉවතලන පස්, බොරළු හා රොන් මඩ අදාළ ස්ථානයෙන් පිටතට ප්‍රවාහනය කිරීමේදී පාරිසරික වශයෙන් සිදු වන ගැටලු සහගත තත්ත්වයන් පරිපාලනය කර ගැනීම සඳහා බලපත්‍ර/ අවසරපත්‍රයක් යටතේ ප්‍රවාහනය සඳහා කාර්යාංශය විසින් ඉහත සඳහන් බලධාරීන් වෙත බලතල පවරා ඇත [පනතේ 8 (1) හා 8 (2) වගන්ති].

### 5.1 මැටි කැණීම හා ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම

පාරම්පරික හා කුඩා ජීවනෝපාය කටයුතු සඳහා මැටි සම්බන්ධ කුඩා පරිමාණ බලපත්‍ර

109. ජාතික ශිල්ප සභාව විසින් නිකුත් කළ හැඳුනුම්පත මගින් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් පාරම්පරික මැටි කර්මාන්තයේ නිරත වන්නෙකු බවට තහවුරු කර ගෙන, වරකට කියුබ් 03 ක් කැණීම, සහ එක් අයෙකුට මසකට කියුබ් 06 ක් වන ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා දිස්ත්‍රික් සීමාවන් නොසලකා මැටි ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් බලපත්‍ර නිකුත් කළ යුතුය. මෙම බලපත්‍ර සඳහා කිසිදු මුදලක් අය නොකළ යුතුය. මැටි ඉවත් කිරීමෙන් පසු, කැණීම් ස්ථාන පුනරුත්ථාපනය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් විසින් පසුවිපරම් කළ යුතුය.

110. මේ යටතේ කැණීම්/ප්‍රවාහන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්කරු විසින් ආකෘතිපත්‍ර I ඉදිරිපත් කළ යුතු අතර ඒ සමඟ පහත සඳහන් ලේඛන ද ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් ආකෘතිපත්‍ර II න් දැක්වෙන බලපත්‍රය නිකුත් කළ යුතුය.
   (i) පාරම්පරික මැටි කර්මාන්තකරුවකු බවට ජාතික ශිල්ප සභාව නිකුත් කරන ලිපිය/ලේඛන,
   (ii) මැටි ලබා ගැනීමට අපේක්ෂිත ඉඩමේ ඔප්පු හා පිඹුරු පිටපත්;
   (අ) අවශ්‍ය මැටි පවතින්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැනි ආයතන විසින් කළමනාකරණය කරනු ලබන ඉඩම්, කුඩා ඇළ-දොළ හා කුඹුරු ආශ්‍රිතව නම්, ප්‍රශස්ත මට්ටමින් එම භූ සම්පත් උකහා ගත හැකි අවකාශය එම ආයතන විසින් නිෂ්කාශනය කළ යුතුය.

### 5.2 පස් හෝ බොරළු කැණීම හා ප්‍රවාහනය සඳහා ග්‍රාම නිලධාරි විසින් කුඩා පරිමාණ අවසරපත්‍ර නිකුත් කිරීම

අවසරපත්‍ර නිකුත් කිරීමේ දී ග්‍රාම නිලධාරී විසින් සැලකිය යුතු කරුණු

111. පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා බැඳුණු කාර්යයන් සඳහා පස් හෝ බොරළු කියුබ් 35 ක් නොඉක්මවන ප්‍රමාණයක් තම නීත්‍යානුකූල හිමිකාරීත්වය සහිත ඉඩමෙන් ඉවත් කිරීමට සිදුවන විට, එම ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ, හෝ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය නොසලකා ඉඩමට යාබද ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කියුබ් 02 ක් හෝ එයට අඩු ධාරිතාවකින් යුත් සුදුසු ප්‍රවාහන ක්‍රමයක් භාවිත කරමින් පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 කාලය තුළ එම අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී විසින් ප්‍රවාහන අවසරපත්‍රයක් නිකුත් කළ හැක.
   (i) ඉහතින් සඳහන් කළ පස් හෝ බොරළු කැණීම, ඉවත් කිරීම සහ ප්‍රවාහනය, පරිසරයට හා ජන ජීවිතයට හානියක් නොවන ආකාරයෙන් සිදුවන බවට හා එම නිශ්චිත හිමිකාරීත්වයක් සහිත හිමිකරු සතු

ඉඩමින් කැණීම හේතුවෙන් කිසිදු ලෙසකින් කියුබ් 35 ක් ඉක්මවා ඉදිකිරීම් අමුද්‍රව්‍ය ඉවත් කිරීමක් සිදු නොවන බවට අදාළ ග්‍රාම නිලධාරි විසින් පෞද්ගලිකවම සහතික විය යුතුය.

(ii) සති 01 ක් තුළ අවස්ථා 03 ක් සඳහා පමණක් ග්‍රාම නිලධාරී විසින් අවසරපත්‍ර නිකුත් කළ හැකි අතර ඊට වැඩි වන අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත අවසරපත්‍ර නිකුත් කළ යුතුය.

(iii) නිකුත් කරනු ලබන අවසරපත්‍ර සම්බන්ධ ලේඛනයක් ග්‍රාම නිලධාරී විසින් පවත්වාගෙන යා යුතුය. තවද, නිකුත් කරනු ලබන අවසර පත්‍රයේ පිටපතක් ග්‍රාම නිලධාරී විසින් තම ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය.

(iv) මෙම ප්‍රවාහන අවසරපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්කරුවකු විසින් ආකෘතිපත්‍ර I සමඟ, ඉඩමේ හිමිකරු සනාථ කරගැනීම සඳහා ඔප්පු පිටපත හා පිඹුරු පත, ඉඩමට ප්‍රවේශ වන මාර්ගය දක්වන සටහනක් ග්‍රාම නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. ග්‍රාම නිලධාරී/ප්‍රාදේශීය ලේකම් විසින් ආකෘතිපත්‍ර II න් දැක්වෙන අවසරපත්‍රය/බලපත්‍රය නිකුත් කළ යුතුය.

### 5.3 පස් හෝ බොරළු කැණීම හා ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම

වාණිජ නොවන කාර්යයන් සහ කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා සඳහා පස් හෝ බොරළු බලපත්‍ර නිකුත් කරන ආකාරය

112. වාණිජ නොවන කාර්යයන් සහ කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා සඳහා පස් හෝ බොරළු යන අමුද්‍රව්‍ය එක් කැණීම් ස්ථානයකින් උපරිම කියුබ් 100 නොඉක්මවන ප්‍රමාණයක් යම් ඉඩමකින් ඉවත් කිරීමට යම් අයෙකු ඉල්ලුම් කරන අවස්ථාවක එම ඉඩම පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී හෝ පරිසර නිලධාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් සිදුකර නිර්දේශ සහිත වාර්තාව තම ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම වාර්තාව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව, අවශ්‍ය නම් ප්‍රාදේශීය පරිසර කමිටුවේ නිර්දේශය ලබා ගැනීමට ප්‍රාදේශීය ලේකම් විසින් ක්‍රියා කළ යුතුය. ඒ අනුව, අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හෝ ඊට යාබද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළට පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 කාලය තුළ එම අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමි වේ. බලපත්‍ර නිකුත් කිරීමේ දී කාර්යාංශය විසින් ලබා දී ඇති බලපත්‍ර භාවිත කළ යුතුය;

(i) ඉහත විධිවිධානයට අනුකූලව ඉවත් කරනු ලබන අමුද්‍රව්‍ය අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් නොවන දිවයිනේ වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රවාහනය කිරීමට සිදු වන අවස්ථාවකදී, ඒ සඳහා කැණීම් සිදුකරන ලද ඉඩම අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින්, දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත, ප්‍රවාහන බලපත්‍ර නිකුත් කළ හැක. එලෙස නිකුත් කිරීමේදී අදාළ ව්‍යාපෘතියේ නම, සහ ගමනාන්තය ඇතුළත් කර ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට වග බලා ගත යුතුය.

(ii) එසේ වුවද, කැණීම හේතුවෙන් ජනනය වන අමුද්‍රව්‍ය, වරකට කියුබ් 100 ඉක්මවා ඉවත් කිරීමක් සිදු නොවන බවට ප්‍රාදේශීය ලේකම් විසින් වග බලා ගත යුතු අතර, මෙම පස් හා බොරළු කැණීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් පැන නගින පාරිසරික හා සමාජීය ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී කාර්යාංශය, පරිසර අධිකාරිය, පළාත් පාලන ආයතන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හෝ වෙනත් නිශ්චිතව නිෂ්කාශන ලබා ගත යුතු ආයතන ඇත්නම් එම ආයතනයන්හි අධීක්ෂණයට ලක් කළ යුතුය.

(iii) ඉහත පරමාර්ථයන් ඉටුකර ගැනීම සඳහා නිකුත් කරන අවසරපත්‍ර/බලපත්‍ර උපයෝගී කරගනිමින් නීත්‍යානුකූල අවසරයක් නොමැති කුඹුරක්, වගුරු බිමක්, රක්ෂිතයක් හෝ පරිසර සංවේදී ස්ථානයක් ගොඩ කිරීම සඳහා පස් හෝ බොරළු යොදාගැනීම හෝ අවසර ගත යුතු ස්ථානයකට නිසි අවසරයකින් තොරව බැහැර කිරීම නීති විරෝධී ක්‍රියාවන් වන බැවින් එවැනි නීති විරෝධී කාර්යයන් සිදු නොවන බවට වග බලා ගැනීම අවසරපත්‍ර හෝ බලපත්‍ර නිකුත් කරන බලධාරියාගේ පූර්ණ වගකීමකි. තවද එවන් කාර්යයන් සිදු කිරීමට ඇති ඉඩකඩ ඇහිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට අවසර පත්‍ර හෝ බලපත්‍ර නිකුත්කරන බලධාරියා විසින් කටයුතු කළ යුතුය. අපේක්ෂිත පරමාර්ථයන් උල්ලංඝණය කරන ඕනෑම

අවස්ථාවකදී නිකුත් කර ඇති බලපත්‍රය අත්හිටුවීමට බලපත්‍රය නිකුත් කළ බලධාරියා විසින් කටයුතු කළ යුතුය.

(iv) මෙම ප්‍රවාහන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්කරුවකු විසින් ආකෘතිපත්‍ර III සමඟ, ඉඩමේ හිමිකරු සනාථ කරගැනීම සඳහා ඔප්පු පිටපත හා පිඹුරු පත, ඉඩමට ප්‍රවේශ වන මාර්ගය දක්වන සටහනක් ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් ආකෘතිපත්‍ර II න් දැක්වෙන කැණීම්/ප්‍රවාහන බලපත්‍රය නිකුත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම ලැබී දින 07 ක් තුළ බලපත්‍රය නිකුත් කළ යුතුය.

(v) මේ කාර්යය යටතේ, පස් හෝ බොරළු කියුබ් 100 ඉක්මවා සිදු කරන කැණීමක දී කාර්යාංශය මඟින් අවසරපත්‍ර/බලපත්‍ර නිකුත් කළ යුතුය. ඒ සඳහා ආකෘතිපත්‍ර IV සම්පූර්ණ කර අදාළ ලියකියවිලි සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

### 5.4 කළුගල් කැණීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කිරීම

කළුගල් සම්බන්ධ කුඩා පරිමාණ බලපත්‍ර

113. එක් වරකට කියුබ් 35 ක් නොඉක්මවන වාණිජ නොවන කළුගල් කැණීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිවේ. පෞද්ගලික ළිඳක, ගෙපැළකට අවහිර වන, නායයෑමක් විය හැකි, හදිසි ආපදාවකට ලක් විය හැකි, ජන ජීවිතයට හෝ දේපළවලට තර්ජනයක් විය හැකි ස්ථානවල පිහිටි කළුගලක් මෙන්ම දිස්ත්‍රික්/ප්‍රාදේශීය සම්බන්ධීකරණ/පරිසර කමිටුව විසින් නිර්දේශිත වාණිජ නොවන කළුගලක් ඉවත් කිරීම කළ හැක. මෙහිදී ද ඉහත 112(ii) උපමානයන් සැලකිල්ලට ගැනීමට ප්‍රාදේශීය ලේකම් විසින් වග බලා ගත යුතුය. යම් අවස්ථාවකදී කාර්යාංශයේ තාක්ෂණික සහය ලබා ගත යුතු බව නිරීක්ෂණය වන්නේ නම් ප්‍රාදේශීය ලේකම් විසින් වහාම කාර්යාංශය විමසා අදාළ තාක්ෂණික උපදෙස් මත එම කාර්යය සම්බන්ධයෙන් පියවර ගත යුතුය.

### 5.5 වැලි කැණීම හා ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් කුඩා පරිමාණ බලපත්‍ර නිකුත් කිරීම

වැලි සම්බන්ධ කුඩා පරිමාණ බලපත්‍ර

114. නිවසක් ඉදිකර ගැනීම සඳහා එක් අයෙකුට ඇළ-දොළකින්, කුඩා අතු ගංගාවකින්, කුඩා ඔයකින් (අධිකරණ ක්‍රියාවකින් තහනම් කරන ලද ගංගා ද්‍රෝණි හා වෙරළ කලාපයට අයත් ප්‍රදේශ හැර) වැලි කියුබ් 02 ක් කැණීම් කර ඉවත් කර ගැනීමට අවකාශ සැලසේ. මෙම ආකාරයට මසකට වැලි කියුබ් 100 ක උපරිමයක් වාණිජ නොවන කටයුතු සඳහා තම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැණීම් කර ඉවත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කළ හැක. මෙම බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්කරුවකු විසින් ආකෘතිපත්‍ර III ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් ආකෘතිපත්‍ර II න් දැක්වෙන බලපත්‍රය නිකුත් කළ යුතුය;

(i) කැණීම් කිරීමට අවසරය ලබාදෙනු ලබන ස්ථානයේ පිහිටීම හා වර්ග ප්‍රමාණය නිශ්චිතව හඳුනාගැනීමට හැකිවන පරිදි එම අවසරය ලබා දිය යුතුය.

### 5.6 රජයේ විශේෂ ව්‍යාපෘතිවලට පස්, බොරළු සපයා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්/ බලයලත් නිලධාරීන් විසින් බලපත්‍ර නිකුත් කිරීම

ප්රාදේශීය හෝ කලාපීය රජයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් බලපත්‍ර නිකුත් කිරීම

115. රජයේ ව්‍යාපෘතියක් සඳහා පස් හෝ බොරළු සපයා ගැනීමේ දුෂ්කරතාවයක් පවතින බව යම් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවක් නිරීක්ෂණය කරන්නේ නම් එම සංවර්ධන ක්‍රියාවේ නිරත රජයේ නොවන පාර්ශවයකට ද දිස්ත්‍රික් පරිසර කමිටුව නිර්දේශ කරන කමිටු බල ප්‍රදේශය තුළ පිහිටි ස්ථානයකින් පස් හෝ බොරළු කියුබ් 100 කැණීම් බලපත්‍ර ද ඒ සඳහා ප්‍රවාහන බලපත්‍ර ද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිකුත් කළ යුතුය. මෙහිදී සාමාන්‍යයෙන් අයකරනු ලබන සියලු ගාස්තු කාර්යාංශය වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් විසින් අය කළ යුතුය;

(i) යාබද දිස්ත්‍රික් පරිසර කමිටුවකින් කෙරෙන ඉල්ලීමක් වුව මෙහිදි සලකා බැලිය හැක.

(ii) මෙම විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලබන අමුද්‍රව්‍ය අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට යාබද නොවන යම් ව්‍යාපෘතියක් සඳහා ප්‍රවාහනය කරන්නේ නම් පමණක්, ගමනාන්තය ලෙස ව්‍යාපෘතියේ

නම ඇතුළත් කර ව්‍යාපෘතිය දක්වා ප්‍රවාහනයට බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම්ට හැකි වේ. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කළ යුතු කැණීම්/ ප්‍රවාහන බලපත්‍රය, ආකෘතිපත්‍ර II ලෙස දක්වා ඇත.

සෘජු කොන්ත්‍රාත් ක්‍රමයෙන් සිදු කරන ව්‍යාපෘතිවලට පස්, බොරළු සපයා ගැනීම සඳහා නිකුත් කරන බලපත්‍ර

116. සෘජු කොන්ත්‍රාත් ක්‍රමයෙන් සිදු කරන ව්‍යාපෘතියක් සඳහා අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ පිහිටි ස්ථානයකින් පස් හෝ බොරළු සඳහා කියුබ් 100 කැණීම් බලපත්‍ර ද එම අමුද්‍රව්‍ය එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ හෝ යාබද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ප්‍රවාහනය සඳහා බලපත්‍ර ද ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කළ හැක;
(i) මෙහිදී ඉල්ලුම්කරු විය යුත්තේ අදාළ රාජ්‍ය ආයතනය හෝ පළාත් පාලන ආයතනය වේ. එම ආයතනය විසින් උක්ත ව්‍යාපෘතිය සඳහා පස් හෝ බොරළු සපයාගත යුත්තේ වාණිජ නොවන පදනමින් බව තහවුරු කර ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කළ යුතු කැණීම්/ප්‍රවාහන බලපත්‍රය, ආකෘතිපත්‍ර II ලෙස දක්වා ඇත.

වැව්, අමුණු සංවර්ධනය කිරීමට අවශ්‍ය පස්, බොරළු සපයා ගැනීම සඳහා බලයලත් නිලධාරීන් විසින් නිකුත් කරන බලපත්‍ර

117. වැව් අමුණු සංවර්ධනය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් යටතේ වැව් හා අමුණුවල බැම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පස් හා බොරළු ලබා ගැනීමේදී, කැණීමේදී සහ පිරී ඇති පස් හා රොන්මඩ ඉවත් කිරීමේදී මෙන් ම ඒවා ප්‍රවාහනයේ දී අවශ්‍ය බලපත්‍ර නිකුත් කිරීම, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, කොමසාරිස් ජනරාල්/අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔවුන් විසින් නම් කරන බලයලත් නිලධාරියෙකු විසින් කළ යුතුය;
(i) ඉහත ප්‍රධානීන් විසින් ස්වකීය බලයලත් නිලධාරීන්ගේ නම් සහ තනතුර ඇතුළත් විස්තර පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ට සහ පොලිස්පතිට පිටපතක් සහිතව කාර්යාංශයට දැන්විය යුතුය.
(ii) මෙහිදී, සෘජු කොන්ත්‍රාත් (Direct Labor) ක්‍රමයෙන් සිදු කරන ව්‍යාපෘතියක් නොවේ නම් සාමාන්‍යයෙන් අයකරනු ලබන සියලු ගාස්තු, කාර්යාංශය වෙනුවෙන් අය කළ යුතුය.
    (අ) වාණිජ පරමාර්ථයකින් තොරව කාබනික පොහොර නිෂ්පාදනය හා වගා මාධ්‍ය ලෙස යොදා ගැනීම සඳහා එක් ගොවි මහතෙකු සඳහා උපරිම කියුබ් 10 ප්‍රමාණයක රොන්මඩ හා පස් සඳහා ගබඩා හා ප්‍රවාහන බලපත්‍ර (රාජ්‍ය භාගය ගෙවීමකින් තොරව) පෙර කී බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කළ හැක.
(iii) අමුද්‍රව්‍ය ඉවත්කිරීම/කැණීමට පෙර මේ පිළිබඳ විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් මහජනතාවගේ දැන ගැනීමට ප්‍රසිද්ධ කළ යුතුය. එම තොරතුරු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අවධානයට ද යොමු කළ යුතුය.
(iv) නිකුත් කළ යුතු කැණීම්/ප්‍රවාහන බලපත්‍රය, ආකෘතිපත්‍ර II ලෙස දක්වා ඇත. මෙහිදී, ඉහත 112 හි (කියුබ් ප්‍රමාණ හැර), වේලාවන් හා ප්‍රවාහන පිළිබඳ සීමා මෙන් ම 112(iii) සීමා කිරීම් ද බල පැවත්වේ. ප්‍රවාහන සීමාවන් ලිහිල් කළ හැක්කේ දිස්ත්‍රික් ලේකම්ට පමණි. උක්ත අරමුණින් බැහැර කටයුතු සඳහා කාර්යාංශයේ බලපත්‍ර ලබා ගත යුතුය. එසේම රාජ්‍ය ආදායමට අහිතකර කිසිදු ක්‍රියාවක් සිදු නොවන බවට එම ආයතන විසින් වග බලා ගත යුතුය.

## 5.7 ලේඛනගත නොවූ අවස්ථා සම්බන්ධ පොදු උපදෙස්

බලපත්‍ර /අවසරපත්‍ර ලේඛනයක් නඩත්තු කළ යුතු බව

118. ඉහත 109 සිට 117 දක්වා ඇති පරිදි නිකුත් කරනු ලබන අවසරපත්‍ර/බලපත්‍ර සම්බන්ධයෙන්, අයදුම්පත්‍රය ලැබූ දිනය, ස්ථානීය විස්තර, අයදුම්කරුගේ නම, ලිපිනය, කියුබ් ප්‍රමාණය, නිෂ්කාශන ඉල්ලූ/ලැබුණු දින, බලපත්‍ර-අවසරපත්‍ර /තීරණය නිකුත් කළ දිනය සහ ගෙවූ ගාස්තු පිළිබඳ ලේඛනයක් සියලු බලපත්‍ර අධිකාරීන් විසින් පවත්වා ගත යුතුය;
(i) සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන ඊළඟ මස 10 දිනට පෙර, මෙම ලේඛනය, කාර්යාංශය සහ පරිසර විෂය භාර අමාත්‍යාංශයට යොමු කළ යුතුය. තවද, එම ලේඛනයේ පිටපතක් ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ද යොමු කළ යුතුය
(ii) ඉහත අවස්ථා යටතේ, කාර්යාංශය වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු සඳහා කාර්යාංශය විසින් ලබාදෙනු ලබන රිසිට්පත් භාවිත කළ යුතුය.

යම් මසකට අයකරන රාජ්‍ය භාගය හා බලපත්‍ර ගාස්තු ඊළඟ මස 10 වන දිනට ප්‍රථම කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

### 5.7.1 **ලේඛනගත නොවූ අවස්ථා සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ කාර්යභාරය**

දිස්ත්‍රික් ලේකම් විසින් කාර්යක්ෂම යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු බව

119. ලේඛනගත නොවන ස්ථානවල සිදුවන ක්‍රියා අධීක්ෂණය කිරීමටත් එම කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග, දිස්ත්‍රික් ලේකම් විසින් ගත යුතුය. එසේම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වලින්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සහ බලයලත් නිලධාරීන්ගෙන් දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කෙරෙන ඉල්ලීම් ඉටු කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය;

(i) එසේම, කණිනු ලබන හෝ ඉවත් කරනු ලබන ප්‍රමාණයන් පිළිබඳව, උක්ත මූලික උපමානයන්ට යටත්ව සීමාකිරීම් සිදු කළ හැක. අවශ්‍ය අවස්ථාවලදී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ උපදෙස් ලබා ගත යුතුය.

(ii) ඉහත අවස්ථාවල අන්‍යාකාරයකින් දක්වා නැත්නම්, ප්‍රවාහනය කරනු ලබන බොරළු, පස් හා රොන්මඩ, අදාළ ඉඩම පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් නොවන දිවයිනේ වෙනත් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ප්‍රවාහනය කිරීමට සිදු වන අවස්ථාවක දී, ඒ සඳහා කැණීම් සිදුකරන ලද ඉඩම අයත් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්/බලයලත් නිලධාරියෙකු විසින්, දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත, ප්‍රවාහන බලපත්‍ර නිකුත් කළ හැක. එලෙස නිකුත් කිරීමේදී අදාළ ව්‍යාපෘතියේ නම, සහ ගමනාන්තය ඇතුළත් කර ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීමට වග බලා ගත යුතුය.

# 06. සයවන පරිච්ඡේදය :

# බලපත්‍ර/නිෂ්කාශන ගාස්තු, වෙනත් ගාස්තු අය කිරීම, ආපසු ගෙවීම සහ ගිණුම් ගත කිරීම පිළිබඳ ඒකීය ක්‍රමවේදය

*ගාස්තු අයකිරීම සම්බන්ධව පනතේ ඇති නීතිමය විධිවිධාන*

120. සෑම අයදුම්පත්‍රයක්ම නියමිත ආකෘතියේ නියමිත විස්තර ඇතුළත් කොට නියමිත ලේඛන ද සමඟ කාර්යාංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමඟ නියමිත ගාස්තුව ද අයදුම්කරු විසින් ගෙවිය යුතුය (43 වන වගන්තිය).
    (i) කාර්යාංශය විසින් සැකසුම්/අත්තිකාරම් ගාස්තු අයකරනු ලබන්නේ නිෂ්කාශන කැඳවීමේ දී එකී ආයතනවලට දැරීමට සිදු වන මූලික පිරිවැය ඇතුළත් වන පරිදිය.

### 6.1 ඒකීය ගාස්තු ක්‍රමය සහ නිෂ්කාශන ගාස්තු

*ඒකීය ගාස්තු ක්‍රමය සහ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නිෂ්කාශන ගාස්තු*

121. කැණීම් බලපත්‍රය ලබාදීමේ ක්‍රියාවලියේදී, කාර්යාංශය සහ උපලේඛන 01 හි සඳහන් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවලින් ඉල්ලුම්කරන නිෂ්කාශන සඳහා අවශ්‍ය වන ගාස්තු අයදුම්කරුවන් වෙතින් අය කිරීමේ "ඒකීය ගාස්තු ක්‍රමය" හි කේන්ද්‍රීය ආයතනය ලෙස කාර්යාංශය ක්‍රියා කළ යුතුය.
122. ගාස්තු අය කිරීමේ ක්‍රමවේදය භාණ්ඩාගාරයේ මඟපෙන්වීම යටතේ කාර්යාංශය, පරිසර විෂය භාර අමාත්‍යාංශය සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතුය.
123. කැණීම් බලපත්‍රය ලබා දෙන තෙක් අවශ්‍ය නිෂ්කාශන සහ බලපත්‍ර සඳහා අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙනුවෙන් අය විය යුතු සියලු ගාස්තු කාර්යාංශය විසින් රැස්කර පරිසර විෂය භාර අමාත්‍යාංශය යටතේ ඇති නිල බැංකු ගිණුමෙහි දෛනිකව තැන්පත් කළ යුතුය.
124. අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් ඇමුණුම් පරිච්ඡේදයෙහි "උපලේඛන 04: ගාස්තු වර්ග, ප්‍රමාණ සහ ආරක්ෂිත තැන්පතු" හි දක්වා ඇති ගාස්තු අය කළ යුතුය.

*ගාස්තු වර්ග, ප්‍රමාණ සහ ආරක්ෂිත තැන්පතු සහ රාජ්‍ය ආයතන විසින් ගාස්තු සංශෝධනය නොකළ යුතු බව*

125. කිසිදු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් විසින් දැනට අය නොකරනු ලබන කිසිදු ගාස්තුවක් මෙම සංග්‍රහය නිකුත් කිරීමෙන් පසු අය නොකළ යුතුය. ගාස්තු වැඩි වීමක් නොවිය යුතුය. ගාස්තු සංශෝධනය නොකළ යුතුය. ගාස්තු පරාස ඇති විට, පෙර පැවති අවම ගාස්තු මට්ටම හෝ ඊට අඩු මට්ටමේ ගාස්තු පිහිටුවිය යුතුය. තවද, නව ගාස්තුව, පෙර ගාස්තුවට වඩා වැඩි වුවහොත් පෙර ගාස්තුව අය කළ යුතුය.
126. උපලේඛන 01 හි සඳහන් නොවන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් වෙතින් යම් සේවාලාභියෙකු මෙම විෂය පථය යටතේ යම් සේවාවක් අපේක්ෂා කරන විට, එම ආයතන විසින් එම කාර්යය සිදු නොකළ යුතු යැයි අදහස් නොකෙරේ. එවැනි අවස්ථාවක දැනටමත් අනුමත වී ඇති ගාස්තුවක් අය කළ හැකි අතර, එය අය කළ වහාම ව්‍යවස්ථාපිත ආයතන සඳහන් ලේඛනයට තම ආයතනය ඇතුළත් කරන ලෙස පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ට ද පිටපත් සහිතව කාර්යාංශය දැනුවත් කළ යුතු අතර එම ගාස්තුව ඒකීය ගාස්තු ක්‍රමයට ඇතුළත් කර ගැනීමට භාණ්ඩාගාර ලේකම්ගෙන් ඉල්ලා සිටීමට අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතුය.
127. ඒකීය ගාස්තු ක්‍රමයේ දී බලපත්‍ර/නිෂ්කාශනවල වලංගු කාලය වසර 03 ක් වන විට, කාර්යාංශය විසින් කැණීම් බලපත්‍රකරුගෙන් රාජ්‍ය භාගය, බලපත්‍ර ගාස්තු, ක්ෂේත්‍ර ගාස්තු හා නිෂ්කාශන ගාස්තු වසර 03 ක් සඳහා එකවර හෝ එක් එක් වසර සඳහා වෙන් වෙන් වශයෙන් අය කර ගනු ඇත;
    (i) එසේම මෙම ගාස්තු අත්තිකාරම් ලෙස ද අයකර ගත හැකි අතර වර්ෂ තුන (03) සඳහා ම එකවර අයකරගනු නොලබන්නේ නම් එක් එක් වර්ෂය ආරම්භ වීමට මාස 01 කට පෙර එකී ගාස්තු අයකර ගත යුතුය.
128. උපලේඛන 04 හි සඳහන් ගාස්තු සහ වාර්ෂික ගාස්තු ආකාර පැහැදිළි කිරීම් සහිතව අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ප්‍රධානීන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සේවාලාභීන් වෙත දැන්වීමට කාර්යාංශය විසින් කටයුතු කළ යුතුය.

#### 6.1.1 පළාත් පාලන ආයතන විසින් අය කරන බදු සහ බලපත්‍ර ගාස්තු

129. මහනගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත යටතේ පළාත් පාලන ආයතන විසින් කර්මාන්ත බදු, ව්‍යාපාරික බදු සහ

පළාත් පාලන ආයතන විසින් අය කරන බදු සහ බලපත්‍ර ගාස්තු

වෙළඳ බලපත්‍ර ගාස්තු අය කිරීම සම්බන්ධව එම පනත්වල සීමාවන් දක්වා තිබේ. අමාත්‍ය මණ්ඩලය ගෙන ඇති තීරණය අනුව පළාත් පාළන ආයතන පනත්වල සඳහන් ගාස්තු සීමාවන් තුළ දක්වා ඇති ගාස්තු පමණක් අය කිරීමට පළාත් පාලන ආයතන විසින් ක්‍රියා කරනු ඇත (2021.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක: 21/1766/301/022).

130. ඛනිජ කැණීම්වලට අදාළව, කර්මාන්ත බදු හෝ ව්‍යාපාර බදු යන දෙවර්ගයෙන් එක් වර්ගයක් ද සහ නිර්ණායක තුළට ඇතුළත් වන්නේ නම් පමණක් වෙළඳ බලපත්‍ර ගාස්තුව අය කළ හැක. ඒ හැර මෙම විෂය යටතේ දැනට අය කරමින් පවතින අනෙකුත් සියලු ගාස්තු (මාර්ග නඩත්තු ගාස්තු හැර) අය කිරීම අත්හිටුවිය යුතුය.

131. අදාළ පළාත් පාලන පනත්වල සඳහන් ගාස්තු සීමාවන් උපලේඛන 04 හි දැක්වෙන අතර එම ගාස්තු පමණක් අය කිරීමට පළාත් පාලන ආයතන ක්‍රියා කළ යුතුය.

### 6.1.2 රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් අය කරන ගාස්තු

රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් අය කරනු ලබන ගාස්තු

132. රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් අය කරනු ලබන කියුබ් මත පදනම්වූ රජයේ ගාස්තු, සංවර්ධන බලපත්‍ර ගාස්තු, කැලෑ නිෂ්පාදන එකතු කිරීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් ගාස්තු, තැන්පතු ගාස්තු, ආයතනික හෝ කවර හෝ අතිරේක නිෂ්කාශන ගාස්තු අයකර ගැනීම එම ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙනුවෙන් කාර්යාංශය විසින්ම සිදු කළ යුතුය;

(i) මෙම ගාස්තු, වාර්ෂිකව හෝ මාසිකව කැණීම්කරුගෙන් අය කර එසේ අය කර ගන්නා වාරික/ගාස්තු/කියුබ් ප්‍රමාණයන් පිළිබඳව නිර්ණය කර අදාළ ව්‍යවස්ථාපිත ආයතන වෙත කාර්යාංශය විසින් දැනුම් දිය යුතුය.

(ii) කාර්යාංශය විසින් රාජ්‍ය භාග අය කිරීම, අදාළ ඛනිජයේ නිෂ්පාදිත පරිමාව පදනම් කොට සිදු කෙරුණ ද, රජයේ ඉඩම්වල ඛනිජ ඉවත් කිරීමට අදාළව ගාස්තු අයකිරීමේ දී, අදාළ ඛනිජය ඉවත් කිරීමට බඳුන් වූ හිස් අවකාශ රහිත වූ ඝණ පරිමාව (Insitu-Solid Mineral Volume) මත පිහිටා ගාස්තු ගණනය කළ යුතුය.

බදු ගාස්තු තක්සේරු කිරීම

133. අමුද්‍රව්‍ය ඉවත් කිරීම වෙනුවෙන් රජයේ ගාස්තුව/සංවර්ධන බලපත්‍ර ගාස්තු/රජයේ සේවා ගාස්තුවක් (රාජ්‍ය භාගය නොවන) අය කරන අවස්ථාවල, රජයේ ඉඩමක සිදු කරන කැණීමක දී එම කැණීමට භාජනය වන භූමි ප්‍රමාණය සඳහා ඉඩම් පරිහරණ බදු අය නොකළ යුතුය;

(i) එහෙත්, කැණීමෙන් පසු ඊට සමගාමීව යම් ඉඩම් පරිහරණයක් වේ නම් එම පරිහරණය සඳහා බදු අය කිරීමට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම උපලේඛනයට අදාළව හඳුන්වා දී ඇති ගාස්තු චක්‍රය භාවිත කළ යුතුය [රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2021.10.31 දිනට පෙර මෙම බදු දැන්විය යුතුය (තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ)].

තැන්පතු මුදල්

134. රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පුනරුත්ථාපන හෝ සංරක්ෂණ කටයුතු සඳහා තැන්පතු මුදලක් රඳවා ගත හැක. එවැනි ගාස්තු ද උපලේඛන 04 හි දැක්වේ.

### 6.1.3 ඒකීය ගාස්තු ක්‍රමයට අයත් නොවන ගාස්තු

ඒකීය ගාස්තු ක්‍රමයට අයත් නොවන ගාස්තු

135. ඒකීය ගාස්තු ක්‍රමයට, කැණීම් බලපත්‍රය ලබාදුන් පසු එම ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනත් නිෂ්කාශනවලට අදාළ නොවේ. එම ගාස්තු අදාළ ආයතන විසින් පෙර පරිදිම අය කළ හැක. ඒ අනුව, ඉඩම් පරිහරණ බදු, පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර ගාස්තුව ද, පළාත් පාලන ආයතනවලින් නිකුත් කරන වෙළඳ, කර්මාන්ත හෝ ව්‍යාපාර බලපත්‍ර සඳහා ගාස්තු, සහ එම පළාත් පාලන ආයතන සතු මාර්ග සඳහා තැන්පතු ගාස්තු ද අය කිරීම, එම ආයතන විසින්ම සිදු කළ යුතුය. පුපුරණ ද්‍රව්‍ය ලබා ගැනීමේදී ද ඒ සඳහා අවශ්‍ය මුදල් අවස්ථානුකූලව කැණීම්කරුගෙන් අය කර ගත යුතුය. එසේම, ‘‘ලේඛනගත නොවන’’ ස්ථානවල සිදුවන ක්‍රියාවන් හා සම්බන්ධ බලපත්‍ර/නිෂ්කාශන සඳහා ද "ඒකීය ගාස්තු ක්‍රමවේදය" අදාළ නොවේ.

### 6.1.4 පුනරුත්ථාපන හෝ ප්‍රතිස්ථාපන කටයුතු සඳහා ආරක්ෂිත තැන්පතු

මාර්ග ප්‍රතිස්ථාපනය

136. මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කළුගල්, පස්, බොරළු හා වැලි සැපයීම සිදුකරන මාර්ග, එම අධිකාරියේ වියදමින් නඩත්තු කළ යුතු අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලය තුළ දී මාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

137. රජයේ ඉඩම් කළමනාකරණය කරන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් පුනරුත්ථාපන, නඩත්තු හෝ සංරක්ෂණ කටයුතු සඳහා තැන්පතු මුදලක් රඳවාගෙන ඇති අවස්ථාවල, කැණීම අවසන් වූ දින සිට දින 45 ක් තුළ අදාළ ආයතන විසින්, ආපසු ගෙවිය යුතු තැන්පතු ප්‍රමාණය ගණනය කර කාර්යාංශය වෙත දැන්විය යුතුය.

පළාත් පාලන ආයතන සතු මාර්ගවල මාර්ග ප්‍රතිස්ථාපන මුදල මහාමාර්ග අමාත්‍යාංශය විසින් තීරණය කිරීම

138. අදාළ පළාත් පාලන පනත්වල සඳහන් ගාස්තු:

(i) පළාත් පාලන ආයතන සතු මාර්ගවල කළුගල්, පස්, බොරළු හා වැලි ප්‍රවාහනය කිරීම වෙනුවෙන් ප්‍රවාහනය කරන දුර සැලකිල්ලට ගෙන නඩත්තු මුදලක් අය කළ හැක. එම මුදල මහාමාර්ග අමාත්‍යාංශය විසින් තීරණය කර ඒ ඒ මාර්ගවලට අදාළ වන පරිදි 2021.10.31 දිනට පෙර දැන්විය යුතුය. ඒ අනුව, පළාත් පාලන ආයතන විසින් මාර්ග සඳහා අයකරන නඩත්තු මුදල ලෙස මහාමාර්ග අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන ගාස්තුව පමණක් අය කළ යුතුය. නඩත්තුවක් අවශ්‍ය නොවේ නම් හෝ නඩත්තුවෙන් පසු යම් මුදලක් ඉතිරි වේ නම් එය නැවත ගෙවිය යුතුය. කෙසේ වෙතත් දැනටමත් මෙවැනි මුදල් අය නොකරන පළාත් පාලන ආයතන විසින් එවැනි මුදල් අය කිරීමක් අපේක්ෂා නොකෙරේ.

පොදු තැන්පතු භාවිත කර කැණීම් කළ ඉඩම් පුනරුත්ථාපනය කිරීම

139. කැණීම් බලපත්‍රකරු විසින් ඉදිරිපත් කරන ලද කැණීම් භූමි පුනරුත්ථාපන සැලසුම අනුව නියමිත දිනට පෙර එම කටයුතු නොකරන හෝ එවැනි සැලසුමක් ඉදිරිපත් කිරීමක් අත්‍යවශ්‍ය නොවන එහෙත් කැණීම් ස්ථාන පුනරුත්ථාපනය කළ යුතු විට, එම මුදල රඳවා ගන්නා බලධාරීන් විසින් රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම පුනරුත්ථාපන කාර්යය සිදු කළ යුතුය;

(i) බලපත්‍ර/නිෂ්කාශනවල වලංගු කාලය වසර 01ක් වන විට රජයේ ඉඩම් කළමනාකරණය කරනු ලබන රාජ්‍ය ආයතන විසින් ආරක්ෂිත තැන්පතු සඳහා ඉහත ක්‍රියාවලිය අනුගමනය කළ හැක. වලංගු කාලය වසර 03ක් වන විට පුනරුත්ථාපන කටයුතු කෙසේ සිදු විය යුතු දැයි පරිසර අධිකාරිය විසින් පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට ලක් කරන ලද ව්‍යාපෘතීන් සඳහා පරිසර අධිකාරිය විසින් ද වෙනත් අවස්ථාවලදී කාර්යාංශය විසින් ද එම රජයේ ඉඩම කළමනාකරණය කරනු ලබන ආයතන වෙත අදාළ උපදෙස් ලබා දිය යුතුය.

### 6.1.5 බලපත්‍ර ගාස්තු/ රාජ්‍ය භාගය

රාජ්‍ය භාග අත්තිකාරම්

140. අය කරනු ලබන රාජ්‍ය භාගය ගෙවීම පැහැර හරින අවස්ථාවල එම මුදල් පියවා ගැනීම සඳහා අයදුම්පත්‍ර භාර ගනු ලබන අවස්ථාවේදීම රාජ්‍ය භාග අත්තිකාරම් අය කර ගත යුතුය. ඒ අනුව, බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම, රාජ්‍ය භාග අත්තිකාරම් අය කර යුතු අතර, අත්තිකාරම් මුදලේ ප්‍රමාණය කාර්යාංශය විසින් තීරණය කළ යුතුය. කාර්යාංශය විසින් රාජ්‍ය භාග අත්තිකාරම් ලේඛනය ද පවත්වාගෙන යා යුතුය (නියෝග 33).

රාජ්‍ය භාග

141. ශිල්පීය කැණීම් "අ" හා "ආ" කාණ්ඩ හා කාර්මික කැණීම් "ඇ" හා "ඈ" කාණ්ඩ යටතේ කණිනු ලබන ඛනිජ සඳහා යම් වසරකට අදාළ රාජ්‍ය භාගය ඊළඟ වසරේ අප්‍රේල් මස 20 වන දිනට ප්‍රථම ගෙවිය යුතුය. කාර්මික කැණීම් "අ, ආ" හා වෙළඳ බලපත්‍ර "අ, ආ හා ඇ" සඳහා යම් වර්ෂයක යම් කාර්තුවක් සඳහා අදාළ රාජ්‍ය භාගය ඊළඟ කාර්තුවේ 30 දිනට ප්‍රථම අයකර ගත යුතුය.

රාජ්‍ය භාග නොගෙවීම මත දඩ

142. නියමිත දිනට ප්‍රථම රාජ්‍ය භාග ගාස්තු ගෙවීමට අපොහොසත් වන බලපත්‍රලාභීන් 20% ක දඩමුදලක් ගෙවීමට යටත් කළ යුතුය. විකුණුම්වලින් හෝ පතල් නිෂ්පාදන ප්‍රමාණය පිළිබඳ නිශ්චය කරන ලද වෙළඳ වටිනාකමට අනුව අයකරන රාජ්‍ය භාගය, එම වටිනාකම් වල ප්‍රතිශතයන්, ඇමුණුම් පරිච්ඡේදයෙහි වගුව 02න් දැක්වේ [නියෝග 33 (4)].

### 6.2 ආපසු ගෙවීම සහ ගිණුම් ගත කිරීම

ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත ගාස්තු බෙදා හැරීම

143. භාණ්ඩාගාරය විසින් ආදායම් ශීර්ෂයක් ලබා දී ඇති සියලු රාජ්‍ය ආයතන වෙත සෑම මසක් සඳහාම අයවිය යුතු ගාස්තු, පරිසර අමාත්‍යාංශය විසින් ඊලඟ මස 10 වන දිනට පෙර බැර කළ යුතුය. මෙහිදී චෙක්පත් හෝ හරස් සටහන් (Cross Entries) මගින්, අදාළ මුදල ප්‍රේෂණය ද භාණ්ඩාගාරය විසින් ආදායම් ශීර්ෂයක් ලබා දී නැති ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වෙත චෙක්පත් මගින් ද මෙම මුදල් ප්‍රේෂණය කළ යුතුය;
   (i) එසේම කාර්යාංශය වෙනුවෙන් ගාස්තු අයකරනු ලබන ආයතන වෙත පරිපාලන වියදම් කාර්යාංශය විසින් ලබා දිය යුතුය.

144. පරිසර විෂය භාර අමාත්‍යාංශයේ නිල බැංකු ගිණුමට බැර වන මුදල් හා එකී මුදල් ආපසු ගෙවීම් කිරීම/වර්ගීකරණය කිරීම වෙනුවෙන් භාවිත කරනු ලබන ආකෘතිය අදාළ ව්‍යවස්ථාපිත ආයතන විසින් පරිසර විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාවය මත කළ යුතුය;
   (i) ස්වකීය ආයතන වෙත අයවිය යුතු ගාස්තු/අයකිරීම්, නියමිත පරිදි ලැබී ඇත්දැයි කාර්යාංශය සහ පරිසර විෂය භාර අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය වෙමින් තහවුරු කර ගැනීමට අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

# 07.සත්වන පරිච්ඡේදය:

## පාරිසරික ගැටලු, මහජන විරෝධතා කළමනාකරණය, අධීක්ෂණය සහ කෙටි-කාලීන ක්‍රියාමාර්ග

### 7.1 පාරිසරික ගැටලු අවම කිරීම හා නිරාකරණය කිරීම

කැණීම් භූමි තෝරා ගැනීමේදී පාරිසරික ගැටලු අවම කර ගැනීම

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය බොහෝ සම්පත් පරිසරයෙන් ලබා ගනී. එම නිසා රටේ සංවර්ධනය ස්ථිරසාරව පවත්වාගැනීම සඳහා පරිසරය සුරැකීම හා වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. සංවර්ධන ව්‍යාපෘති හරහා පරිසරයට ඇති විය හැකි බලපෑම් හඳුනා ගැනීම හා පූරෝකථනය කිරීම මෙන්ම අහිතකර බලපෑම් අවම කිරීම සඳහා පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය හා මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යයනය යොදාගනු ලැබේ.

පරිසරය නඩත්තු කිරීම

145. කැණීම් ක්‍රියාවලින් සිදුවන පරිසර බලපෑම් නිසා පාරිසරික මෙන්ම සමාජීය ගැටලු ද රාශියක් ඇති වන බව පැහැදිලිව නිරීක්ෂණය වේ. එම ගැටලු අවම කිරීම සඳහා පහත පරිදි කටයුතු කළ යුතුය.

(i) කැණීම් භූමි තෝරා ගැනීමේ දී ප්‍රදේශයේ භූමියේ ස්වභාවය, ස්ථායිතාවය, ජෛව විවිධත්වය, භූගත ජල මට්ටම වැනි කරුණු පිළිබඳව සැලකිලිමත් විය යුතු අතර ඉතා සංවේදි පරිසර සහිත ප්‍රදේශ කැණීම් සඳහා භාවිත නොකළ යුතුය.

(ii) කැණීම් සඳහා විශාල භූමි ප්‍රදේශ භාවිතා කරන අවස්ථාවලදී සමස්ථ භූමි ප්‍රදේශය සඳහාම නිසි පරිදි පාරිසරික අධ්‍යයනයක් සිදුකළ යුතුය. එමෙන්ම පුනරුත්ථාපන සැලසුම ද සමස්ථ ප්‍රදේශයටම සරිලන ලෙස සකස් කිරීමට ව්‍යාපෘති යෝජක ආයතන කටයුතු කළ යුතුය.

(iii) කැණීම් ක්‍රියාවලිය සඳහා ශාක ඉවත් කරන භූමි ප්‍රදේශවල ඒ වෙනුවට නැවත රුක් රෝපණය කිරීම අනිවාර්යයෙන් සිදු කළ යුතුය. රුක් රෝපණය, එම කැණීම් භූමිය තුළම සිදු කළ නොහැකි අවස්ථාවල ඒ වෙනුවට වෙනත් ප්‍රදේශයක රුක් රෝපණය කර ඒවා නඩත්තු කිරීමට කැණීම්කරුවන් කටයුතු කළ යුතුය. ඉවත් කරන සෑම ගසක් වෙනුවෙන්ම රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කර නඩත්තු කිරීම කැණීම්කරුවන් හෝ ව්‍යාපෘති යෝජක ආයතන විසින් කළ යුතු අතර එය නිසි පරිදි ඉටුවන්නේදැයි අධීක්ෂණය කිරීම කාර්යාංශය මෙන්ම ඉඩම් කළමනාකාරිත්වය හිමි ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ද වගකීමකින් යුතුව සිදු කළ යුතුය.

(iv) රුක් රෝපණය කර පුනරුත්ථාපනය කළ නොහැකි කැණීම් භූමි වෙනත් විකල්ප ඵලදායී කටයුතු සඳහා යොදා ගතයුතුය: උදා: ජලාශ ඉදිකිරීම, සූර්ය තාප පැනල ස්ථාපනය, පාවෙන පරිසර හිතකාමී හෝටල් සංකීර්ණ. බොහෝ ව්‍යාපෘති යෝජකයින් කැණීම් කටයුතු අවසානයේ පුනරුත්ථාපන කටයුතු සිදු නොකරන අවස්ථා බහුලව දක්නට ලැබෙන බැවින් මේ සම්බන්ධයෙන් නිසි පසුවිපරම් සිදුකිරීම කාර්යාංශය විසින් සිදුකළ යුතුය. කැණීම් කටයුතුවලට සමගාමීව පුනරුත්ථාපන කටයුතු සිදුකිරීමට ව්‍යාපෘති යෝජකයින් මෙහෙයවීම කාර්යාංශයේ වගකීම වේ.

ගං ඉවුරු සංරක්ෂණය කිරීම

(v) ගංගා ඉවුරු සංරක්ෂණය කරමින් තිරසරව වැලි ඉවත් කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වාදීම කාර්යාංශය විසින් සිදු කළ යුතු අතර කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "හරිත වැලි තොටුපළ" (උපලේඛන 05 බලන්න) වැඩසටහන නැවත බල ගැන්වීම සහ එය ක්‍රියාත්මකවීමේ දී ඇති වූ අඩුපාඩුකම් මඟහරවා ගැනීම සිදු කළ යුතුය.

### 7.2 මහා පරිමාණ රජයේ සංවර්ධන ව්‍යාපෘති සහ භූ සම්පත් භාවිතය

146. රජය මගින් ක්‍රියාවේ යොදවනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතීන්හි ශක්‍යතා අධ්‍යයනයන්හි දී ඒ සඳහා අවශ්‍ය වන කළුගල්, වැලි, පස් හා බොරළු කැණීම් සඳහා සුදුසු ස්ථාන ව්‍යාපෘති යෝජක විසින් පැහැදිලිව හඳුනා ගත යුතුව ඇති අතර එය ව්‍යාපෘති යෝජනාවට ද ඇතුළත් කර ජාතික

ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබාගත යුතුය;

(i) ප්‍රසම්පාදන කටයුතු සඳහා ලංසු කැඳවීමේ පත්‍රිකාව ඉදිරිපත් කරන දින වන විට මෙම භූ සම්පත් ලබා ගත හැකි ස්ථාන පිළිබඳව කාර්යාංශය සමඟ එකඟතාවකට පැමිණ, රජයේ ව්‍යාපෘති යෝජක සැහීමට පත්ව සිටිය යුතුය.

147. සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට පෙර එම කැණීම් ස්ථානවල ඇති ඛනිජ සම්පත් නිසි තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් ඉවත්කර ගැනීමට අවශ්‍ය ක්‍රමවේද සලසාගැනීම සඳහා ව්‍යාපෘති යෝජක හෝ ව්‍යාපෘති යෝජක ආයතනය විසින් කාර්යාංශයෙන් උපදෙස් ලබා ගත යුතුය;

(i) ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වන ව්‍යාපෘති යෝජනාවල මෙවැනි තත්ත්වයක් නිරීක්ෂණය වන්නේ නම් කාර්යාංශය සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

148. භූ සම්පත සම්පූර්ණයෙන්ම කැණීම් කර නොමැති ස්ථාන තිබියදී නව ස්ථාන සඳහා කැණීම් අවසර ලබා දීමෙන් පරිසරයට වන හානිය අවම කිරීම සඳහා, කැණීම් කිරීම අතරමග නවතා ඇති ස්ථානවල ඉතිරිව ඇති භූ සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග කාර්යාංශය විසින් ගත යුතුය.

### 7.3 මහජන විරෝධතා කළමනාකරණය කිරීම

කැණීම් කටයුතු සිදුවන බොහෝ ස්ථාන සම්බන්ධයෙන් හේතු සහිතව හෝ රහිතව මහජන විරෝධතා ඇතිවීම මෑත කාලයේ බොහෝ විට දක්නට ලැබෙන සංසිද්ධියකි.

මහජන විරෝධතා කළමනාකරණය කිරීම

149. රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දී මහජනයාට පීඩාවක් නොවන පරිදි හා ආරක්ෂාකාරීව එම කැණීම් කටයුතු සිදුකිරීමට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නන් වග බලා ගත යුතුය.

නීත්‍යානුකූල බලපත්‍ර සහිත කැණීම් භූමිවලට එරෙහිව ලැබෙන මහජන පැමිණිලි කළමනාකරණය

150. නීත්‍යානුකූල බලපත්‍රයක් සහිත කැණීම් කටයුත්තක් සම්බන්ධයෙන් යම් මහජන නොසන්සුන්තාවයක් ඇති වන විටකදී ප්‍රාදේශීය ලේකම් විසින් කාර්යාංශය, පරිසර අධිකාරිය සහ පළාත් පාලන ආයතනයක කොමසාරිස්වරයෙකු හෝ ලේකම්වරයෙකු ද ඇතුළු පාර්ශවකාර ආයතනවල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පත් කර එම කමිටුව සමඟ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කළ යුතුය. අනතුරුව එම කමිටුව විසින් ලබා දෙන නිර්දේශයන් අනුව ක්‍රියා කළ යුතුය. එහිදී කාර්යාංශය හා අනෙකුත් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන විසින් නිකුත්කර ඇති නිර්දේශ උල්ලංඝණය කර නොමැති බවට කරුණු තහවුරු වන්නේ නම් නිකුත් කර ඇති බලපත්‍ර අත්හිටුවීම අවශ්‍ය නොවේ. නිර්දේශ උල්ලංඝණය කර නොමැති අවස්ථාවක වුවත් පාරිසරිකව යම් බලපෑමක් එල්ලවී ඇති බව නිරීක්ෂණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් මෙම කමිටුව ක්‍රියා කළ යුතුය.

151. එම කමිටුවට තීරණයක් ගත නොහැකි අවස්ථාවක එම පරීක්ෂණ වාර්තාව දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුවට ඉදිරිපත් කළ යුතුය. එම කමිටුවට ද තීරණයක් ගත නොහැකි අවස්ථාවකදී පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති ජාතික අධීක්ෂණ කමිටුව වෙත එම වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

### 7.4 භූ සම්පත් කැණීම් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව

කැණීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන බාධා ගැටලු නිරාකරණය කිරීම සඳහාත් එම ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහාත් භූ සම්පත් කැණීම පිළිබඳ ජාතික/දිස්ත්‍රික් අධීක්ෂණ කමිටු පිහිටවනු ලැබේ.

භූ සම්පත් කැණීම් පිළිබඳ දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුව පිහිටුවීම

152. දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සහ අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල නියෝජිතයන් ඇතුළත්ව "භූ සම්පත් කැණීම් පිළිබඳ දිස්ත්‍රික් අධීක්ෂණ" කමිටු පිහිටු විය යුතුය. කාර්යාංශයේ දිස්ත්‍රික් කැණීම් ඉංජිනේරු විසින් කමිටුව සම්බන්ධීකරණය කළ යුතු අතර, මෙම කමිටුව මසකට වරක් රැස්විය යුතුය. දිස්ත්‍රික් අධීක්ෂණ කමිටුව විසින් නිරාකරණය කර ගැනීමට නොහැකි කරුණු ඇත්නම් ඒවා

පරිසර විෂය භාර අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ජාතික අධීක්ෂණ කමිටුව වෙත යොමු කළ යුතුය.

හූ සම්පත් කැණීම් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව පිහිටුවීම

153. පරිසර විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ස්වදේශ කටයුතු, පළාත් පාලන, මහාමාර්ග, වාරිමාර්ග, ඉඩම්, වනජීවී හා වන සම්පත් සහ මුදල් යන විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් නම් කරන නියෝජිතයින්ගෙන් සහ උපලේඛන 01 හි සඳහන් ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනවල ප්‍රධානීන්/නියෝජිතයින්ගෙන් "භූ සම්පත් කැණීම් පිළිබඳ ජාතික අධීක්ෂණ කමිටුව" සමන්විත විය යුතුය. මෙම කමිටුව මාස 03 කට වරක් රැස්විය යුතුය;
   (i) වගන්ති 47 දැක්වෙන අයදුම්පත් විස්තර ලේඛනය පරිසර විෂය භාර අමාත්‍යාංශය වෙත ලද පසු ජාතික අධීක්ෂණ කමිටුව විසින් සෑම කාර්තුවක් අවසානයේදීම රැස්වී ලේඛනය සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචනය කළ යුතුය. මෙහිදී තවදුරටත් නොවිසඳුනු ගැටලු ඇත්නම් ඒ සම්බන්ධයෙන් සුදුසු පියවර ගැනීමට කටයුතු කළ යුතුය.
   (ii) අන්තර්කාලීන විධිවිධානයක් ලෙස, ප්‍රථම කාර්තුව තුළ මාසිකව රැස්විය යුතුය. එහිදී, අයදුම්පත්‍ර විස්තර ලේඛනයෙහි අතුරු ලේඛනයක් කාර්යාංශයෙන් ලබා ගත යුතුය.

කැණීම්/ ප්‍රවාහනය සම්බන්ධ පොලීසිය සතු බලතල

154. වැලි, පස් හා බොරළු කැණීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් ලබාදී ඇති බලපත්‍ර සම්බන්ධයෙන් අදාළ එක් එක් බල ප්‍රදේශවල පොලිස් ස්ථාන දැනුවත් කිරීම සහ අක්‍රමිකතා වැළැක්වීම සඳහා සියලුම පොලිස් ස්ථානවල සහයෝගය ලබා ගැනීමට බලපත්‍ර නිකුත් කරනු ලබන නිලධාරීන් විසින් වග බලා ගත යුතුය. මේ සඳහා පොලිස් නිලධාරින් දැනුවත් කිරීමේ වැඩමුළු/සම්මන්ත්‍රණ යනාදිය පැවැත්වීම, ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කළ යුතුය.

155. විශේෂයෙන් පස් හා බොරළු ප්‍රවාහනයේ දී නියමිත අවසර පත්‍ර හා බලපත්‍ර තිබේදැයි පොලීසිය විසින් නිරන්තරවම පරීක්ෂාවට ලක් කළ යුතුය.

### 7.5 කෙටි කාලීන ක්‍රියාමාර්ග

<u>පාරිභෝගික හිතකාමී සේවා ඒකක -"මාර්ගගත එක් සේවා කවුළුව" පිහිටුවීම</u>

භූ සම්පත් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලියේ දී අයදුම්කරුවන්හට බොහෝ ගැටළුවලට මුහුණපෑමට සිදුවන බව නිරීක්ෂණය කරන ලදි. ඒ අනුව, අයදුම්කරුවන් සඳහා පහසුවෙන් හා කෙටි කාලයකින් බලපත්‍ර ලබා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය යාවත්කාලීන කරනු ඇත.

බලපත්‍ර ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු කිරීම

156. භූ සම්පත් සඳහා බලපත්‍ර ලබාදීමේ දී එම ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදුකිරීම සඳහා පාරිභෝගික හිතකාමී සේවා ඒකක හා "මාර්ගගත එක් සේවා කවුළුව (Online One Stop Shop)" මාස 04ක් ඇතුළත ස්ථාපනය කිරීම, කාර්යාංශය විසින් සිදු කළ යුතුය. අයදුම්පත්‍ර නිකුත් කිරීම හා බලපත්‍ර නිකුත් කිරීම ආදි කටයුතු සඳහා පරිගණක තාක්ෂණය හා මාර්ගගත ක්‍රමය (Online System) යොදා ගත යුතුය.

157. සේවාලාභීන්ට මාර්ගගත ක්‍රමයට ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කළ හැකි පරිදි සහ අයදුම්පත්‍රය සම්බන්ධ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මාර්ගගතව දැන ගත හැකි පරිදි මෙම මාර්ගගත ක්‍රමය මුළුමනින්ම සේවාලාභී-හිතකාමී අයුරින් සංවිධානය කළ යුතුය.

158. මෙම "මාර්ගගත එක් සේවා කවුළුව (Online One Stop Shop)" ක්‍රියාත්මක වීමත් සමඟ, දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින් සහ කාර්යාංශයේ ඕනෑම කාර්යාලයකින්, භූ සම්පත් කැණීම, ප්‍රවාහනය සහ වෙළඳ බලපත්‍ර අයදුම්පත්‍රය ඉදිරිපත් කළ හැකි පරිදි ජාල ගත කිරීමට කාර්යාංශය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම, කාර්යාංශය විසින් ඒ සඳහා අවශ්‍ය බලතල ද පුහුණුව ද එම ආයතන වෙත ලබා දිය යුතුය.

<u>කැණීම් ස්ථාන පසුවිපරම</u>

සියලුම කැණීම් ස්ථාන සමීක්ෂණය, සහ පාරිසරික පසු-විපරම් කටයුතු නිසි පරිදි සිදුකිරීම තුළින් පරිසරයට සිදුවන හානි අවම කරමින් සංවර්ධන ව්‍යාපෘති සඳහා භූ සම්පත් තිරසර ලෙස යොදා ගත හැකි වේ.

සියලුම කැණීම් ස්ථාන අධීක්ෂණය හා පසුවිපරම

159. සියලුම කැණීම් ස්ථාන සම්බන්ධයෙන් පසු අධික්ෂණයක්, කාර්යාංශයේ මූලිකත්වයෙන් මධ්‍යම පරිසර අධිකාරිය, වයඹ පරිසර අධිකාරිය (අවස්ථානුකූලව) ඇතුළු කැණීම් බලපත්‍රය ලබා දීමේ දී තාක්ෂණික වශයෙන් නිර්දේශ ලබාගන්නා ලද ආයතනවලින් සමන්විත කමිටුවක් මගින් සිදුකර ගත යුතුය;
   (i) එම අධීක්ෂණ/සමීක්ෂණ, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ද යොමු කළ යුතු අතර එම දෙපාර්තමේන්තුව විසින් මේ අනුසාරයෙන් ද "P1P2P3 වර්ගීකරණ ලේඛනය" යාවත්කාලීන කළ යුතුය.
   (ii) කාර්යාංශය විසින්, අධීක්ෂණ වාර්තාව අනුව පිළිගත හැකි-ප්‍රශ්නගත බලපත්‍ර සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. එම ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු, අදාළ ආයතනවලට පිටපත් සහිතව බලපත්‍රකරුට දැන්විය යුතුය.

160. පරිසර නිර්දේශය, පරිසර බලපෑම් ඇගයීම හෝ මූලික පාරිසරික පරීක්ෂණයට භාජනය කරන ලද ව්‍යාපෘතිවල පසුවිපරම් කටයුතු මධ්‍යම පරිසර අධිකාරිය/ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන/අවස්ථානුකූලව වයඹ පළාත් පරිසර අධිකාරිය/වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව/වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුය.

161. කැණීම් හා පරිසර හානි සම්බන්ධයෙන් ඉඩම් හිමිකාරීත්වය/ කළමනාකාරීත්වය දරන ආයතන විසින් පසුවිපරම් කටයුතු සිදු කළ යුතුය. ඊට අදාළ නිසි දැනුවත් කිරීම් කාර්යාංශය හා අදාළ ආයතන වෙත යොමු කළ යුතුය.

162. කාර්යාංශය විසින් පසුවිපරම් ක්‍රියාවලිය නිසි පරිදි දැඩිව ක්‍රියාත්මක කළ යුතුයි. ඒ සඳහා කාර්යාංශය තුළ අවශ්‍ය වන කාර්ය මණ්ඩල හා භෞතික ධාරිතාවයන් වර්ධනය කඩිනමින් සිදු කළ යුතුය.

163. දීප ව්‍යාප්තව ඇති සියලුම කැණීම් ස්ථාන ක්ෂේත්‍ර පරික්ෂාවට ලක් කර බලපත්‍ර අනුකූලතාවය පරීක්ෂා කිරීම සඳහා ඩිජිටල් දත්ත පද්ධතියක් කාර්යාංශය විසින් නිර්මාණය කර ස්ථාපනය කළ යුතුය. එමගින් මහජන පීඩාකාරී, පරිසර අහිතකර සහ නීති විරෝධී කැණීම් ස්ථාන අත්හිටවිය යුතුය. දත්ත යාවත්කාලීන කිරීම සඳහා අදාළ වන තොරතුරු ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ද යොමු කළ යුතුය.

## ඇමුණුම්[2] පරිච්ඡේදය:

## වගු, උපලේඛන, ආකෘතිපත්‍ර සහ නියෝග

වගුව 01: ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන අනුව ලබා දිය යුතු අවම තොරතුරු

| අංකය | ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය | ලබා දිය යුතු තොරතුරු* |
|---|---|---|
| 01 | පරිසර අධිකාරිය | • පාරිසරික ආරක්ෂක ප්‍රදේශ සහ අනෙකුත් පාරිසරික වශයෙන් වැදගත් වන හඳුනාගත් ප්‍රදේශ.<br>• 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පාරිසරික ආරක්ෂක ප්‍රදේශ 10ක් ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කර ඇත. එම ගැසට් නිවේදන හා තොරතුරු මේ සමඟ අමුණා ඇත (උප-වගුව I). |
| 02 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | නාය අවදානම් කලාප |
| 03 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති ආරක්ෂිත ප්‍රදේශ සහ එම දෙපාර්තමේන්තුව කළමනාකරණය කරනු ලබන බිම් |
| 04 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වන ජීවී ආරක්ෂිත ප්‍රදේශ සහ අදාළ පනත් යටතේ ප්‍රකාශයට පත් කර ඇති එම දෙපාර්තමේන්තුව කළමනාකරණය කරනු ලබන ප්‍රදේශ |
| 05 | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති ආරක්ෂිත ප්‍රදේශ |
| 06 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව** | දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන |
| 07 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන රක්ෂිත |
| 08 | නාගරික සංවර්ධන අධිකාරිය | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත ප්‍රදේශ වල පිහිටි ගොඩනැගිලි විස්තරය |
| 09 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | වාරිමාර්ග රක්ෂිත |
| 10 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | සුළු වාරිමාර්ග රක්ෂිත |

* එම භූමියක කැණීම් ස්ථාන පිහිටියේ නම් ඒවා කැණීමට වෙනත් පාර්ශවයකට ලබා දීමේ එකඟතාවය (ඉඩම් පරිහරණ එකඟතාව) ද මීට ඇතුළත්ය.
** සියලු පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ තොරතුරු යාවත්කාලීන වී නොමැති බැවින් නව කැණීම් ස්ථානයන් සම්බන්ධයෙන් පමණක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලබා ගත යුතුය.

උප-වගුව I: ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ආරක්ෂක ප්‍රදේශ

| අංක | පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | දිස්ත්‍රික්කය | ගැසට් නිවේදනයේ අංකය | දිනය | වපසරිය (හෙක්.) |
|---|---|---|---|---|---|
| 01 | (අ). මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | ගම්පහ | 1358/16 | 2004.09.05 | 285.422 |
| | (ආ). එහි පළමු සංශෝධිත ගැසට් නිවේදනය | | 1466/26 | 2006.10.13 | 206.678 |
| | (ඇ). එහි දෙවන සංශෝධිත ගැසට් නිවේදනය | | 2090/11 | 2018.09.25 | 162.10 |

[2] සැ.යු: මෙම සංග්‍රහය නිකුත් කිරීමට සමගාමීව මෙම "ඇමුණුම: ගොනුව යාවත්කාලීන කර නිකුත් කළ යුතුය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | තලංගම පාරිසරික ආරක්ෂක ප්‍රදේශය<br>එහි පළමු සංශෝධිත ගැසට් නිවේදනය | කොළඹ | 1487/10 | 2007.03.05 | 118 |
| | | | 2237/07 | 2021.07.19 | 118 |
| 03 | ග්‍රෙගරි වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | නුවරඑළිය | 1484/10 | 2007.05.03 | 420 |
| 04 | නකල්ස් පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | මහනුවර හා මාතලේ | 1507/09 | 2007.07.23 | 3,167 |
| 05 | මරගල කන්ද පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | මොනරාගල | 1560/26 | 2008.08.01 | 2,500 |
| 06 | වලව්වේවත්ත වතුරාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | කළුතර | 1598/21 | 2009.04.24 | 6.2045 |
| 07 | බොල්ගොඩ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | කොළඹ හා කළුතර | 1634/23 | 2009.12.30 | 2,100 |
| 08 | හන්තාන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | මහනුවර | 1641/28 | 2010.02.17 | 3,856 |
| 09 | වරාතැන්න හක්කිඳ පාරිසරික ආරක්ෂක ප්‍රදේශය (මහවැලි ගඟේ කොටසක්) | මහනුවර | 2024/06 | 2017.06.19 | 59.4 |
| 10 | පන්සලාතැන්න මා උස්යාව පාරිසරික ආරක්ෂක ප්‍රදේශය | මාතලේ | 2075/15 | 2018.06.11 | 103.46 |

වගුව 02: රාජ්‍ය භාගය-වටිනාකම්වලින් ප්‍රතිශතයන්

| ඛනිජ කාණ්ඩය | ගෙවිය යුතු රාජ්‍යභාග ප්‍රතිශතය |
| --- | --- |
| අගනා ලෝහ වර්ග | 7% |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනය නොකරන) | 6% |
| කර්මාන්ත සඳහා උපයෝගී කරගනු ලබන ඛනිජ ද්‍රව්‍ය (අපනයනික) | 7% |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 4% |
| ගල් (අපනයන පාෂාණ) | 7% |
| පදනම් ලෝහ හා වෙනත් ලෝහ | 6% |

## උපලේඛනය - 01: ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන

1 පරිසර අමාත්‍යාංශය
2 පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය*
3 ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
4 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
5 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
6 දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල
7 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
8 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
9 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
10 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
11 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
12 වාරිමාර්ග දෙපාර්තමේන්තුව
13 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
14 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
15 වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
16 තක්සේරු දෙපාර්තමේන්තුව
17 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
18 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
19 රාජ්‍ය වැවිලි සංස්ථාව
20 පරිසර අධිකාරිය
21 මාර්ග සංවර්ධන අධිකාරිය
22 නාගරික සංවර්ධන අධිකාරිය
23 ජල සම්පත් මණ්ඩලය
24 ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
25 ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
26 ශ්‍රී ලංකා ධීවර වරාය සංස්ථාව
27 පුපුරණ ද්‍රව්‍ය පාලක

*සියලුම පළාත් වාරිමාර්ග අධිකාරි
*සියලුම පළාත් මහාමාර්ග අධිකාරි
*සියලුම පළාත් පාලන ආයතන

උපලේඛනය - 02: ඛනිජ වර්ග

| ගොඩනැගිලි ද්‍රව්‍ය | කාර්මික ඛනිජ | | පදනම් ලෝහ හා වෙනත් | වටිනා ලෝහ |
|---|---|---|---|---|
| පස් | ඉල්මනයිට් | හුණුගල් | යකඩ | රන් |
| වැලි | සර්කොන් | ලුණු | ක්‍රෝමියම් | රිදී |
| ගඩොල් මැටි | රූටයිල් | ජිප්සම් | තඹ | ප්ලැටිනම් |
| කළුගල් | මොනසයිට් | සමර | ඊයම් | |
| උළු මැටි | කොරල් | වීදුරු වැලි | සින්ක් | |
| බොරළු | ෂෙල් බෙඩ් | තිරුවානා | දුර්ලභ ගණයේ ඛනිජ | |
| කබොක් | මිනිරන් | ගා’නට් | | |
| හුණුගල් | බෝල මැටි | සිලිමනයිට් | | |
| ඩොලමයිට් | පිඟන් මැටි | කැල්සයිට් | | |
| මාබල් ගල් | කෙයොලින් | ඇලනයිට් | | |
| පොතුගල් | මයිකා | ප්ලෝර්ස්පා | | |
| | ෆෙල්ඩ්ස්පාර් | ඇපටයිට් | | |
| | පීට් | සර්පන්ටනයිට් | | |
| | මැග්නටයිට් | මැග්නසයිට් | | |
| | ඩොලමයිට් | වොලස්ටෝනයිට් | | |

## උපලේඛනය - 03: වැලි මධ්‍යස්ථාන සඳහා මාර්ගෝපදේශය

### (අඩු අදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවමින් පාරිභෝගිකයන් වෙත පහසු මිලට වැලි සැපයීම)

(i) පරිසර අමාත්‍යාංශය විසින් විශාල වශයෙන් වැලි සංචිත ඇති ස්ථාන ආශ්‍රිතව වැලි එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවිය යුතුය. මෙමගින් එම ප්‍රදේශයේ අඩු ආදායම්ලාභීන් සඳහා ස්වයං රැකියාවක් ලෙස වැලි ගොඩදැමීම සිදුකිරීමට හැකිවන අතරම පාරිභෝගිකයන්ට පහසු මිලට වැලි ලබාගැනීමට හැකියාව සැලසෙනු ඇත.

(ii) නියමු ව්‍යාපෘතිය, ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් මගින් වැලි කැණීම් කලාප 07 ක එනම්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පරෙයිපඤ්ඤං වැලි නිධිය, හා පොළොන්නරු දිස්ත්‍රික්කයේ වැලිකන්ද, බෝ අත්ත, අරලගංවිල, නිදන්වල හා පුත්තලම/කුරුණෑගල දිස්ත්‍රික්කවල රස්නායකපුර-නිකවැරටිය යන ස්ථානවල වැලි නිධි ආශ්‍රිතවත්, මඩකලපුව දිස්ත්‍රික්කයේ මුන්දෙනිආරු ප්‍රදේශයේ ද ආරම්භ කළ යුතුය. මේ සඳහා පහත මාර්ගෝපදේශය උපයෝගී කර ගත හැක.

1. මෙම වැලි කැණීම් කලාපවලින් ලබා ගත හැකි වැලි ප්‍රමාණය කාර්යාංශය විසින් සමීක්ෂණය කර තීරණය කළ යුතු අතර ඒ අනුව අඩු ආදායම්ලාභීන් කෙතරම් සංඛ්‍යාවකට වැලි කැණීම සඳහා අවසර ලබාදිය හැකි ද යන්න පිළිබඳව අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්/ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපාර කළමනාකරු දැනුවත් කළ යුතුය.
2. ඒ අනුව වැලි කැණීම් ක්‍රියාවලිය සඳහා ප්‍රදේශවාසී අඩු ආදායම්ලාභීන්/සමෘද්ධිලාභීන් තෝරාගෙන ලියාපදිංචි කිරීම ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකළ යුතුය. මහවැලි බල ප්‍රදේශයක නම් මේ සඳහා නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ද සහය ද ලබාගත යුතුය.
3. මෙසේ ලියාපදිංචි කරනු ලැබූ අඩු ආදායම්ලාභීන් සමූපකාර සමිති ලෙස සංවිධානය කිරීම ප්‍රාදේශීය ලේකම්ගේ/ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ වගකීම වේ.
4. මෙම සමූපකාර සමිති විසින් වැලි කැණීම් සිදු කිරීමේදී “හරිත වැලි තොටුපොළ” වැඩසටහන සඳහා සකස්කරන ලද මාර්ගෝපදේශ හා උපමානවලට අනුගතව සිදු කළ යුතුය (උපලේඛනය 5).
5. මෙහිදි බලපත්‍රලාභියා ලෙස ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් කටයුතු කළ යුතු අතර අදාළ සියලු ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන වලට සිදුකරන ලබන රාජ්‍ය භාගය, ඉඩම් පරිහරණ ගාස්තු ඇතුළු අනෙකුත් ගෙවීම් එම ආයතනය විසින් සිදුකළ යුතුය.
6. උක්ත ක්‍රියාවලිය සඳහා කළමනාකරණ සැලැස්ම කාර්යාංශය විසින් පිළියෙල කළ යුතුය.
7. කැණීම් කරන ලද වැලි, එම තොටුපලේ සිට වැලි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත රැගෙන එම හෝ මංකඩේ සිටම අවසාන පාරිභෝගිකයන් වෙත විකිණීම, ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් විසින් සිදු කළ යුතුය.
8. ප්‍රාදේශීය ලේකම්/නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් පිහිටු වන ලද “වැලි සමූපකාර සමිති” හරහා වැලි මිලදී ගැනිමේ දී එසේ මිලට ගනු ලබන වැලි සඳහා සාධාරණ මුදලක් තීරණය කළ යුතු අතර ඒ සඳහා සමූපකාර සමිති හා ජී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ යුතුය. මෙහිදී අවසාන පාරිභෝගිකයාට සාධාරණ මුදලකට වැලි ලැබෙන ලෙස මෙම වැලි මිලදී ගැනීමේ මුදල තීරණය කළ යුතුය.
9. වැලි එකතු කිරීමේ මධ්‍යස්ථානවල සිට වෙනත් ප්‍රදේශ කරා මහාමාර්ග ඔස්සේ හා දුම්රිය ඔස්සේ ප්‍රවාහනය සඳහා කටයුතු කිරීම ජී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් පුද්ගලික සමාගම හෝ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනය මඟින් ක්‍රියාත්මක කළ යුතුය. වැලි අලෙවි කිරීමේ මධ්‍යස්ථාන පවත්ගෙන යමින් අතරමැදියන්ගෙන් තොරව අවසන් පාරිභෝගිකයාට පහසු මිලට වැලි ලබාදීමට කටයුතු කිරීම ද එම ආයතනය මඟින් සිදු කළ යුතුය. වැලි මධ්‍යස්ථානවලින් වැලි නිකුත් කිරීමේදි ලබා දෙනු ලබන රිසිට් පත, දිවයිනේ ඕනෑම ස්ථානයකට ප්‍රවාහනය කළ හැකි බලපත්‍රයක් සේ සැලකිය යුතුය.
10. වැලි ප්‍රවාහනය අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් (GPS tracking system) සකස් කිරීම කාර්යාංශය හා එම ආයතනය එක්ව සිදුකළ යුතුය.

(iii) වැලි මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතීත්වයෙන් යුතුව පිහිටුවනු ලබන කමිටුවක් මඟින් සිදු කළ යුතුය. කාර්යාංශයේ නියෝජිතයෙක් කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කළ යුතුය. කමිටුවේ සෙසු සාමාජිකයින් වන්නේ තෝරාගනු ලබන කැණීම් කරන ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයේ නියෝජිතයෙක්, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිතයෙක්, අදාළ පළාත් පාලන ආයතනයේ කොමසාරිස්/ලේකම්, වැලි සමූපකාර සමිතියේ සභාපති, දිස්ත්‍රික් ලේකම්ගේ නියෝජිතයෙක්, ඉඩම් හිමි රාජ්‍ය ආයතනයේ නියෝජිතයෙක් සහ ප්‍රාදේශීය පරිසර නිලධාරි වේ.

## උපලේඛනය 04: ගාස්තු වර්ග, ප්‍රමාණ සහ ආරක්ෂිත තැන්පතු

1. කිසිදු ආයතනයක් විසින් දැනට අය නොකරනු ලබන කිසිදු ගාස්තුවක් මෙම සංශෝධනයෙන් පසු අය නොකළ යුතුය. මෙම සංශෝධනයෙන් පසු ගාස්තු වැඩි වීමක් නොවිය යුතුය. ගාස්තු පරාස ඇති විට, පෙර පැවති අවම ගාස්තු මට්ටම හෝ ඊට අඩු මට්ටමේ ගාස්තු පිහිටුවිය යුතුය. තවද, නව ගාස්තුව, පෙර ගාස්තුවට වඩා වැඩි වුවහොත් පෙර ගාස්තුව අය කළ යුතුය. සියලු ගාස්තු, ඒ ඒ පරාස වල දක්වා තිබුනද එම ගාස්තුව අය කළ යුත්තේ මෙම සංශෝධනයට පෙර එම ගාස්තු අය කළේ නම් පමණි.
2. මෙහි දක්වා නොමැති ගාස්තුවක් අය කළ යුතු කරුණක් යටතේ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතනයක් වෙතින් යම් සේවාලාභියෙකු මෙම විෂය පථය යටතේ යම් සේවාවක් අපේක්ෂා කරන විට, එම ආයතන විසින් එම කාර්යය සිදු නොකළ යුතු යැයි අදහස් නොකෙරේ. එවැනි අවස්ථාවක, දැනටමත් අනුමත වී ඇති ගාස්තුවක් අය කළ හැකි අතර, එය අය කළ වහාම, භාණ්ඩාගාර ලේකම්ට දැන්වීම අදාළ ව්‍යවස්ථාපිත රාජ්‍ය ආයතන ප්‍රධානීගේ වගකීමයි.

### I අදියර : ඒකීය ගාස්තු ක්‍රමවේදය: කැණීම් බලපත්‍රය නිකුත් කිරීමට පෙර ගාස්තු

බදු රහිත-වාර්ෂික, රු.

| ගාස්තුවේ නම | | | ශ්‍රේණිය | ගාස්තුව අදාළ කාරණය | ඒකකය | ඒකක වැය | වාණිජ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | ශිල්පීය[α] | | කාර්මික[α] | | | |
| | | | | | | | මසකට කියුබ් 35 නොවැඩි (AML/B) | මසකට කියුබ් 210 ට නොවැඩි (AML/A) | මසකට කියුබ් 500 ට නොවැඩි (IML/D) | මසකට කියුබ් 1000 ට නොවැඩි (IML/C) | මසකට කියුබ් 2000 ට නොවැඩි (IML/B) | මසකට කියුබ් 2000 ට වැඩි (IML/A) |
| මූලික ගාස්තු | 1 | රාජ්‍ය භාගය | 1.1 | රාජ්‍ය භාගය (කළුගල්) | කියුබ් | 1කට රු. | 60 | 60 | 60 | 60 | 60 | 60 |
| | | | 1.2 | රාජ්‍ය භාගය (වැලි) | කියුබ් | 1කට රු. | 320 | 320 | 320 | 320 | 320 | 320 |
| | | | 1.3 | රාජ්‍ය භාගය (පස්.බොරළු) | කියුබ් | 1කට රු. | 24 | 24 | 24 | 24 | 24 | 24 |
| | | | 1.4 | රාජ්‍ය භාගය (මැටි) | කියුබ් | 1කට රු. | 20 | 20 | 20 | 20 | 20 | 20 |
| | 2 | බලපත්‍ර | 2.1 | කැණීම් බලපත්‍ර | බලපත්‍ර | 1කට රු. | 2,000 | 5,000 | 5,000 | 15,000 | 30,000 | 50,000 |
| | | ක්ෂේත්‍ර | 2.2 | ක්ෂේත්‍ර පරීක්ෂණ | නිෂ්කාශන | 1කට රු. | 5,000 | 10,000 | 10,000 | 15,000 | 30,000 | 50,000 |

**භූමියේ පිහිටීම අනුව අවශ්‍ය විය හැකි අතිරේක නිෂ්කාශන ගාස්තු (අනිවාර්ය නොවේ. අවශ්‍යවන පරිදිය)**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3. අතිරේක නිෂ්කාශන ගාස්තු | 3.1 | තැන්පතු/ඇප/නැවත සංවර්ධන/සංරක්ෂණ | කියුබ් | 1කට රු. | 150 | 150 | 150 | 150 | 150 | 150 |
